වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2021

வருடாந்த செயலாற்றுகை அறிக்கை - 2021

ANNUAL PERFORMANCE REPORT - 2021







ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

கிராமிய மற்றும் பாடசாலை விளையாட்டு உட்கட்டமைப்பு வசதிகள் மேம்பாட்டு இராஜாங்க அமைச்சு

State Ministry of Rural and School Sports Infrastructure Improvement

වාර්ෂික කාර්යසාධන වාර්තාව

2021

2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

වැය ශීර්ෂ අංක 402

ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	1 - 27
ක්‍රීඩා වෛද්‍ය ආයතනය	29 - 49
ජාතික ක්‍රීඩා විද්‍යායතනය	51 - 70
ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය	71 - 109
සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය	110 - 138

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශකය

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව



ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

වාර්ෂික කාර්යසාධන වාර්තාව 2021

01.පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

හුදු මානව ක්‍රියාකාරකමකින් ඔබ්බට යමින් ජයග්‍රහණ ලබා ගැනීම සඳහාත් යහපත් ශාරීරික හා මානසික තත්ත්වයක් ගොඩනගා ගැනීම සඳහාත් මිනිසාට වැදගත් වන ක්‍රීඩාව මානව ශිෂ්ඨාචාරය තරමටම අතීතයට දිවයයි. එවන් වැදගත්කමක් ජනිත වන්නා වූ ක්‍රීඩා විෂය මෙරට පරිපාලන ක්ෂේත්‍රයේ සුවිශේෂී විෂය පථයක් ලෙස පිළිගනිමින් 1966 වසරේදී ප්‍රථම වරට අමාත්‍යාංශයක විෂය පථයක් ලෙස නම් කරන ලදී.

ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවේ ගම සහ නගරය ට ඇති අවස්ථාවන්හි අසමානතාම් පිළිබඳව බොහෝ මාතෘකාවන්ට ලක්වන පසුබිමක් තුළ 2020 වසරේ බලයට පත් වූ රජය විසින් 2020.08.09 දිනැතිව නිකුත් කරන ලද අංක 2187/27 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ග්‍රාමීය හා පාසල් ආශ්‍රිත ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධනය අරමුණු කොට ගෙන මෙම අමාත්‍යාංශය පිහිටුවන ලදී.

මෙරට ජාත්‍යන්තර ක්‍රීඩා ජයග්‍රහණ හිමි කර ගෙන ඇති බොහෝ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ඉතිහාසය පිළිබඳව විමසා බලන විට ඔවුන් නිර්මාණය වූ පසුබිම ග්‍රාමීය හෝ පාසල් කෙළි බිම බව පෙනී යයි. එබැවින් අනාගතයේ එසේ බිහිවන දක්ෂතා සපිරි ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට සිය ක්‍රීඩා හැකියාවන් ඔප් නංවා ගැනීමේ පහසුකම් වර්තමානයේ සපයා දීම ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ අපේක්ෂාවයි.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

"ජව සම්පන්න පරපුරක් බිහි කිරීම"

මෙහෙවර

"ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් නැංවීම, පරිපූර්ණ ක්‍රීඩා අධ්‍යාපනය හා ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව ප්‍රවර්ධනය තුළින් ජවසම්පන්න පරපුරක් බිහි කිරීමට දායක වීම"

අරමුණු

1. ළමා හා තරුණ ක්‍රීඩක / ක්‍රීඩිකාවන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනයට අවශ්‍ය ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම.
2. පාසල් සිසුන්ගේ හා තරුණ ප්‍රජාවගේ නායකත්ව ගුණාංග, පෞරුෂත්වය, විනය හා ජවසම්පන්න බව ප්‍රවර්ධනය කිරීම.
3. නීරෝගීමත්, සෞඛ්‍ය සම්පන්න පරපුරක් බිහි කිරීම තුළින් රටේ සංවර්ධනයට කාර්යක්ෂම ලෙස දායක කර ගැනීම.
4. ස්වයං විනයක් සහ ආධ්‍යාත්මික ගුණ වගාවක් සහිත පරපුරක් ප්‍රතිනිර්මාණය කිරීම.
5. ක්‍රීඩාව තුළින් ශ්‍රී ලංකාව, ලෝකයට ගෙනයන ක්‍රීඩාශීලී ජීවන රටාවකින් යුක්ත ළමා හා තරුණ පරපුරක් නිර්මාණය කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

- තරුණ හා ක්‍රීඩා කටයුතු අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත" ජව සම්පන්න පරපුරක් බිහිකිරීම" සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම.
- ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- අමාත්‍යාංශය යටතේ වූ ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

සුවිශේෂී ප්‍රමුඛතා හා හඳුනාගත් ක්‍රියාකාරකම්

ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කළ යුතු යැයි හඳුනාගෙන ඇති සුවිශේෂී ප්‍රමුඛතා හා ක්‍රියාකාරකම් ප්‍රධාන සංවර්ධන ඉලක්ක 02 ක් ඔස්සේ බෙදා දැක්විය හැකිය.

සංවර්ධන ඉලක්ක

01. ක්‍රීඩාශීලි ජවසම්පන්න පරපුරක් බිහි කිරීම.

<u>අරමුණු</u>

- ජාතික සංවර්ධනයට අවශ්‍ය සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහි කිරීම.
- ක්‍රීඩාව කෙරෙහි ජනතා ආකර්ෂණය ලබා ගැනීම.
- සමාජ විරෝධී ක්‍රියා අවම කිරීම.

සංවර්ධන උපායමාර්ග

(1) තාරුණ්‍යයේ ජවය සමාජ විරෝධී අංශ වෙත යොමුවීම වළක්වමින් පාසල් අධ්‍යාපනයේ සිට විෂය බාහිර ක්‍රියාකාරකමක් වශයෙන් ද, යෞවන සමාජ, ක්‍රීඩා සමාජ හරහා ද, ක්‍රීඩා කටයුතු තාරුණ්‍ය වෙත හඳුන්වා දීම සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීම

(2) අධ්‍යාපනයට අමතරව ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා සඳහා පාසල් දරුවන් ආකර්ශණය කිරීම මඟින් සෞඛ්‍ය සම්පන්න ළමා පරපුරක් සඳහා වැඩපිලිවෙලක් ක්‍රියාත්මක කිරීම.

(3) දිවයින පුරා විසිරී ඇති ග්‍රාමීය පාසල්වල ක්‍රීඩාවට දක්ෂතා දක්වන දරුවන් කුඩා කාලයේ සිටම හඳුනාගෙන ඔවුන්ගේ කුසලතාවයන් ජාත්‍යන්තර මට්ටම දක්වා ගෙන ඒමට අවශ්‍ය නිසි පෝෂණය සහ පුහුණුව ඇතුළු පහසුකම් සපයන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

(4) ක්‍රීඩා උපදේශකයන්, පුහුණුකරුවන් සහ භෞත චිකිත්සකයින් වැනි ක්‍රීඩාවේ දියුණුවට අවශ්‍ය සම්පත්දායකයින් බිහිකිරීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම.

02. ක්‍රීඩාවේ සංවර්ධනයට අවශ්‍ය වන භෞතික හා මානව සම්පත් සංවර්ධනය.

<u>අරමුණු</u>

- ජාත්‍යන්තර මට්ටමේ දැනුම සහිත ක්‍රීඩාවේ සම්පත්දායකයින් බිහි කිරීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන් සහිත ක්‍රීඩා භෞතික සම්පත් සංවර්ධනය.

සංවර්ධන උපායමාර්ග

(1) දිවයින පුරා පිහිටි ක්‍රීඩාගාර හා ක්‍රීඩා භූමි පිළිගත් ප්‍රමිතිකරණයට ලක් කොට ඒවා ඊට ගැළපෙන අයුරින් සංවර්ධනය කිරීම.
(2) දේශීය සාම්ප්‍රදායික ක්‍රීඩා ප්‍රවර්ධනය සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීම.
(3) ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රීඩා අධ්‍යාපනය පුළුල් කිරීම.

1.4 සංවිධාන සටහන


ලේකම්
අතිරේක ලේකම් (සංවර්ධන)
අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රමසම්පාදන)
අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු)
ප්‍රධාන අභ්‍යන්තර විගණක
ප්‍රධාන ගණකාධිකාරි
ප්‍රධාන ඉංජිනේරු
අධ්‍යක්ෂ
අධ්‍යක්ෂ
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ
ගණකාධිකාරි
ඉංජිනේරු
සං.නි
සං.නි
සං.නි

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු / දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ /දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල

අදාළ නොවේ

1.6 අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/පළාත් සභාව යටතේ පවතින ආයතන

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන පහත පරිදි දැක්විය හැක.

- ක්‍රීඩා වෛද්‍ය ආයතනය
- ජාතික ක්‍රීඩා විද්‍යායතනය
- ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය
- සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබෙනම්)

අදාළ නොවේ

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ

2020.08.09 වන දින ස්ථාපිත කරන ලද මෙම අමාත්‍යාංශයේ වැඩ කටයුතු නිල වශයෙන් එදින ආරම්භ වුවද එම වර්ෂයේ සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රතිපාදන වෙන් නොවූ හේතුවෙන් අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව විවිධ සංවර්ධන වැඩසටහන් රැසක් ආරම්භ කරන ලද්දේ 2021 වර්ෂයේදීය. එබැවින් 2021වර්ෂය මෙම අමාත්‍යාංශයට සුවිශේෂී වර්ෂයකි.

2021 අයවැය කථාවෙන් ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙ මෙම අමාත්‍යාශය වෙත වෙන් වූ රු.මි.3000 ක ප්‍රතිපාදන යොදවා පහත වැඩසටහන් අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලදී.

2021 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩටහන්

1. ක්‍රීඩා පාසල් සංවර්ධනය කිරීමේ වැඩසටහන
2. ග්‍රාමීය ක්‍රීඩාපිටි ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන
3. පාසල්හි ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන
4. මහජන ක්‍රීඩාපිටි ප්‍රමිතිගතව සංවර්ධනය කිරීමේ වැඩසටහන
5. ‘‘ගම සමඟ පිළිසඳරක් ‘‘ වැඩසටහන හා අමාත්‍යාංශය මඟින් අති දුෂ්කර ගම්මාන වල හඳුනාගත් ක්‍රීඩා පහසුකම් සංවර්ධනය හා වෙනත්
6. සම්ප්‍රදායික ක්‍රීඩා වන් සංවර්ධනය කිරීමේ වැඩසටහන
7. ක්‍රීඩා භාණ්ඩ /උපකරණ හා වෙනත් ක්‍රීඩා පහසුකම් ලබා දීමේ වැඩසටහන
8. ක්‍රීඩා ප්‍රචාරණ වැඩසටහන
9. ඩිජිටල් දත්ත පද්ධතියක් ස්ථාපිත කිරිම
10. ජාතික ක්‍රීඩා විද්‍යායතනය ක්‍රීඩා විශ්වවිද්‍යාලයක් බවට පත් කිරිම
11. ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමේ ක්‍රීඩා තරඟාවලි සංවිධානය කිරීම

1. ක්‍රීඩා පාසල් සංවර්ධනය කිරීමේ වැඩසටහන

ජාත්‍යන්තර ජයග්‍රහණ වෙනුවෙන් යන ක්‍රීඩකයකු බිහිකිරීම සඳහා ළමා වියේ සිටම දක්ෂතා සහිත දරුවන් හඳුනාගෙන ඔවුන් නිසි පෝෂණය හා පුහුණුව සහිතව රැකබලා ගත යුතුය. මේ අරමුණ පෙරදැරිව 1989 වර්ෂයේ ප්‍රථම වරට මෙරට ක්‍රීඩා පාසල් ලෙස හඳුනාගත් විශේෂිත පාසල් 25ක් නම් කරන ලදී. මෙම පාසල්වල 8 වන වසර සඳහා වෙනම පන්තියක් ස්ථාපිත කරන ලද අතර අවට පාසල් වල ක්‍රීඩාවට දක්ෂතා දක්වන දරුවන් ඒකී පන්තියට බඳවා ගෙන අධ්‍යාපනයට සමගාමීව ක්‍රීඩා කටයුතු ප්‍රගුණ කරවීම මෙහි මූලික අභිමතාර්ථය විය.

මෑත කාලයේ මෙරට ක්‍රීඩා ක්ෂේත්‍රයේ පැවැති පසුබෑමට විසඳුමක් ලෙස ක්‍රීඩා පාසල් තුළින් බිහිවන දක්ෂතා සහිත සිසුන් සංඛ්‍යාව වැඩි කිරීම කෙරෙහි වත්මන් රජයේ අවධානය යොමු වූ අතර ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් තවත් පාසල් 05 ක් ක්‍රීඩා පාසල් ලෙස නම් කරමින් මෙරට ක්‍රීඩා පාසල් සංඛ්‍යාව 30 දක්වා වැඩි කරන ලදී. මෙසේ නම් කරන ලද ක්‍රීඩා පාසල් අතුරින් 2021 වසර තුළ වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් සංවර්ධනය කළ යුතු පාසල් 16ක් ප්‍රමුඛතා පදනම මත අධ්‍යාපන අමාත්‍යාංශයේද සහයෝගය ඇතිව තෝරා ගන්නා ලදී.

එසේ තෝරා ගන්නා ලද ක්‍රීඩා පාසල් සඳහා අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේ දී රු.මි 213.1 ක් ප්‍රතිපාදන වෙන් කළ අතර එම පාසල්වල නේවාසිකාගාරවල අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු මෙන්ම ක්‍රීඩා පිටිවල සංවර්ධන කටයුතු මෙන්ම වෙනත් අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු මෙම වැඩසටහන යටතේ සිදුකරන ලදී.

2021 වර්ෂයේ සංවර්ධනය කටයුතු සිදු කරන ලද ක්‍රීඩා පාසල් ලේඛනය

පාසලේ නම
01. අකුරම්බොඩ මධ්‍ය මහා විද්‍යාලය, මාතලේ
02. වැලිමඩ මධ්‍ය මහා විද්‍යාලය, බදුල්ල
03. වලල ඒ රත්නායක මධ්‍ය මහා විද්‍යාලය, මහනුවර
04. පොරමඩුල්ල මධ්‍ය මහා විද්‍යාලය, නුවර එළිය
05. හලාවත ආනමඩුව මධ්‍ය මහා විද්‍යාලය, පුත්තලම
06. හංවැල්ල රාජසිංහ මධ්‍ය විද්‍යාලය, කොළඹ
07. හේනේගම මධ්‍ය විද්‍යාලය, ගම්පහ
08. අනුරාධපුර මධ්‍ය විද්‍යාලය, අනුරාධපුරය
09. රාජකීය මධ්‍ය මහා විද්‍යාලය, පොලොන්නරුව
10. ඩී. එස්. සේනානායක මධ්‍ය මහා විද්‍යාලය, අම්පාර
11. ශාන්ත ජෝෂප් විද්‍යාලය, ත්‍රිකුණාමලය
12. රත්මලාන හින්දු විද්‍යාලය, කොළඹ
13. සංඝමිත්තා බාලිකා විද්‍යාලය,ගාල්ල
14. දික්වැල්ල විජිත විද්‍යාලය, මාතර
15. මුරුන්කන් මහා විද්‍යාලය, මන්නාරම
16. යාපනය මධ්‍ය මහා විද්‍යාලය, යාපනය

2. ග්‍රාමීය ක්‍රීඩාපිටි ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන

සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම එක් ක්‍රීඩාංගනයක් බැගින් සංවර්ධනය කිරීමේ අරමුණින් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය මත තෝරා ගන්නා ලද ග්‍රාමීය ක්‍රීඩාපිටියක, අවශ්‍යතාවය පරිදි වොලිබෝල්, නෙට්බෝල් වැනි ක්‍රීඩාවක් සඳහා සුදුසු ලෙස සකස් කිරීම, දැල් ආවරණ යෙදීම, විදුලි ආලෝකය සැපයීම වැනි ක්‍රියාකාරකම් මෙහිදී සිදු කරන ලදී. මේ සඳහා වෙන් කරන ලද රු.මී. 500.0 ක ප්‍රතිපාදනය දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත නිදහස් කිරීම තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් ද ව්‍යාපෘති තෝරාගැනීම, අනුමත කිරීම, ප්‍රගතිය අධීක්ෂණය හා පසුවිපරම මෙම අමාත්‍යාංශය මඟින් ද සිදු කරන ලදී.

දිවයින පුරා ග්‍රාමීය ක්‍රීඩාංගන 334 ක් සංවර්ධනය කිරීම 2021 මාර්තු මස ආරම්භ කරන ලද අතර වර්ෂ අවසානයේදී ක්‍රීඩාංගන 329 ක වැඩ කටයුතු සම්පූර්ණයෙන් අවසන් කරන ලදී.

3. පාසල්හි ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන

දිවයිනේ සෑම අධ්‍යාපන කලාපයකටම එක් පාසල් ක්‍රීඩාංගනයක් බැගින් සංවර්ධනය කිරීමේ අරමුණින් ක්‍රීඩාවට සුදුසු පරිදි ක්‍රීඩාංගනය සකස් කිරීම, වැසිකිළි, කැසිකිළි ඇතුළු සනීපාරක්ෂක පහසුකම් හා ඇඳුම් මාරු

කිරීමේ කාමර (Changing Rooms) සහිතව ක්‍රීඩා කාමර (Sports Rooms) ඉදිකිරීම හෝ පවතින පහසුකම් වැඩි දියුණු කිරීම, ක්‍රීඩාංගනයේ තණපිඩලි ඇල්ලීම වැනි ක්‍රියාකාරකම් අවශ්‍යතාවය පරිදි සිදු කරන ලදී. මේ යටතේ පළාත් සභා පාසල් පළාත් ප්‍රධාන ලේකම්වරුන් යටතේද, ජාතික පාසල් දිස්ත්‍රික් ලේකම්වරුන් යටතේද සංවර්ධනය කරන ලදී.
මේ සඳහා 2021 වසර තුළ රු.මි. 304.68 ක ප්‍රතිපාදන නිදහස් කිරීමට කටයුතු කළ අතර ඉන් රු.මි. 252.8ක් පළාත් සභා පාසල් සඳහාද, රු.මි. 51.88 ක් ජාතික පාසල් සඳහාද වෙන් කරන ලදී. සංවර්ධනය කිරීමට තෝරා ගන්නා ලද පාසල් 95 හා වර්ෂ අවසානයේ දී පාසල් ක්‍රීඩාපිටි 63 ක වැඩ කටයුතු සම්පූර්ණයෙන් අවසන් කරන ලදී.

4. මහජන ක්‍රීඩාපිටි ප්‍රමිතිගතව සංවර්ධනය කිරීමේ වැඩසටහන

ක්‍රීඩාව සඳහා මහජනතාවට පහසු ප්‍රවේශයක් ඇති කරලීමේ අරමුණින් මහජන ක්‍රීඩාපිටි ප්‍රමිතිගතව සංවර්ධනය කිරීමේ වැඩසටහන ආරම්භ කරන ලදී. ක්‍රීඩා කිරීම සඳහා සුදුසු පරිදි ක්‍රීඩාංගන සංවර්ධනය කිරීම, පොදු සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කිරීම, තෘණ ඇතිරීම හෝ වගාකිරීම, ජල ඉසින පද්ධති සවිකිරීම, ක්‍රීඩා ඉසව් ගණනාවකට භාවිතයට ගත හැකි පරිදි ක්‍රීඩාපිටි සැකසීම, ක්‍රීඩාපිටි සම්බන්ධ අනෙකුත් පහසුකම් (සනීපාරක්ෂක, සෝදාපාළුව වැලැක්වීමට අවශ්‍ය ඉදිකිරීම්, ඇඳුම් මාරු කිරීමේ කාමර) සැපයීම වැනි ක්‍රියාකාරකම් මේ යටතේ සිදු කරන ලදී. පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත රු.මි. 762.3 ක ප්‍රතිපාදන නිදහස් කළ අතර අදාළ පළාත් පාලන ආයතනවල සහයෝගය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

දිවයින පුරා ක්‍රීඩාංගන 155ක් මේ යටතේ ප්‍රමිතිගතව සංවර්ධනය කිරීම අරම්භ කළ අතර 2021 වර්ෂය අවසානයේ ක්‍රීඩාපිටි 41 ක වැඩ අවසන් කර ඇත.

5. "ගම සමඟ පිළිසඳරක් " වැඩසටහන හා අමාත්‍යාංශය මඟින් අති දුෂ්කර ගම්මාන වල හඳුනාගත් ක්‍රීඩා පහසුකම් සංවර්ධනය හා වෙනත්

අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් මත ක්‍රියාත්මක වන "ගම සමඟ පිළිසඳර" වැඩසටහන යටතේ ආර්ථික හා සමාජීය වශයෙන් දැඩි දුෂ්කරතා සහිත රාජ්‍ය යාන්ත්‍රණයේ සමීප අධීක්ෂණයෙන් බොහෝ දුරස්ව පිහිටියා වූ ප්‍රදේශවල ජනතාවගෙන් ඉදිරිපත් වන ඉල්ලීම් සලකා බලා ක්‍රීඩා යටිතල පහසුකම් ආශ්‍රිත යෝජනා ක්‍රියාත්මක කිරීම අමාත්‍යාංශය මගින් සිදු කරන ලදී. ඉදිරිපත් වූ යෝජනා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ශ්‍රම දායකත්වයෙන් හා දිස්ත්‍රික් ලේකම්වරුන් මඟින් සිදු කරනු ලැබීය. මේ යටතේ අමාත්‍යාංශය වෙත යොමු කරන ලද ව්‍යාපෘති යෝජනා 85 ක් සඳහා රු.මි. 147.38 ක ප්‍රතිපාදන නිදහස් කරමින් දුෂ්කර ප්‍රදේශවල ඇති පාසල් ආශ්‍රිත ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය සිදු කරන ලදී. 2021 වර්ෂය අවසානයේ ක්‍රීඩාපිටි 74 ක වැඩ සම්පූර්ණයෙන් අවසන් කර ජනතා අයිතියට පත්කර ඇත.

6. සම්ප්‍රදායික ක්‍රීඩාවන් සංවර්ධනය කිරීමේ වැඩසටහන

සාම්ප්‍රදායික ක්‍රීඩා ප්‍රවර්ධනය විෂයයක් ලෙස මෙම අමාත්‍යාංශයට පැවරී ඇති බැවින් අංගම් සටන් ශිල්පය ඇතුලු අනෙකුත් දේශීය සාම්ප්‍රදායික ක්‍රීඩා සංරක්ෂණය කොට රැක ගැනීමේ අරමුණින් 2021 වර්ෂයේදී අංගම් කලා ශිල්පය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් 02 ක් පැවැත්වූ අතර ඉංග්‍රීසි යටත් විජිත පාලකයින් විසින් පනවනු ලැබූ අංගම් සටන් ශිල්පී කලාව කෙරෙහි වූ තහනම ඉවත් කිරීමට අවශ්‍ය මූලික කටයුතු 2021 වර්ෂයේ දී ආරම්භ කරන ලදී.

7. ක්‍රීඩා භාණ්ඩ /උපකරණ හා වෙනත් ක්‍රීඩා පහසුකම් ලබා දීමේ වැඩසටහන

මෙරට ක්‍රියාත්මක ක්‍රීඩා සමාජ මෙන්ම ක්‍රීඩා කටයුතුවල යෙදෙන යෞවන සමාජ සාමාජිකයන්ට සහ පාසල් සඳහා අවශ්‍ය වන ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ සැපයීම සඳහා වන වැඩසටහනක් සැලසුම් කරන ලද අතර 2021

රේෂයේදී පොළොන්නරුව, හම්බන්තොට, අම්පාර හා මොනරාගල දිස්ත්‍රික්ක වල ක්‍රීඩා පාසල් හා ක්‍රීඩා සමාජ කිහිපයක් වෙත ක්‍රීඩා භාණ්ඩ බෙදා හැරීම අමාත්‍යාංශය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා සිදුකරන ලදී. මේ සඳහා **රු**. මි. 2.32 ක මුදලක් ආයෝජනය කරන **ලදී.**

8. ක්‍රීඩා ප්‍රචාරණ වැඩසටහන

- **"be active" ක්‍රීඩා අධ්‍යාපනික සඟරාව**

ක්‍රීඩා ක්ෂේත්‍රයට සම්බන්ධ සියලු පාර්ශ්වයන්ගේ ක්‍රීඩා අධ්‍යාපනයට මඟ පෙන්වීමක් වශයෙන් නිරන්තර පරිශීලනයට වැදගත් වන සඟරාවක් නිර්මාණ කර පිටපත් 2500 පමණ මුද්‍රණය කර දිවයින පුරා ඇති ක්‍රීඩා පාසල්, ක්‍රීඩා ගුරුවරුන්, ක්‍රීඩා උපදේශකයන්, නිළධාරීන් හා ක්‍රීඩා ක්ෂේත්‍රයේ වෙනත් පාඨකයන් වෙත බෙදා හැරීමට කටයුතු කරන ලදී. මේ සඳහා රු.මි 1.5 ක මුදලක් ආයෝජනය කරන ලදී. මේ සඳහා ක්‍රීඩා ක්ෂේත්‍රයේ සුවිශේෂී විද්වතුන්ගෙන් සමන්විත සංස්කාරක මණ්ඩලයක දැනුම යොදා ගන්නා ලදී.

- **ක්‍රීඩා ප්‍රචාරණ වීදි නාට්‍ය සංදර්ශන පැවැත්වීම**

  ක්‍රීඩාව පිළිබඳව මහජන ආකර්ෂණය ඇතිකරවා ගැනීමේ අරමුණින් ජාතික තරුණ සේවා සභාවේ වීදි නාට්‍ය කණ්ඩායම් යොදවා පවත්වන ලද වීදි නාට්‍ය සංදර්ශන මාලාව සඳහා රු.මි. 0. 7 ක් ආයෝජනය කරන ලදී.

- **කාන්තා දින වැඩසටහන**
  කාන්තාවන්ගේ ශාරීරික යෝග්‍යතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ජාත්‍යන්තර කාන්තා දිනය තේමා කරගෙන ශාරීරික සුවතා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි. 0.45 ක මුදලක් ආයෝජනය කරන ලදී.

- **ඌව පළාත් ක්‍රීඩා දැනුම මිනුම තරඟාවලිය**

  ඌව පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 25ක ක්‍රීඩා සමාජ සාමාජිකයන් අතර ක්‍රීඩාව පිළිබඳ දැනුම ව්‍යාප්ත කිරීමේ අරමුණින් පවත්වන ලද ක්‍රීඩා දැනුම මිනුම තරඟාවලිය සඳහා රු.මි. 0.5 ක මුදලක් ආයෝජනය කරන ලදී.

- **කොවිඩ් එන්නත්කරණය**

  ක්‍රීඩාවේ නියැලී සිටින පිරිස එන්නත්කරණය සඳහා යොමු කරවීම සෙසු තරුණ පිරිසට ද ආදර්ශයක් සපයනු ඇත. මේ සඳහා විශේෂයෙන් ක්‍රීඩක ක්‍රීඩිකාවන් පෙළඹවීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරවීම කාලීන අවශ්‍යතාවක් ලෙස හඳුනාගත් අතර මෙකී පෙළඹවීම ඇති කිරීම සඳහා ජනමාධ්‍යයන් භාවිතා කරමින් ආකර්ශනීය දැන්වීම් සකස් කර ප්‍රචාරය කරවීම ක්ෂණික හා ඵලදායී ප්‍රතිචාර බලාපොරොත්තු විය හැකි ක්‍රමවේදයක් බැවින් ඒ සඳහා සුදුසු ආකාරයේ ආකර්ශණීය වීඩියෝ දර්ශන වලින් සමන්විත දැන්වීම් නිර්මාණය කිරීමට රු.මි.6.9 ක මුදලක් වැය කළ අතර ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රචාරණය කරවීම් කටයුතු සිදු කරන ලදී.

9. ඩිජිටල් දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම

විධිමත් දත්ත හා තොරතුරු මත පදනම් වී සංවර්ධන සැලසුම්කරණයේ යෙදීම අරමුණු කොට ගෙන භූගෝලීය අවකාශමය දත්ත පද්ධතියක් සකස් කිරීම 2021 වර්ෂයේදී අමාත්‍යාංශය මගින් ආරම්භ කරන ලදී. එමගින් දිවයිනම ආවරණය වන පරිදි භෞතික ක්‍රීඩා යටිතල පහසුකම්, මානව සම්පත් හා වෙනත් ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාල සියලු දත්ත හා තොරතුරු එක් රැස් කර භූගෝලීය තොරතුරු පද්ධතියක් (GIS) සකස් කිරීමටත්, දිවයින පුරා සිටින ක්‍රීඩා ක්ෂේත්‍ර නිලධාරීන් හට පුහුණුවක් ලබාදී එම තොරතුරු යාවත්කාලීන කිරීමටත් බලාපොරොත්තු වේ.

10. ජාතික ක්‍රීඩා විද්‍යායතනය ක්‍රීඩා විශ්වවිද්‍යාලයක් බවට පත් කිරීම

මෙරට ක්‍රීඩා අධ්‍යාපන ක්ෂේත්‍රයේ මූලික ගැටලුවක් වන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියුතු වෘත්තිකයන්ට වෘත්තිමය උසස් අධ්‍යාපනයක් ලබා දෙන ආයතනයක් නොමැති වීම හඳුනාගන්නා ලද අතර පවත්නා විශ්වවිද්‍යාල හා වෙනත් උසස් අධ්‍යාපන ආයතනයන් හි බඳවා ගැනීම් අධ්‍යාපන සුදුසුකම් මත පමණක් පදනම් වීම නිසා දස්කම් සහිත ක්‍රීඩකයන්ට එම අවස්ථා නොලැබී යාම නිරීක්ෂණ විය.
මෙම තත්ත්වයට විසඳුමක් ලෙස ක්‍රීඩා හැකියාව මත පදනම් වී බඳවා ගැනීම් සිදු කරන, විධිමත් වෘත්තීය හා වෙනත් උසස් අධ්‍යාපනයකට මඟ පෙන්වන ජාතික ක්‍රීඩා විශ්වවිද්‍යාලයක් ස්ථාපිත කිරීම සඳහා ක්‍රීඩා අධ්‍යාපන ක්ෂේත්‍රයේ විද්වතුන් හා විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගෙන් සමන්විත කමිටුවක් හරහා සුදුසු ආකෘතියක් නිර්මාණය කිරීමේ මූලික කටයුතු 2021 වර්ෂයේදී ආරම්භ විය.

11. ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමේ ක්‍රීඩා තරඟාවලි සංවිධානය කිරීම

ග්‍රාමීය ප්‍රදේශවල වෙසෙන තරුණ තරුණියන් හට ක්‍රීඩා තරඟ සඳහා සහභාගී වීමේ අවස්ථාවන් පුළුල් කිරීමට ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමේ ක්‍රීඩා තරඟාවලි, මැරතන් හා සයිකල් ධාවන තරඟ දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වීමට සැලසුම් කර තිබුණද, රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය මත පැවැත්වීමට හැකි වූයේ තරඟාවලි 02ක් පමණි. එම තරඟාවලි හම්බන්තොට දිස්ත්‍රික්කයේදී පැවැත්වුණ අතර ඒ සඳහා රු.මි.0.34 ක් ආයෝජනය කරන ලදී.

2.2 අභියෝග

- අමාත්‍යාංශය වෙත ප්‍රතිපාදන ලැබීම 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ මුල් මාසය දක්වා ප්‍රමාද වීම.

- 2020 වර්ෂයේදී ආරම්භ වී මේ වන විටත් ලොවට මහත් අභියෝගයක් වූ කොවිඩ් 19 වසංගත තත්වය පසුගිය වසර තුළ මෙම අමාත්‍යාංශයේ කටයුතු සඳහා ද බලපෑ ප්‍රධාන ආභියෝගයක් විය. එකී අභියෝගය නිසා සැලසුම් කරන ලද ප්‍රජාව එක් රැස් කරන ආකාරයේ වැඩසටහන් පැවැත්වීම අභියෝගයක් වූවද ඒ සඳහා විකල්ප ලෙස තාක්ෂණික ක්‍රම යොදාගෙන රැස්වීම සංවිධානය කිරීම, විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යන් යොදා ගෙන ප්‍රචාරණ කටයුතු සිදු කිරීම තුළින් ධනාත්මක ලෙස මෙම අභියෝග ජය ජයගැනීමට අමාත්‍යාංශයට හැකි විය.

- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අමුද්‍රව්‍ය මිල සීඝ්‍රයෙන් ඉහළ යාම මත නිරන්තරයෙන් ඇස්තමේන්තු සංශෝධනය සිදු වීමත් ඒ හරහා ඉදිකිරීම් කටයුතු වල යම් ප්‍රමාදයක් ඇති වීමත් හඳුනා ගත් වෙනත් අභියෝගයක් වූ අතර සමහර අමුද්‍රව්‍ය වෙළඳපලේ හිඟ වීමද මේ ප්‍රධාන බාධාවක් ලෙස හඳුනා ගන්නා ලදී.

- ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම සිදුකිරීමේදී බොහොමයක් උපකරණ ආනයනය කළ යුතු වූ අතර, ඩොලරයේ අගය ඉහළ යාම නිසා එම භාණ්ඩ වල මිල ඉහළ යාමත්, ආනයන අත්‍යවශ්‍ය භාණ්ඩ වලට සීමා කිරීමත්, ණයවර ලිපි විවෘත කිරීමේ ගැටළු සහ දේශීය වෙළඳපොළ තුළ අමුද්‍රව්‍ය හිඟ වීම දේශීය ක්‍රීඩා භාණ්ඩ නිෂ්පාදන මිලදී ගැනීමට ගැටළු මතු වීම.

- වසර මැද කාලයේ රට පුරා ක්‍රියාත්මක වූ සංචරණ සීමා නිසාද ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ශ්‍රම හිඟය ඉදිකිරීම් කටයුතුවලදී යම් පමාවක් සඳහා බලපාන ලදී.

- රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීමේ අරමුණින් අමාත්‍යාංශය වෙත පවරා තිබූ ප්‍රතිපාදන වලින් ඉදිරි වසර සඳහා කල් දැමිය හැකි වැඩසටහන් සඳහා වෙන්කල ප්‍රතිපාදන ප්‍රමාණයක් නැවත මහාභාණ්ඩාගාරයට හරවා යැවීමට සිදු වීම නිසාද හඳුනාගත් ව්‍යාපෘති නිම කිරීමට නොහැකි විය.

- භෞතික සංවර්ධනය මෙන්ම ආකල්පමය සංවර්ධනය ද මෙම විෂය පථයේදී එක හා සමානව සිදුවිය යුතු නමුත් ක්‍රීඩාව කෙරෙහි ජනතාව තුළ පවතින ආකල්ප වෙනස් කිරීමට විශාල උත්සාහයක් දැරීමට සිදු වීම.

2.3 අනාගත අරමුණු

- ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය හරහා කාර්යබහුල ජීවිතයට හුරු වූ ජනතාවගේ මානසික නිදහස උදෙසා ක්‍රීඩාව අස්වැසිල්ලක් කරවීම හා නිරෝගී ජවසම්පන්න පරපුරක් නිර්මාණය කිරීම.

- ක්‍රීඩා පාසල්වල යටිතල පහසුකම් සංවර්ධනය තුළින් සිසු සිසුවියන්ගේ ක්‍රීඩා කෞශල්‍ය දියුණු කිරීම හරහා ඔවුන් ජාත්‍යන්තර තලය වෙත ගෙන ඒම.

- ග්‍රාමීය හා දුෂ්කර පාසල් ආශ්‍රිත ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය තුළින් දක්ෂතා ඇති දරුවන්ට අවස්ථාව ලබාදීම හා පාසල් අධ්‍යාපනය හැර යන සිසුන් නොමහට යොමුවීම අවම කිරීම.

- දක්ෂතා සහිත දරුවන්ගේ ක්‍රීඩා අවශ්‍යතා හඳුනාගෙන ඔවුන් සඳහා පහසුකම් සැපයීම තුළින් ඔවුන්ගේ ක්‍රීඩා දිවිය සාර්ථක කරගනිමින් ජාත්‍යන්තර ක්‍රීඩා ලොව ජය ගැනීමට අවශ්‍ය පසුබිම සකසා දීම.

- ටොරින්ටන්, රීඩ් ඇවනිව්, මහියංගන මහජන ක්‍රීඩාංගනය හා මාතලේ හොකී ක්‍රීඩාංගනය ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

- ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන් ගේ ඉදිරි උසස් අධ්‍යාපනයට විශාල අඩුවක් ව පවතින ක්‍රීඩා විශ්ව විද්‍යාලයක් ස්ථාපිත කර සාමාන්‍ය ක්‍රමවේදයෙන් බැහැරව ක්‍රීඩා දක්ෂතා වලින් හෙබි දරුවන්ට විශ්ව විද්‍යාලයට ඇතුළත්ව උසස් අධ්‍යාපනය හදාරා වෘත්තීය සුදුසුකම් සපුරා ගැනීමට ඉඩ ප්‍රස්ථාව සකස් කිරීම.

- ක්‍රීඩාවේ විවිධ අංශ කෙරෙහි පුළුල් අධ්‍යයනයක් සිදුකර ඒ පිළිබඳව පර්යේෂණ කෘති ප්‍රකාශන එළි දැක්වීම හා පර්යේෂණ පරිසංවාද පැවැත්වීම තුළින් ක්‍රීඩා දැනුම පුළුල් කිරීම.

- ක්‍රීඩාව සමාජය තුළ සුභවාදී ආකල්පමය වෙනසක් ඇති කරවීමට සමත්වන බැවින් ඒ සඳහා මහජනතාව ආකර්ෂණය කරවා ගැනීමට පුළුල් ප්‍රචාරණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම.

- පාරම්පරිකව පැවත එන සාම්ප්‍රදායික ක්‍රීඩා හඳුනාගෙන, එම ක්‍රීඩා යළි සමාජගත කිරීම හරහා සංචාරක ආකර්ෂණය ලබාගැනීම තුළින් ක්‍රීඩා ආර්ථිකයක් ගොඩනැඟීම.

.....

ආයතන ප්‍රධානී
නම :
තනතුර :
දිනය : 2022.02.25

රවීන්ද්‍ර සමරවික්‍රම
ලේකම්
ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන
රාජ්‍ය අමාත්‍යාංශය
12 වන මහල, බටහිර කුලුන,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.

03 පරිච්ඡේදය - 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021 රු.		සටහන	තත්‍ය 2021 රු.	නැවත ගලපන ලද 2020 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	**1**	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	ාණ්ඩාගාර අග්‍රිම		396,807,000	102,628,000	ඒසීඒ-3
-	තැන්පතු		1,831,408	12,592,898	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		6,918,492	46,428,823	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**405,556,901**	**161,649,721**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**405,556,901**	**161,649,721**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	129,431	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**405,556,901**	**161,520,290**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
137,279,000.00	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලා	**5**	121,427,125	63,488,334	

186,725,000.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	133,007,458	47,908,766	ඒසීඒ-2(ii)
501,014,000.00	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	277,944,380	289,531,000	
-	පොළී ගෙවීම්	8	-	-	
237,000.00	වෙනත් පුනරාවර්තන වියදම්	9	235,073	-	
825,255,000.00	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**532,614,036**	**400,928,099**	
	මූලධන වියදම්				
498,150,000.00	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	322,272,466	1,698,779	
912,764,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	83,200,799	177,030,360	
944,000,000.00	ප්‍රාග්ධන මාරුකිරීම්	12	37,766,000	282,300,000	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
86,636,000.00	හැකියා වර්ධනය	14	29,339,678	19,886,033	
103,000,000.00	වෙනත් මූලධන වියදම්	15	11,171,426	73,884,097	
2,544,550,000.00	**මුළු මූලධන වියදම් (උ)**		**483,750,369**	**554,799,270**	
	තැන්පතු ගෙවීම්		11,783,275	360,606	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		6,431,231	67,547,408	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**18,214,506**	**67,908,014**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**1,034,578,910**	**1,023,635,383**	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(629,022,009)	(862,115,093)	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(629,022,009)	(862,115,093)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-		ඒසීඒ-3
			(629,022,009)	(862,115,093)	

3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2021 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය	
		2021	**2020**
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	711,491,113	34,630,877
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	20,631,323	21,118,584
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**732,122,436**	**55,749,461**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		18,316,098	8,851,493
දේපළ පිරියත හා උපකරණ සංචිතය		711,491,113	34,630,877
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	2,315,225	12,267,091
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**713,122,436**	**55,749,461**

පිටු අංක 07 සිට 64 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 65 සිට 74 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි

නම :

තනතුර :

දිනය : 2022/02/25

අනුරාධ විජේකෝන්
ලේකම්
තරුණ සහ ක්‍රීඩා අමාත්‍යාංශය
නො. 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

.....

ගණන්දීමේ නිලධාරි

නම :

තනතුර :

දිනය : 2022.02.25

රවීන්ද්‍ර සමරවික්‍රම
ලේකම්
ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන
රාජ්‍ය අමාත්‍යාංශය
12 වන මහල, බටහිර කුලුන,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/

අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)

නම :

දිනය : 2022

ප්‍රධාන ගණකාධිකාරී
ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන
රාජ්‍ය අමාත්‍යාංශය
12 වන මහල, බටහිර කුලුන,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.

3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2021	නැවත ගලපන ලද **2020**
	රු.	**රු.**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	21,159,297	2,716,902
අග්‍රිම ලැබීම්	396,807,000	102,628,000
අත්තිකාරම් අයකර ගැනීම්	6,284,936	39,927,528
තැන්පතු ලැබීම්	1,633,680	12,592,898
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**425,884,914**	**157,865,328**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	254,067,289	51,966,098
සහනාධාර සහ මාරුකිරීම්	1,242,453	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	1,066,415	48,250,059
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	129,431
අත්තිකාරම් ගෙවීම්	6,852,198	40,883,995
තැන්පතු ගෙවීම්	11,473,437	360,606
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**274,701,791**	**141,590,189**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**151,183,123**	**16,275,140**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	**-**	**-**

<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	151,183,123	16,620,754
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**151,183,123**	**16,620,754**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(151,183,123)**	**(16,620,754)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**-**	**(345,614)**
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**-**	**(345,614)**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**345,614**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.6 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු.

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු.

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	816,255,000	825,255,000	532,614,036	65%
ප්‍රාග්ධන	1,432,150,000	2,544,550,000	483,750,369	19%

3.8 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණු	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු.

වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2021** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2021** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	61,921,826	61,921,826	-	100%
9152	යන්ත්‍රෝපකරණ	417,397,951	417,391,951	-	100%
9160	කෙරීගෙන යන වැඩ	232,171,335	232,171,335	-	100%

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව **

** පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේදී, විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලෝකනය (SCAN) කොට මෙහි අන්තර්ගත කර ඇත.

04 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශකය

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	**75% - 89%**	**50% - 74%**
අමාත්‍යාංශය මඟින් ලබාදිය යුතු වාර්තා නියමිත දිනට ලබා දීම (ක්‍රියාකාරී සැලැස්ම, අයවැය ඇස්තමේන්තු, අභ්‍යන්තර විගණන සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම)	√		
ක්‍රීඩා පාසල් ආශ්‍රිත සංවර්ධන කටයුතු නීම කිරීමේ සමස්ත ප්‍රතිශතය		√	
පාසල් ක්‍රීඩාංගන සංවර්ධනය කටයුතු නීම කිරීමේ සමස්ත ප්‍රතිශතය			√
මහජනන හා වෙනත් ක්‍රීඩාංගන ඉදිකිරීමේ සමස්ත ප්‍රතිශතය			√
ක්‍රීඩා උපකරණ සැපයීමේ සමස්ත ප්‍රතිශතය			50 >
ක්‍රීඩා ආශ්‍රිත අධ්‍යාපනික හා ප්‍රචාරණ වැඩසටහන්වල සමස්ත ප්‍රතිශතය	√		

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්ක/ අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණය ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
03 නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධන ප්‍රවර්ධනය කිරීම	**3.1** දිවයිනේ තෝරාගත් ක්‍රීඩා පාසල් 16 ක සංවර්ධන කටයුතු කිරීම මඟින් එකී පාසල්වල දරුවන්ගේ ක්‍රීඩා හැකියා ඉහළ නැංවීම.	සංවර්ධන කටයුතු නිම කිරීමේ ප්‍රගතිය			√
	3.2 සෑම අධ්‍යාපන කලාපයකටම එක් පාසලක් බැගින් තෝරා, ක්‍රීඩා පහසුකම් සංවර්ධනය මඟින් දරුවන්ගේ ක්‍රීඩා හැකියාවන්ට පහසුකම් සැලසීම.	සංවර්ධන කටයුතු නිම කිරීමේ ප්‍රගතිය		√	
	3.3 මහජන ක්‍රීඩා පිටි හා වෙනත් ක්‍රීඩා පිටි සංවර්ධනය තුළින් ජනතාවට ක්‍රීඩාව සඳහා පහසු ප්‍රවේශයක් ඇති කිරීම.	සංවර්ධන කටයුතු නිම කිරීමේ ප්‍රගතිය		√	

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

2020.08.09 දින නිකුත් කරන ලද අංක 2187/27 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය අනුව පිහිටුවන ලද ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් ක්‍රීඩාව සඳහා වන සෘජු නොවන නමුත් වක්‍ර වශයෙන් සම්බන්ධ වන 03 වන තිරසර සංවර්ධන අභිමතාර්ථය හා ඊට අදාලව ඉලක්ක හඳුනාගෙන ඇත. මෙම අමාත්‍යාංශය මඟින් අත්කරගනු ලබන ජයග්‍රහණ තුළින් තිරසර සංවර්ධනය කෙරෙහි වන බලපෑම වක්‍රාකාර වන නිසාත්, වෙනත් ආයතන කිහිපයක් ඒ සඳහා සෘජුව හා වක්‍රව සම්බන්ධ වන නිසාත් ජයග්‍රහණ දර්ශක මෙන්ම ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය ප්‍රතිශත දත්ත වශයෙන් නිර්ණය කිරීම අභියෝගයකි.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	18	14	04
තෘතීයික	04	01	03
ද්විතීයික	70	36	34
ප්‍රාථමික	19	18	01

6.2 ** ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ විෂය පථය අනුව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් දක්වා ඇති පරිදි දිවයිනම ආවරණය වන පරිදි සියලුම ක්‍රීඩකයින්, පාසල් හා ක්‍රීඩාපිටි කේන්ද්‍ර කර ගනිමින් විවිධ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇතත් පවතින මානව සම්පත ප්‍රමාණවත් නොවන බැවින් එම වැඩසටහන් සාර්ථක කර ගැනීම කෙරෙහි දුෂ්කරතා මතු වී ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම *
			දේශීය	විදේශීය		
රාජ්‍ය මුල්‍ය කළමනාකරණය තුළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ වැඩමුළුව	08	2021.01.24,25	රු. 64,000	-	දේශීය	රාජ්‍ය මුල්‍ය කළමනාකරණය පිළිබඳ නීතිමය රාමුව සහ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ මූලික දැනුම
ලිපිගොනුකරණය පිළිබඳ පුහුණු වැඩසටහන	53	2021.03.31	නොමිලේ	-	දේශීය	ලිපි ගොනු නිවැරදිව පවත්වා ගැනීම ලිපි ගොනු ගත කරන ක්‍රම
විනය	73	2021.04.21	නොමිලේ	-	දේශීය	රාජ්‍ය සේවයේ මූලික විනය පිළිබඳ දැනුම.

කාර්යාල කළමණාකරණය හා මුදල් රෙගුලාසි	05	2021.11.11,12	රු. 50,000	-	දේශීය	කාර්යාලීය රාජකාරී කටයුතු කාර්යක්ෂම,ඵලදායී ලෙස සහ සරලව කර ගැනීමට අවශ්‍ය මූලික දැනුම
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ	01	2021.11.12,19,26	රු. 15,000	-	දේශීය	භාණ්ඩ සමීක්ෂණයන් නිවැරදිව පියවර වශයෙන් සිදුකරන ආකාරය පිළිබඳ දැනුම

*** ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.**

පුහුණු වැඩසටහන් තුලින් ලබා ගන්නා දැනුම හා කුසලතාවය ආයතනයේ කාර්යක්ෂමතාවය සඳහා ඉහළ නැංවීම සඳහා වැදගත් වේ. එම දැනුම ආයතනයේ ඵලදායීතාවය වැඩි කර ගැනීමටද ඉවහල් වේ.

නවක නිලධාරීන්ගේ දැනුම ආකල්ප හා කුසලතා වර්ධනය වීම තුලින් ඔවුන් රාජ්‍ය සේවයේ ආරම්භයේ පටන් නිවැරදි මාර්ගයකට යොමු වීම පුහුණු වැඩසටහනේ ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැක.

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම්ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.1	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		

3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේතුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විභණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	03 ක් පවත්වා ඇත		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට ඵලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැම්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැම්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		

13.2	පොදු තැම්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදී තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	-		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	-		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	-		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතන පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදී, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		

19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

අවසානයි.



ක්‍රීඩා වෛද්‍ය ආයතනය

වාර්ෂික කාර්යසාධන වාර්තාව **2021**

01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කායික හා මානසික නිරෝගී බව පවත්වාගෙන යාම සඳහාත්, ඔවුන්ගේ රෝග නිවාරණය , ආබාධ කළමනාකරණය සහ නිවැරදි පෝෂණ උපදෙස් ලබාදීම සඳහාත් පිහිටුවා ඇති ආයතනය ක්‍රීඩා වෛද්‍ය ආයතනයයි. මෙහිදී ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව භාවිතයෙන් ඔවුන් වෙත ලබාදිය හැකි උපරිම සේවාව ලබා දී ඔවුන්ගේ සහජ දක්ෂතාවයන් ඉහල නැංවීමට මෙම ආයතනය කටයුතු කරයි . ක්‍රීඩා වෛද්‍ය ඒකකයක් ලෙස ආරම්භ වී 2006 වර්ෂයේ සිට ක්‍රීඩා වෛද්‍ය ආයතනය ලෙස ස්ථාපිත වූ අතර පාසල් මට්ටමේ සිට හඳුනාගන්නා දක්ෂතා සහිත දරුවන් ජවසම්පන්න නිරෝගී ක්‍රීඩකයන් ලෙස ලොවට දායාද කිරීමට මෙම ආයතනය කැප වී සිටියි. ක්‍රීඩාවේ ඉහළ දක්ෂතා වර්ධනය සඳහා විද්‍යාත්මක තාක්ෂණය තවදුරටත් එකතු කිරීමට මානව කාර්යසාධන විද්‍යාගාරය ස්ථාපිත කර ඇති අතර ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ශාරීරික යෝග්‍යතාවය මැන බැලීම මඟින් ඔවුන්ගේ කාර්යක්ෂමතාවය වැඩි කිරීමට අවශ්‍ය දත්තයන් ලබාදීමත්, එම දත්ත උපයෝගී කර ගෙන සිදු කරන පර්යේෂණ තුළින් ජාත්‍යන්තර ජයග්‍රහණ ලබා ගැනීමත් ,ලොව දියුණු රටවල භාවිතා වන නවීන තාක්ෂණය භාවිතයෙන් ශ්‍රී ලාංකාවේ ක්‍රීඩාක්ෂේත්‍රය නව මාවතකට ගෙන ඒමත් ආයතනයේ බලාපොරොත්තුවයි.

1.2 දැක්ම, මෙහෙවර, අරමුණ

දැක්ම

"ආසියාව තුළ ක්‍රීඩා හා ව්‍යායාම වෛද්‍ය විද්‍යාවේ විශිෂ්ඨත්වයේ කේන්ද්‍රස්ථානය වීම"

මෙහෙවර

"ඉහළ කාර්යසාධන දක්ෂතා ඇති සහ විනෝදාත්මක ක්‍රීඩාවල යෙදෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා ඔවුන් හට සේවා සපයන්නන් හට, රෝගාබාධ වැලැක්වීමට, නිවාරණයට, පුනරුත්ථාපනය හා අධ්‍යාපනයට අවශ්‍ය සම්පත්, දැනුම හා මාර්ගෝපදේශ සැපයීම"

අරමුණු

- සියලුම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සෞඛ්‍ය හා කායික යෝග්‍යතාව ඉහළ නැංවීම තුළින් ඔවුන් ජාත්‍යන්තරය තුළ ක්‍රීඩාවෙන් ඉතා ඉහළ මට්ටමකට ගෙන ඒම.
- ක්‍රීඩා විද්‍යාව හා නවීන තාක්ෂණය උපයෝගි කරගනිමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ හැකියාවන් හඳුනා ගැනීම හා ඔවුන් විසින්ම උරුම කරගනු ලැබූ හැකියාවන් වර්ධනය කිරීම සඳහා මානව කාර්යසාධන විද්‍යාගාරය ස්ථාපිත කර ඉන් උපරිම ප්‍රතිඵල මෙරට ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙත ලබාදීම .
- ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා පූර්ව සහභාගිත්ව වෛද්‍ය පරීක්ෂණ පැවැත්වීම තුළින් ඔවුන්ගේ ගැටළු හඳුනා ගැනීම හා ඒ සඳහා අවශ්‍ය පිළියම් යෙදීම.
- ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කායික යෝග්‍යතාව හා පෝෂණ මට්ටම වරින්වර මැන බැලීම, කායික යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීම හා පෝෂණ සටහන් ලබා දීම තුළින් කායික යෝග්‍යතාවය සහ පෝෂණය වැඩිදියුණු කිරීම.
- ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ මානසික සෞඛ්‍ය වර්ධනය කරමින් ක්‍රීඩාවට උචිත ජයග්‍රාහී මානසික තත්ත්වයක් ළඟා කරදීමට උපදේශන හා මඟ පෙන්වීම .
- ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ මට්ටම ක්‍රීඩාවට උචිත පරිදි ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගැනීම .
- ක්‍රීඩාවේදි අවශ්‍ය ප්‍රථමාධාර භාවිතය පිළිබඳව පුහුණුකරුවන් හා වෛද්‍ය සහායකයන් දැනුවත් කිරීම සඳහා අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- දේශිය හා විදේශිය වශයෙන් පවත්වනු ලබන තරඟාවලි සඳහා ජාත්‍යන්තර මට්ටමේ ප්‍රථමාධාර හා වෛද්‍ය ආවරණ සැපයීම.
- ක්‍රීඩා විද්‍යා ක්ෂේත්‍රයට සම්බන්ධ දෙස් විදෙස් විද්වතුන් සමඟ පර්යේෂණ පැවැත්වීම හා ඒ තුළින් ලබා ගන්නා දැනුමෙන් මෙරට ක්‍රීඩාව උසස් මට්ටමකට ගෙන ඒම.

- ක්‍රීඩා හා ව්‍යායාම ක්ෂේත්‍රයට ක්‍රීඩා වෛද්‍ය විද්‍යාවේ දැනුම හා මාර්ගෝපදේශ ලබාදීම තුළින් නිරෝගි ප්‍රජාවක් බිහි කිරීම සඳහා දායක වීම.

1.3 ප්‍රධාන කාර්යයන්

- ක්‍රීඩා ආබාධ වැළැක්වීම සහ කළමනාකරණය
- විශේෂඥ වෛද්‍ය සායන පැවැත්වීම
- කායික යෝග්‍යතා පරීක්ෂණ
- ක්‍රීඩා වෛද්‍ය හා ප්‍රථමාධාර ආවරණය
- ක්‍රීඩා අධ්‍යාපනය
- ක්‍රීඩා පෝෂණ හා ක්‍රීඩා මානසික උපදේශනය
- පෝෂණ තත්ත්ව මැන බැලීමේ පරීක්ෂණ හා වෛද්‍ය පරීක්ෂණ පැවැත්වීම
- විනෝදාත්මක ක්‍රීඩා සඳහා යොමු වූ පුද්ගලයින් සඳහා ක්‍රීඩා හා ව්‍යායාම සම්බන්ධව උපදෙස් සහ වෛද්‍ය පහසුකම් ලබාදීම.
- දෙස් විදෙස් විද්වතුන් සමඟ ක්‍රීඩාව සහ ක්‍රීඩා පෝෂණය සම්බන්ධ පර්යේෂණ වෙනුවෙන් අවබෝධතා ගිවිසුම් ඇතිකර ගැනීම හා ක්‍රීඩාවේ ඉදිරි ගමන සඳහා එය දායක කර ගැනීම.

1.4 සංවිධාන සටහන


SL 3
අධ්‍යක්ෂ ජනරාල් -01
SL 2
වෛද්‍ය නිලධාරී -SLMS 11/111-08
SL 1
නියෝජ්‍ය - සහකාර අධ්‍යක්ෂ/SLAS 11/111-01
01
MN 7
පරිපාලන නිලධාරී -01
MN 5
පෝෂණවේදී 01-
MN 4
පර්යේෂණ නිලධාරී 02 -
සංවර්ධන නිලධාරී 04 -
වැඩසටහන් සහකාර 01 -
MT 7
භෙද නිලධාරී 05 -
MT 6
ඖෂධවේදී -02
වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පී-01
01 -
භෞත චිකිත්සක - 02
MN 2
කළමණාකාර සහකාර- 02
MT 1
තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහකාර-01
01 -
PL 1
රසායනාගාර සහායක- 04
උපස්ථායක- 05
කාර්යාල කාර්යය සහායක- 05
PL 2
සම්බාහකවරු-25
PL 3
රියදුරු -06

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු / දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ /දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල - නැත

1.6 අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/පළාත් සභාව යටතේ පවතින ආයතන - නැත

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්) - නැත

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ

බාහිර රෝගී අංශය, පුනරුත්ථාපන අංශය, හදිසි ප්‍රතිකාර අංශය, මානසික උපදේශන අංශය, ජෛව යාන්ත්‍රණ අංශය, ඖෂධ සැපයුම් අංශය, කායික යෝග්‍යතා පරීක්ෂණ අංශය, පෝෂණ අංශය, රසායනාගාර අංශය හා එක්ස් කිරණ අංශය මඟින් සේවාවන් විධිමත් ලෙස සපයනු ලබන අතර ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියුතු වූවන් දැනුවත් කරමින් ක්‍රීඩා වෛද්‍ය උපදේශන සේවා සැපයීම ද මෙමගින් විසින් සිදු කරනු ලබයි.

කොවිඩ්-19 රෝගී තත්ත්වය තුළ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පුහුණු කටයුතු ප්‍රශස්ථ මට්ටමකින් පවත්වාගෙන යාමට මෙන්ම ජාතික හා ජාත්‍යන්තර තරඟාවලි පැවැත්වීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදෙස් ඇතිව මාර්ගෝපදේශ සකස් කර ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදී.

- 2021 වර්ෂය තුළදී පාසල් මට්ටමේ සිට ජාතික හා ජාත්‍යන්තර තලය දක්වා ක්‍රීඩක ක්‍රීඩිකාවන් 763 දෙනෙකු සඳහා නව ලියාපදිංචි කිරීම් සිදුකල අතර එම වර්ෂයේ ප්‍රතිකාර සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් 2205 දෙනකු හා ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියුතු වූවන් සඳහා ප්‍රතිකාර සපයා ඇත.

- ක්‍රීඩා අනතුරු වලදී වැඩිදුර පරීක්ෂණ හා ප්‍රතිකාර සඳහා ජාතික රෝහල, ශ්‍රී ජයවර්ධනපුර රෝහල හා ජාතික වෛද්‍ය පර්යේෂණ ආයතනය වැනි ආයතන මඟින් සේවය ලබා ගැනීම සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් යොමු කරනු ලැබේ.කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ විශේෂඥ වෛද්‍ය සායන කිහිපයක් පමණක් පැවැත් වූ නමුත් ජාතික මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ අවශ්‍යතාවය මත ඔවුන් බාහිර විශේෂඥ වෛද්‍ය සායන වෙත යොමු කර ඇත .

- ක්‍රීඩා වෛද්‍ය ආයතනයේදී මෙන්ම බාහිර වෛද්‍ය ආවරණ වලදී ද සිදුවන ක්‍රීඩා අනතුරු සඳහා ප්‍රථිකාර කිරීමේ දී හදිසි ප්‍රතිකාර අංශය වැදගත් මෙහෙයක් ඉටු කරයි . 2021 වර්ෂයේ දී එම අංශය විසින් හදිසි ප්‍රතිකාර සේවාවන් 2007 ක් පමණ සිදු කර ඇත.

- ක්‍රීඩා මානසික උපදේශනය අවශ්‍ය ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනාගෙන අවශ්‍ය ප්‍රතිකාර හා උපදේශන කටයුතු සඳහා යොමු කිරීම අප ආයතනය මඟින් සිදු කෙරේ .

- ක්‍රීඩා තරඟ හා පුහුණු කටයුතු වලදී ආබාධ වලට ලක් වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් කඩිනමින් නැවත ක්‍රීඩා කටයුතු සඳහා යොමු කිරීම අරමුණු කර ගනිමින් පුනරුත්ථාපන අංශය ක්‍රියා කරයි. මේ සඳහා උසස් තාක්ෂණික උපකරණ රාශියක් ක්‍රීඩා වෛද්‍ය ආයතනය සතුව පවතී. පුනරුත්ථාපන අංශය භෞත චිකිත්සක හා සම්භාහක ලෙස අංශ දෙකක් යටතේ සේවා සපයන අතර ක්‍රීඩක ක්‍රීඩිකාවන් 2457 දෙනෙකු භෞත චිකිත්සක අංශයෙන්ද, 2142 ක් සම්භාහක අංශයෙන් ද 2021 වර්ෂයේ දී සේවා සපයා ගෙන ඇත.

- ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම හා ක්‍රීඩාව සඳහා ඔවුන්ගේ කායික ශක්තිය පවත්වා ගැනීම සඳහා උපදෙස් ලබා දීම පෝෂණ අංශය මඟින් සිදුවේ. ඉහළ දක්ෂතා සහිත ක්‍රීඩකයින්ගේ පෝෂණ අවශ්‍යතා හඳුනා ගනිමින් ඔවුන්ට විශේෂිත වූ පෝෂණ දැනුවත් කිරීම් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පෝෂණ සටහන් නිකුත් කිරීම, අතිරේක පෝෂක නිර්දේශ කිරීම ඇතුළු කාර්යයන් රාශියක් අප විසින් ඉටු කර ඇත.

- ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කායික යෝග්‍යතාවය පිළිබඳ පරීක්ෂණ සිදු කිරීම ද මෙම ආයතනය විසින් සිදුකරනු ලබන අතර 2021 වර්ෂයේ ක්‍රීඩා සංවිතවල ක්‍රීඩක ක්‍රීඩිකාවන් 530 දෙනෙකුගේ කායික යෝග්‍යතා පරීක්ෂණ සිදුකර නිර්දේශ ලබා දී ඇත.

- පාසල් මට්ටමේ සිට ජාත්‍යන්තර තලය දක්වා මෙරට පැවැත්වූ ක්‍රීඩා තරඟාවලි හා පසුගිය වසරේ පැවති විදේශීය ක්‍රීඩා තරඟාවලීන් සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සියලු වෛද්‍ය ආවරණයන් සැපයීම ආයතනය තුළින් සිදුකල අතර එය ප්‍රමාණාත්මකව ක්‍රීඩා තරඟාවලීන් 60 ක් පමණ වේ.

ක්‍රීඩා වෛද්‍ය ආයතනය මඟින් සිදු කරනු ලබන සුවිශේෂී කාර්යයන්.

1. මානව කාර්යසාධන විද්‍යාගාරය ස්ථාපිත කිරීම

   තරඟකාරී ක්‍රීඩාවෙන් ලොව ජයගැනීමට අවශ්‍ය තාක්ෂණය කඩිනමින් යොදා ගනිමින් උපරිම කාර්යසාධන මට්ටම් කරා ලඟාවීම, ආබාධ පුනරුත්ථාපනය, ආබාධ වලක්වා ගැනීම ,පර්යේෂණ තුලින් ලබා ගන්නා දත්ත ක්‍රීඩක ක්‍රීඩිකාවන්, පුහුණුකරුවන් හා ප්‍රවර්ධන කණ්ඩායම් වෙත ලබා දීම වෙනුවෙන් මානව ක්‍රීඩා කාර්යයසාධන විද්‍යාගාරයක් ස්ථාපිත කිරීමට ක්‍රියා කල අතර ඒ තුළින් ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා වර්ධනයට දායකත්වයක් සැපයීම.

2. Vo_2 Max යන්ත්‍රය භාවිතයෙන් පරීක්ෂණ සිදු කිරීම

   ක්‍රීඩකයින්ගේ ජයග්‍රහණය සඳහා අවශ්‍ය කායික යෝග්‍යතාවය වැඩි දියුණු කිරීමට යොදා ගැනීම.

3. භෞත චිකිත්සක අංශයේ සේවාවන් පුළුල් කිරීම

   නවීන යන්ත්‍රෝපකරණ හා නවීන ශිල්ප ක්‍රම භාවිතයට ගැනීම.

4. සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදෙස් වලට අනුව කොවිඩ්-19 වෛරස් තත්ත්වය තුළ ක්‍රීඩාව නැවත ආරම්භ කිරීමට අදාලව මාර්ගෝපදේශ සකස් කිරීම හා සෞඛ්‍ය අමාත්‍යාංශය හා එක්ව වරින් වර සංශෝධන එක් කිරීම, ඒවා ක්‍රියාත්මක කිරීම, ක්‍රීඩා සංගම්වලට නැවත ක්‍රීඩාව ආරම්භ කිරීම සඳහා උපදෙස් ලබා දීම හා මඟ පෙන්වීම හරහා කොවිඩ්-19 තත්වයත් සමඟ මෙරට ක්‍රීඩාව සාර්ථකව පවත්වාගෙන යාම.

   ජාතික මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ හා ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිරත වූවන්ගේ කොවිඩ් එන්නත්කරණයට මැදිහත් වී එන්නත් 501 ක් පමණ ලබා දීමටත් කොවිඩ් ක්ෂණික ප්‍රතිදේහ පරීක්ෂණ 688 ක් සිදු කිරීමටත් 2021 වර්ෂයේ දී ක්‍රියාකර ඇත.

   කොවිඩ්-19 තත්ත්වය පාලන කිරීමේදී කොවිඩ් ආසාදිත ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා කාර්යය මණ්ඩලය සඳහා කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථාන 2 ක් පවත්වාගෙන යමින් ඔවුන්ගේ කොවිඩ් රෝගී තත්වය පාලනයට දායක වීම.

5. ඉහළ කාර්යසාධනය සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ තත්ත්වය ඉහල නැංවීම.
   ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ඉහළ කාර්යසාධනය සඳහා අවශ්‍ය පෝෂණ තත්වය පවත්වා ගැනීමට ක්‍රියා කිරීම සඳහා ඒ සම්බන්ධව ප්‍රමාණික දැනුම ඇති විශ්වවිද්‍යාල ආචාර්ය, මහාචාර්යවරුන්ගෙන් යුත් කමිටුවක් පත්කර ඇති අතර ඔවුන් පශ්චාත් උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් හා ඔවුන්ගේ සහයෝගයෙන් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ තත්වය මැන බැලීම, ඉහළ කාර්යසාධන තත්වයන්වල සිටින ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා පෝෂණ උපදෙස් , හා පෝෂණ ගැටළු හඳුනාගෙන ඒ සඳහා ප්‍රතිකර්ම ක්‍රියාවට නැංවීම.

2.2 අභියෝග

- කොවිඩ් - 19 වසංගතය හමුවේ අපේක්ෂිත වැඩසටහන් සැලසුම් කරන ලද ආකාරයෙන් පැවැත්වීමට නොහැකි වීම.
- ක්‍රීඩා තරඟ පැවැත්වීමටත්, ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණුවීම් හා ක්‍රීඩා තරඟාවලි සඳහා සහභාගී නොවීමත් හේතුවෙන් ඔවුන්ගේ ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ, පෝෂණ ගැටලු හා අනෙකුත් සේවා සැපයීම් කෙරෙහි මැදිහත් වීමට නොහැකි වීම.
- කාර්යය මණ්ඩලය ඇතුලු ක්‍රීඩක ක්‍රීඩිකාවන් කොවිඩ් වසංගතයට ගොදුරු වීම නිසා ඔවුන් රෝග බලා ගැනීමට මැදිහත් වීමට සිදු වීම හා එහිදී වෛද්‍ය කාර්යය මණ්ඩලයට කොවිඩ් හා ඩෙංගු රෝගය වැළඳීම.
- රටෙහි පැවති ආර්ථික හා කොවිඩ් වසංගත තත්වය හමුවේ අත්‍යවශ්‍ය ක්‍රීඩා වෛද්‍ය උපකරණ ආනයනය කිරීමේ ගැටලු මතු වීම.

2.3 අනාගත අරමුණු

- මානව කාර්යසාධන විද්‍යාගාරය ස්ථාපිත කිරීමෙන් එහි සියලු පහසුකම් මෙරට ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙත ලබා දීමට ක්‍රියා කිරීම හා පුනරුත්ථාපන අංශය සඳහා සපයා ගන්නා ලද යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යොදා ගනිමින් ක්‍රීඩාවේ නවීන තාක්ෂණය මෙරට ක්‍රීඩාව නගා සිටුවීම සඳහා යොදා ගැනීම.

- නවීන තාක්ෂණය තවදුරටත් මෙරට ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් යොදා ගැනීම සඳහා ජාත්‍යන්තර දැනුම හුවමාරු කර ගැනීම හා මානව සම්පත් සංවර්ධනය.
ඒ සඳහා මේවන විට මෙරට විශ්වවිද්‍යාල දෙකක් හා ශ්‍රී ලංකා පෝෂණ සංගමය සමඟ අවබෝධතා ගිවිසුම් ඇතිකරගෙන ඇති අතර ඉදිරියේදී ජාත්‍යන්තර ආයතන කරා යොමුවීමට අපේක්ෂා කෙරේ.

- පෝෂණය සම්බන්ධව ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ගැටළු හඳුනා ගැනීමට පර්යේෂණ පවත්වා ලැබෙන ප්‍රතිඵල මත අවශ්‍ය නිර්දේශ හා මඟ පෙන්වීම් ලබාදීම.

- ක්‍රීඩා වෛද්‍ය ආයතනය ආදායම් උත්පාදන ආයතනයක් බවට උසස් කිරීම.

- ක්‍රීඩා වෛද්‍ය ආයතනය සඳහා ස්වේච්ඡා සේවා කණ්ඩායමක් ස්ථාපිත කිරීම.

  ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ සේවය සඳහා සුදුසුකම් ලත් ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති බැවින් ඒ ඒ අංශ වල සුදුසුකම් ලත් පිරිසකගෙන් ස්වෙච්ඡා පදනම මත සේවා ලබා ගැනීමට කටයුතු කරමින් සිටී. ඒ අනුව වෛද්‍ය ,හෙද,භෞත චිකිත්සක හා අනෙකුත් ක්ෂේත්‍ර වල නිපුණතාවයන්ගෙන් හෙබි පුද්ගලයන් ස්වෙච්ඡා පදනමෙන් සේවය ලබා දීමට කැමැත්ත පල කරති අතර දැනටමත් සේවා ලබා ගනිමින් සිටී. ඒ සඳහා පුද්ගලයින් 247 ක් පමණ කැමැත්ත පල කර ඇත.

- ක්‍රීඩා හා ව්‍යායාම ක්ෂේත්‍රයේ ව්‍යායාම මධ්‍යස්ථාන හා රැකියා වල නියුතු වූවන් සඳහා නියාමන ආයතනයක් ඇති කිරීම.

  දැනට ක්‍රීඩා හා ව්‍යායාම ක්ෂේත්‍රය තුළ කටයුතු සිදුකරන මධ්‍යස්ථාන වෘත්තීන් හා වෘත්තිකයින් හඳුනාගැනීම සඳහා ජාතික හා ජාත්‍යන්තරව පිළිගත් සුදුසුකම් ලබා ගැනීමට නිර්ණායක සැකසීම, මධ්‍යස්ථාන ප්‍රමිතිකරණය කිරීම, වෘත්තිකයින්ගේ දැනුම වර්ධනය හා යාවත්කාලීන කර හැඳුනුම්පතක් සහිතව ලියාපදිංචි කරගැනිම සඳහා නීතිමය රාමුවක් තුළ නියාමන ආයතනයක් ස්ථාපිත කිරීම මඟින් දේශීයව හා විදේශීයව රැකියා අවස්ථා ලබාගත හැකි වෘත්තිකයින් පිරිසක් බිහි කිරීම සහ ව්‍යායාම සඳහා ආරක්ෂිත පරිසරයක් බිහිකිරීම .

- ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා වර්ධනයට අවශ්‍ය පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම.

නීරෝගී නිවැරදි පෝෂණයක් සහ පෝෂණ පුරුදු පිළිබඳ අවබෝධයක් පාසල්, පළාත් සහ ජාතික මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ලබාදීම තුළින් ජවසම්පන්න,විශ්වාසයෙන් යුතු වැඩි දක්ෂතාවයෙන් හෙබි ජාත්‍යන්තර මට්ටමේ පදක්කම් ලැබිය හැකි ක්‍රීඩක ක්‍රීඩිකාවන් බිහිකිරීම හා ඔවුන් තහනම් උත්තේජක භාවිතයෙන් තොර, ක්‍රීඩා අනතුරු අවම මට්ටමක පවත්වා ගන්නා පිරිසක් බවට පත් කිරීම.

- ක්‍රීඩා හා ව්‍යායාම වෛද්‍ය විද්‍යා පර්යේෂණ පැවැවීම.

  ක්‍රීඩා හා ව්‍යායාම විද්‍යාව හා වෛද්‍ය විද්‍යාව සම්බන්ධ පර්යේෂණ සිදු කිරීම තුළින් පාසල්,පළාත් හා ජාතික තලයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කුසලතා වැඩිදියුණු කිරීමේ ක්‍රමවේද හඳුනා ගැනීම සඳහා ක්‍රීඩා හා ව්‍යායාම විද්‍යාව පාඨමාලා සහිත විශ්වවිද්‍යාල, ඉංජිනේරු සහ තාක්ෂණික විශ්වවිද්‍යාල, ආයතනන හා පුද්ගලයින් සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම සහ ක්‍රීඩා හා ව්‍යායාම ක්ෂේත්‍රයේ තාක්ෂණික මෙවලම් නිර්මාණය කිරීමට නවෝත්පාදකයින් යොමු කරවීම.

- මානව කාර්යසාධන විද්‍යාගාරය ස්ථාපිත වීමත් සමඟ එම පරීක්ෂණාගාරයේ පහසුකම් උපයෝජනය කර ගනිමින් ක්‍රීඩා වෛද්‍ය විද්‍යා පර්යේෂණ සිදුකිරීමෙන් මෙරට ක්‍රීඩාවේ මෙන්ම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කාර්යසාධන මට්ටම ඉහළ නැංවීම සඳහා දායකත්වය ලබා දීම.

Institute of Sports Medicine
Ministry of Sports,
Torrington Place,
Colombo 07.

මෙයට .....

ආයතන ප්‍රධානී

නම : S.P.P.D. අල්විස්

තනතුර : වෛද්‍ය නිළධාරී

දිනය : 2022.02.23

අමාත්‍යාංශයේ ගිණුම තුළ ඇතුළත්වේ.

04. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	**75% - 89%**	**50% - 74%**
වර්ෂයකදී සේවාවන් සඳහා පැමිණි ක්‍රීඩක ක්‍රීඩිකාවන් ගණන		√	
දේශීය හා විදේශීයව සිදුකල ආවරණ සංඛ්‍යාව		√	
හදිසි ප්‍රතිකාර අංශයෙන් සපයන ලද සේවා ප්‍රමාණය	√		
පුනරුත්ථාපන අංශයෙන් සපයන ලද සේවා ප්‍රමාණය		√	

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණය ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම.	ක්‍රීඩා අනතුරුවලින් තොර ක්‍රීඩා සංස්කෘතියක් බිහි කිරීම	වෛද්‍ය ආවරණ හා වෛද්‍ය සේවා සැපයීමේ ප්‍රමාණය		√	
සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ හා තිරසර ආර්ථික වර්ධනය පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම	ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා වර්ධනයට හා නිරෝගීකම රැක ගැනීම සඳහා අවශ්‍ය පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම	ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ තත්ත්වය ඉහළයාමේ ප්‍රතිඵලයක් ලෙස ලද ජයග්‍රහණ ප්‍රමාණය			√
පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම.	ක්‍රීඩා හා ව්‍යායාම ක්ෂේත්‍රයේ රැකියාවල නියුතු වූවන් සඳහා නියාමන ආයතනයක් ඇති කිරීම	විධිමත් ලෙස බිහි කරන ලද වෘත්තිකයින් ප්‍රමාණය	2022 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘතියකි		

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න

තිරසර සංවර්ධන අරමුණු / ඉලක්ක ලභාකර ගැනිම සඳහා ආයතනයේ ක්‍රියාකාරී සැලසුම් සකස්කර මෙරට ක්‍රීඩාවේ ජාතික හා ජාත්‍යන්තර ජයග්‍රහණ ලභාකර ගැනිමට ක්‍රියා කරනු ඇත.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	09	06	02
තෘතීයික	02	0	02
ද්විතීයික	22	17	05
ප්‍රාථමික	45	47	02

6.2 ** ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

දැනට පුරප්පාඩු වී ඇති තනතුරුවලට අදාල රාජකාරි ඉටු කිරීමේදී දුෂ්කරතා ඇති වුව ද සේවා නියුක්ත කාර්යය මණ්ඩලය යොදවා ගැනීමෙන් අදාල සේවාවන් පවත්වාගෙන යාමටත් මානව සම්පත් හිඟය ඉක්මනින් සපුරා ගැනීමටත් කටයුතු කරමින් සිටී.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම *
			දේශීය	විදේශීය		
1. ක්‍රීඩා වෛද්‍ය විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව	01	අවුරුදු 02		රු.මි.0.6	අන්තර්ජාලය මඟින්	ක්‍රීඩා වෛද්‍ය හා ක්‍රීඩා පෝෂණ දැනුම යාවත්කාලීන කිරීම
2. ක්‍රීඩා පෝෂණ ඩිප්ලෝමා පාඨමාලාව	01	අවුරුදු 02		රු.මි.0.6	අන්තර්ජාලය මඟින්	ක්‍රීඩා වෛද්‍ය හා ක්‍රීඩා පෝෂණ දැනුම යාවත්කාලීන කිරීම

2021 වර්ෂයේ පැවති කොවිඩ් - 19 තත්ත්වය මත සැලසුම් කල පුහුණු පාඨමාලා සඳහා සහභාගීවීමට නොහැකි වූ නමුත් පිරිවැයක් නොදරා ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියුතු වූවන්ගේ දැනුම යාවත්කාලීන කිරීම සඳහා පාඨමාලා රාශියක් පවත්වා ඇත.

අනු අංකය	ක්‍රියාත්මක කරන වැඩසටහන/ව්‍යාපෘතිය	සහභාගී වූ සංඛ්‍යාව	සම්බන්ධීකරණ ආයතනය/නිළධාරීන්
01	ලිපි ගොනුකරනණය පිළිබඳ පුහුණු වැඩසටහන	නිලධාරීන් 08	රාජ්‍ය අමාත්‍යාංශය මඟින්
02	කොළඹ විශ්වවිද්‍යාලයේ භෞත චිකිත්සක උපාධිය ලබා ඇති ශිෂ්‍යයන් සඳහා අප ආයතනයේ භෞත චිකිත්සක අංශය මඟින් පුහුණුව ලබා දීම	ශිෂ්‍යයන් 30	ක්‍රීඩා වෛද්‍ය ආයතනය
03	කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සඳහා භෞත චිකිත්සක පුහුණුව ලබා දීම	ශිෂ්‍යයන් 03	ක්‍රීඩා වෛද්‍ය ආයතනය

04	පුහුණුකරු උසස් පාඨමාලාව (මලල ක්‍රීඩා) 2020/2021	ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ නිලධාරීන්	ජාතික ක්‍රීඩා විද්‍යායතනය
05	ක්‍රීඩා පෝෂණ වැඩමුළු -38	ක්‍රීඩා පුහුණුකරුවන්,ක්‍රීඩා ගුරුවරු,ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියුතුවූවන්	ක්‍රීඩා වෛද්‍ය ආයතනය
06	කොවිඩ් -19 ආරක්ෂිත ජෙව බුබුළ පිළිබඳ පුහුණු වැඩමුළුව	350	ක්‍රීඩා වෛද්‍ය ආයතනය
07	කොවිඩ් -19 වළක්වා ගැනීම	මලල ක්‍රීඩක ක්‍රීඩිකාවන්	ක්‍රීඩා වෛද්‍ය ආයතනය
08	ඉහළ දක්ෂතා සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ දැනුම යාවත්කාලීන කිරීම	50	ක්‍රීඩා වෛද්‍ය ආයතනය
09	කොවිඩ් -19 පසු තත්ත්වය පිළිබඳ පුහුණු වැඩමුළුව	54	ක්‍රීඩා වෛද්‍ය ආයතනය
10	තහනම් උත්තේජක පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව	369	ක්‍රීඩා වෛද්‍ය ආයතනය

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
1.6	වෙනත්	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	

3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ	-	
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ	-	
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
4.4	වාර්ෂික ඇස්තමේතුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
5	**විගණන විමසුම**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ	අමාත්‍යාංශය මඟින්	
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		

10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්යය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල නොවේ	-	

15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල නොවේ	-	
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින්	
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතන පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	-		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇඟයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	-		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		

19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛ යේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	-		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධන කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

අවසානයි.

ජාතික ක්‍රීඩා විද්‍යායතනය

වාර්ෂික කාර්යසාධන වාර්තාව 2021

01. පරිච්ඡේදය - ආයතනික පැතිකකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ක්‍රීඩා පාසල නමින් 1979 වර්ෂයේදී ආරම්භ වූ මෙම ආයතනය 1996 වර්ෂයේදී විශේෂ පාර්ලිමේන්තු පනතක් මඟින් **ජාතික ක්‍රීඩා විද්‍යායතනය** ලෙස ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකාවේ ක්‍රීඩා අධ්‍යාපනයේ ප්‍රමුඛ ආයතනය වෙමින් ක්‍රීඩාවේ උන්නතිය උදෙසා ප්‍රබල දායකත්වයක් ලබාදෙමින් ක්‍රීඩා දැනුම සමාජගත කිරීමේ කාර්ය ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය විසින් ඉටු කරනු ලබයි.

දේශීය සහ ජාත්‍යන්තර ක්‍රීඩා ජයග්‍රහණ ළඟා කර ගැනීමට දැනුම, ආකල්ප හා කුසලතා සංවර්ධනය කිරීම, යාවත්කාලීන කිරීම මෙන්ම ක්‍රීඩාවේ විවිධ ස්ථරයන්ගේ මානව සම්පත් සංවර්ධනය කරමින් ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියෙකුටම ක්‍රියාශීලී දිවිපෙවෙතක් උරුම කර දීම ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ කෙටිකාලීන හා දිගුකාලීන උපායමාර්ග සහ සැලසුම් තුළින් අරමුණු කෙරේ.

2021 වර්ෂයේදී රටෙහි පැවති කොවිඩ්-19 වෛරස් තත්වය හමුවේ වුවද ආයතනය විසින් පවත්වනු ලබන ප්‍රධාන පාඨමාලාවන්හි දේශන සාර්ථකව ZOOM තාක්ෂණය ඔස්සේ පැවැත්වීමට ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයට හැකි විය.

1.2 දැක්ම, මෙහෙවර, අරමුණ

දැක්ම

"ක්‍රීඩා අධ්‍යාපනයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ ආයතනය වීම"

මෙහෙවර

"ක්‍රීඩා ප්‍රතිපත්ති සම්පාදනයට දායක වීම, ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියුතු පුද්ගලයන්ගේ නිපුණතා, ශක්‍යතා, දක්ෂතා, සහ දැනුම වර්ධනය කිරීම සඳහා ක්‍රීඩා අධ්‍යාපනය ලබාදීම සහ පර්යේෂණ පැවැත්වීම තුළින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම"

අරමුණු

1. ක්‍රීඩා ක්ෂේත්‍රයේ කාලීන අවශ්‍යතා හඳුනාගෙන ක්‍රීඩා අධ්‍යාපන සුදුසුකම් සපුරාලීම සඳහා පාඨමාලා නිර්මාණය කිරීම, සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම.
2. ක්‍රීඩා ක්ෂේත්‍රයේ සංවර්ධනයට අදාල වන පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
3. ක්‍රීඩා අධ්‍යාපනයේ සංවර්ධන ප්‍රමිතිකරණය සඳහා අවශ්‍ය විශේෂඥතාව කාලීනව විධිමත් කිරීම හා මෙහෙයවීම.
4. නව ක්‍රීඩා දැනුම ග්‍රාමීය මට්ටමින් ලබාදීම අරමුණු කර ගනිමින් කෙටිකාලීන පාඨමාලා සහ පුහුණු වැඩසටහන් මඟින් නව ක්‍රීඩා දැනුම ග්‍රාමීය ප්‍රදේශ වෙත ගෙනයාම.

1.3 ප්‍රධාන කාර්යයන්

#	සේවාවන්	ඉලක්ක කණ්ඩායම
1	ක්‍රීඩා පනතේ විධිවිධාන වලට අනුව මෙන්ම ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ IV, NVQ V, NVQ VI) සඳහා අනුකූල වන පරිදි ක්‍රීඩා පාඨමාලාවන් පැවැත්වීම. එමෙන්ම ක්‍රීඩා කළමනාකරණය, ක්‍රීඩා ආබාධ කළමනාකරණය ඇතුළු ක්ෂේත්‍ර ආවරණය කරමින් පාඨමාලා පැවැත්වීම සහ ක්‍රීඩා වැඩසටහන් පැවැත්වීම.	පුහුණුකරුවන්, ක්‍රීඩා නිලධාරීන්, අධ්‍යාපන අමාත්‍යාංශයේ ශාරීරික අධ්‍යාපන උපගුරුවරුන්, ආරක්ෂක අංශයන්හි ශාරීරික අභ්‍යාස උපදේශකවරුන්, ක්‍රීඩකයන්, ක්‍රීඩා මාධ්‍යවේදීන්
2	ක්‍රීඩා තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම	ක්‍රීඩා ක්ෂේත්‍රයේ සියලුම පාර්ශවයන්
3	ක්‍රීඩා යටිතල පහසුකම් සැපයීම	ක්‍රීඩා ක්ෂේත්‍රයට සම්බන්ධ සියලුම ආයතන
4	ශරීර සුවතා වැඩසටහන් පැවැත්වීම	ශරීර සුවතාව හා ඒ පිළිබඳ දැනුම ලබා ගැනීමට අපේක්ෂා කරන රාජ්‍ය නිලධාරීන් ඇතුළු මහජනතාව
5	ක්‍රීඩා සේවයේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම	පුහුණුකරුවන් හා ක්‍රීඩා නිලධාරීන්
6	ක්‍රීඩා පුහුණුකරුවන්ගේ කුසලතා, ආකල්ප සංවර්ධනය කර ඔවුන් සඳහා පුහුණුකරු ලියාපදිංචි සහතිකය නිකුත් කිරීම	සියලුම ජාතික ක්‍රීඩා සංගම් හා ඊට අයත් පුහුණුකරුවන්

1.4 සංවිධාන සටහන


අධ්‍යක්ෂ SL 1
කථිකාචාර්ය SL 1 - 06
ලේඛකාධිකාරී MN 7 - 01
සංවර්ධන නිළධාරී MN 4 -09
සහකාර කථිකාචාර්ය MN 7 - 08
භාෂා පරිවර්තක MN 6 - 01
තොරතුරු තාක්ෂණ නිලධාරී MN 6 -
පුස්ථකාලයාධිපති MN 3 - 01
කළමනාකරණ සහකාර
ක්‍රීඩා උපදේශක MN 4 - 10
නේවාසිකාගාර පාලිකා MN 1 - 01
ප්‍රදර්ශක MT 1 - 02
ප්‍රදර්ශක MT 1 - 02 (කොන්ත්‍රාත්
රියදුරු PL 3 - 02
කාර්යාල කාර්ය සහායක PL 1 – 05

1.5 ආයතනය තුළ පිහිටුවා ඇති අංශ

පරිපාලන අංශය

ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ අභ්‍යන්තර පාලන කටයුතු මෙම අංශය මඟින් සිදුකෙරේ.

පාඨමාලා අංශය

ආයතනය මඟින් පවත්වනු ලබන ප්‍රධාන පාඨමාලාවන්හි සම්බන්ධීකරණ කටයුතු මෙම අංශය මඟින් ඉටුකෙරේ.

පුහුණුකරුවන් ලියාපදිංචි කිරීමේ අංශය

ශ්‍රී ලංකාවේ සියලු පුහුණුකරුවන් ලියාපදිංචි කිරීමට අදාළ කාර්යන් මෙම අංශය මඟින් ඉටුකෙරේ.

පුස්තකාලය හා ඊට අදාල සේවා සැපයීමේ අංශය

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ ක්‍රීඩා පුස්තකාලයක් ලෙස ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ පුස්තකාලය හැඳින්විය හැකිය. මෙම පුස්තකාලය මඟින් e-book සේවාව, ක්‍රීඩාවට අදාළ සංයුක්ත තැටි පිටපත් ලබා දීමේ සේවාව, පුවත්පත් හා ග්‍රන්ථ බැහැර දීමේ සේවාව, ක්‍රීඩා සම්පත්දායක තොරතුරු ලබාදීමේ සේවාව, e- Library Friend සේවාව සහ e- News Papers සේවාවන් ලබා ගත හැකිය.

පරිගණක අංශය

ජාතික ක්‍රීඩා විද්‍යායතනය විසින් පවත්වනු ලබන පාඨමාලාවන්ට අදාලව පරිගණක දැනුම අභ්‍යාසලාභීන් වෙත ලබාදීම සඳහා පරිගණක අංශය උපයෝගී කර ගනී.

1.6 අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / පළාත් සභාව පවතින ආයතන - නැත

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්) - නැත

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ

‘‘රට හදන සෞභාග්‍යයේ දැක්ම’’ යථාර්ථයක් බවට පත්කරමින් පළාත් මට්ටමින් ක්‍රීඩා විද්‍යායතන ස්ථාපිත කර ක්‍රීඩා පාඨමාලා ආරම්භ කිරීමට කටයුතු කරන ලදී. මෙහිදී, මධ්‍යම, ඌව, දකුණ සහ බස්නාහිර යන පළාත්හි පළාත් මට්ටමින් ක්‍රීඩා විද්‍යායතන ස්ථාපිත කිරීම සිදුකරන ලද අතර එම ආයතනවල ආරම්භ කල පාඨමාලා මේ වනවිට සාර්ථකව පැවැත්වෙමින් තිබේ.

මීට අමතරව ජාතික ක්‍රීඩා විද්‍යායතනය විසින් ක්‍රීඩා පුහුණුකරුවන් ක්‍රීඩා නිලධාරීන්, අධ්‍යාපන අමාත්‍යාංශයේ ශාරීරික අධ්‍යාපන උපගුරුවරුන්, ශාරීරික අභ්‍යාස උපදේශකවරුන් ආරක්ෂක අංශවල නිලධාරීන්, ස්වේච්ඡා ක්‍රීඩා පුහුණුකරුවන් හා ක්‍රීඩකයින්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ හා ඉහළ නැංවීමේ අරමුණින් ක්‍රීඩා අධ්‍යාපන පාඨමාලා හා වැඩසටහන් පවත්වාගෙන යනු ලබයි. 2021 වර්ෂයේදී පවත්වා ඇති සමස්ත පාඨමාලා සහ පුහුණු වැඩසටහන් ගණන 28කි.

2021 වර්ෂය තුළ පැවැත්වූ ක්‍රීඩා පාඨමාලා සහ ක්‍රීඩා වැඩසටහන් පිළිබඳ විස්තරය පහත දැක්වේ.

	පාඨමාලාව/වැඩසටහන	ඉලක්ක කණ්ඩායම	අභ්‍යාසලාභීන් ගණන
1	අධ්‍යාපන අමාත්‍යාංශයට බඳවාගත් නවක ක්‍රීඩා පුහුණුකරුවන් සඳහා ‘’රට හදන සෞභාග්‍යයේ දැක්ම’’ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව පළාත් මට්ටමින් ස්ථාපිත කරන ලද ක්‍රීඩා විද්‍යායතන යටතේ පවත්වන ‘‘ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව’’. (ZOOM තාක්ෂණය ඔස්සේ පාඨමාලාව ආරම්භ කරන ලදී.)	අධ්‍යාපන අමාත්‍යාංශයට බඳවාගත් නවක ක්‍රීඩා පුහුණුකරුවන් මධ්‍යම පළාත - දිගන - අභ්‍යාසලාභීන් 172 ඌව පළාත - ගිරාඳුරුකෝට්ටේ - අභ්‍යාසලාභීන් - 151 දකුණු පළාත - බද්දේගම - අභ්‍යාසලාභීන් 154 බස්නාහිර පළාත - මහරගම-පොල්වත්ත - අභ්‍යාසලාභීන් 161 ජාතික ක්‍රීඩා විද්‍යායතනය - 320 (සිංහල මාධ්‍යය - 160 දෙමළ මාධ්‍යය - 160)	958
2	උසස් පුහුණුකරු පාඨමාලාව (මලල ක්‍රීඩා)- NVQ 6	ක්‍රීඩා නිලධාරීන්, පුහුණුකරුවන්	24
3	ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව - NVQ 5	දිස්ත්‍රික් මට්ටමේ ක්‍රීඩකයින්, ක්‍රීඩා නිලධාරීන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසල්හි ශාරීරික අභ්‍යාස ගුරුවරුන්, ආරක්ෂක අංශ වල ශාරීරික අභ්‍යාස උපදේශකවරුන්	57
4	ශරීර සුවතා උපදේශක පුහුණු පාඨමාලාව -NVQ 4 (ZOOM තාක්ෂණය ඔස්සේ සහ ප්‍රායෝගික පුහුණු කටයුතු සමඟ පාඨමාලාව පැවැත්වේ)	ශාරීරික සුවතා උපදේශකවරුන්, ශාරීරික අභ්‍යාස ගුරුවරුන්, ස්වේච්ඡා උපදේශකවරුන්	177

5	පුහුණුකරු කුසලතා සංවර්ධන පාඨමාලාව - ජීවිත ආරක්ෂණ	ජීවිත ආරක්ෂණ පුහුණුකරුවන්	92
6	ලියාපදිංචි පුහුණුකරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන (කරාතේ, බොක්සිං, පිහිණුම්, බර ඉසිලීම, හොකී, කබඩි, ෂූඩෝ, දැල්පන්දු, රග්බි හා මලල ක්‍රීඩා සඳහා පවත්වා ඇත) - පාඨමාලා ගණන 10	කරාතේ, බොක්සිං, පිහිණුම්, බර ඉසිලීම, හොකී සහ කබඩි පුහුණුකරුවන්	223
7	පාසල් ළමුන්ගේ 13 වසරක අඛණ්ඩ අධ්‍යාපනය සහතික කිරීමේ පාඨමාලාව	13 වසරක අඛණ්ඩ ක්‍රීඩා අධ්‍යාපනය අපේක්ෂිත පාසල් සිසුන්	58
8	ක්‍රීඩා විද්‍යා සහතික පත්‍ර පාඨමාලා (මලල ක්‍රීඩා)	මලල ක්‍රීඩා පුහුණුකරුවන්	26
9	ක්‍රීඩා විද්‍යා සහතික පත්‍ර පාඨමාලා (බොක්සිං)	බොක්සිං පුහුණුකරුවන්	47
10	ක්‍රීඩා විද්‍යා සහතික පත්‍ර පාඨමාලා (ටයිකොන්ඩො)	ටයිකොන්ඩො පුහුණුකරුවන්	33
11	උෂව පළාත් ක්‍රීඩා විද්‍යායතනයේදී පැවැත්වූ දිස්ත්‍රික් ක්‍රීඩා පුහුණු වැඩසටහන	ක්‍රීඩා පුහුණුකරුවන්, ක්‍රීඩා නිලධාරීන්	40
12	දිස්ත්‍රික් ක්‍රීඩා පුහුණු වැඩසටහන - හම්බන්තොට	ක්‍රීඩා පුහුණුකරුවන්, ක්‍රීඩා නිලධාරීන්	80
13	දිස්ත්‍රික් ක්‍රීඩා පුහුණු වැඩසටහන - කුරුණෑගල	ක්‍රීඩා පුහුණුකරුවන්, ක්‍රීඩා නිලධාරීන්	65
14	දිස්ත්‍රික් ක්‍රීඩා පුහුණු වැඩසටහන - මාතලේ	ක්‍රීඩා පුහුණුකරුවන්, ක්‍රීඩා නිලධාරීන්	60
15	දිස්ත්‍රික් ක්‍රීඩා පුහුණු වැඩසටහන - පුත්තලම	ක්‍රීඩා පුහුණුකරුවන්, ක්‍රීඩා නිලධාරීන්	75
16	දිස්ත්‍රික් ක්‍රීඩා පුහුණු වැඩසටහන - මාතර	ක්‍රීඩා පුහුණුකරුවන්, ක්‍රීඩා නිලධාරීන්	70
17	දිස්ත්‍රික් ක්‍රීඩා පුහුණු වැඩසටහන - නුවර එළිය	ක්‍රීඩා පුහුණුකරුවන්, ක්‍රීඩා නිලධාරීන්	50
18	පුහුණුකරු කුසලතා සංවර්ධන පාඨමාලාව - කඹ ඇදීම	කඹ ඇදීමේ ක්‍රීඩා පුහුණුකරුවන්	38
19	ක්‍රීඩා ආබාධ කළමනාකරණ පාඨමාලාව	ක්‍රීඩා පුහුණුකරුවන්	15

2.2 අභියෝග

- 2021 වර්ෂය පුරා පැවැති covid-19 වසංගතය හේතුවෙන් පැවැති පළාත්/ දිස්ත්‍රික් සංචරණ සීමා, වරින්වර රට වසා තැබීම හා කාර්ය මණ්ඩලය සීමා කිරීම්, කාර්ය මණ්ඩලයේ විශාල පිරිසක් වරින්වර

කොවිඩ් වෛරසයට ගොදුරු වීම හේතු කොට ගෙන සැලසුම් කළ පුහුණු වැඩසටහන්/ ව්‍යාපෘති ගණනාවක් වැඩ නිම කිරීමට නොහැකි වීම

- සෞඛ්‍ය මාර්ගෝපදේශ වලට අනුව පිරිස් රැස් කිරීමේ අපහසුතාවය නිසා ක්‍රීඩා තරඟ බොහොමයක් පැවැත්වීම දිනෙන් දින කල් යෑම
- පවතින ජ්‍යෂ්ඨ, තෘතියික, ද්විතීක හා ප්‍රාථමික සේවක හිඟය හේතුවෙන් රාජකාරිය නිසි වේලාවට ඉටු කිරීමේ අපහසුතා මතු වීම

අනාගත අරමුණු

- ජාතික ක්‍රීඩා විද්‍යායතනය උපාධි පිරිනමන ආයතනයක් බවට පරිවර්තනය කිරීම.
- 2024 ඔලිම්පික් තරඟ ජයග්‍රහණ ඉලක්ක කරගනිමින් විදේශීය පුහුණුකරුවන්ගේ සේවය ඔලිම්පික් පදක්කමක් ලබාගත හැකි ක්‍රීඩා සඳහා ලබාදීමට අවශ්‍ය පහසුකම් සලසාදීම.
- ක්‍රීඩා පනත යටතේ ලියාපදිංචි වී ඇති සියලු ක්‍රීඩාවන්හි අදාළ පුහුණුකරුවන් ලියාපදිංචි කිරීම.
- අනෙකුත් පළාත් සඳහා ද ක්‍රීඩා විද්‍යායතන ආරම්භ කිරීම.
- අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රීඩා පාසල්හි සේවය කරන ක්‍රීඩා පුහුණුකරුවන්ගේ දැනුම, විශේෂ පුහුණු වැඩසටහන් පැවැත්වීම මඟින් යාවත්කාලීන කිරීම.
- සාම්ප්‍රදායික ක්‍රීඩා ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

.....

ආයතන ප්‍රධානී
නම :
තනතුර :
දිනය :

ජී. වී‍ල්. සපිත් ජයලාල්
අධ්‍යක්ෂ
ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය
100/7, බිඳහේ මාවත,
කොළඹ 07.

2022/02/23

03. පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

අමාත්‍යාංශයේ ගිණුම තුළ ඇතුළත් වේ.

04. පරිච්ඡේදය - කාර්යසාධක දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධක දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%)ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	**75% - 89%**	**50% - 74%**
පැවැත්වූ පුහුණු පාඨමාලා සංඛ්‍යාව		√	

05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්ක /අරමුණ	ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50%-74%	75-100%
04. පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනය සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරාම ඉගෙනීමේ අවස්ථාව සැලසීම.	සැමට ක්‍රීඩා අධ්‍යාපනය පහසුවෙන් ලබාදීම සඳහා පළාත් මට්ටමින් ක්‍රීඩා විද්‍යායතන ස්ථාපිත කිරීම.	2021 වර්ෂයේ ස්ථාපිත කරන ලද පළාත් ක්‍රීඩා විද්‍යායතන සහ ආරම්භ කරන පාඨමාලා ගණන		√	

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

සාධාරණ හා ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම කෙරෙහි යොමු වූ තිරසර සංවර්ධන අභිමතාර්ථය ක්‍රීඩා අධ්‍යාපනයට යොමුකරගෙන මෙරට ක්‍රීඩා ක්ෂේත්‍රයේ කියුතුවූවන්ට ක්‍රමවත් ක්‍රීඩා අධ්‍යාපනයක් ලබා දීමට ජාතික ක්‍රීඩා විද්‍යායතනය කැප වී සිටී. පවත්නා ප්‍රතිපාදන , මානව හා වෙනත් භෞතික සම්පත් සීමා මධ්‍යයේ වුවද මෙකී තිරසර සංවර්ධනයට ඉලක්ක සපුරා ගැනීමේ අභියෝගය ජය ගැනීමට ආයතනය කටයුතු කරමින් සිටී.

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/(අතිරික්ත) **
ජ්‍යෙෂ්ඨ	**07**	**01**	**-6**
තෘතියික	**11**	**04**	**-7**
ද්විතියික	**27**	**21**	**-6**
ප්‍රාථමික	**07**	**02**	**-5**

6.2 ** ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පවතින ඌණතාවය ආයතනය මඟින් පවත්වනු ලබන පාඨමාලා සහ පුහුණු වැඩසටහන් සඳහා බලපෑම් ඇති කරනු ලබන අතර වැඩි වශයෙන් බාහිර දේශකයන්ගේ සේවය ලබා ගැනීමට ආයතනයට සිදුවී ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබා ගත් දැනුම*
			දේශීය	විදේශීය		
රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය	02	දින 10	40,000.00		දේශීය	විධිමත් ලෙස ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම පිළිබඳ දැනුම ලබා ගැනීම
Olympic Solidarity Sports Administrators Course	03	දින 04	-		දේශීය	ක්‍රීඩා පරිපාලනය පිළිබඳ දැනුම ලබාගැනීම
Postgraduate Certificate in Applied Statistics	01	අවු. 01	140,000.00		දේශීය	ප්‍රායෝගිකව සංඛ්‍යාන විද්‍යාව භාවිතා කිරීම පිළිබඳව දැනුම ලබාගැනීම
සමාජ විද්‍යා පශ්චාත් උපාධි පාඨමාලාව	01	අවු. 01	118,000.00		දේශීය	සමාජ විද්‍යාව පිළිබඳ වැඩිදුර දැනුම ලබාගැනීම
ආයතනික නිලධාරීන්ගේ ආකල්ප සංවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් පැවැත්වූ වැඩමුළුව	32	දින 01	192,650.00		දේශීය	ආයතනික ඉදිරි කටයුතු පිළිබඳ සමාලෝචනය සහ නිලධාරීන්ගේ ආකල්ප සංවර්ධනය

*** ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.**

පුහුණු වැඩසටහන් තුළින් කාර්යය මණ්ඩලය ලබාගත් දැනුම ආයතනයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට වැදගත් වේ.

07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

(ගිණුම් සම්බන්ධ කටයුතු අමාත්‍යාංශය මඟින් සිදුකරනු ලබයි)

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය(අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	-	-	
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	-	-	
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-	-	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-	-	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-	-	
1.6	වෙනත්	-	-	-
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	-		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	-		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	-		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	-		

2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	-		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	-		
2.11	උප පත්‍රිකා ලේඛනය (GA –N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	-		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කිරීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වඩා වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මාදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	-		
4	**වාර්ෂිකව සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	-		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම	-		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	-		
5	විගණන විමසුම්	-		
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දීම	-		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2)DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	-		

6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	-		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	-		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම්කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්පොට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්පට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	-		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම			
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම.	-		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	-		

9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	-		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	-		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය ගිණුම් නිරවුල් කර තිබීම	-		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	-		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොයික්මවන පරිදි බැරකම් වලට එළඹීම	-		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	-		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	-		
12.3	වර්ෂයයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	-		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	-		

13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	-		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	-		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	-		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	-		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	-		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	-		
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	-		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	-		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		

17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	-		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	-		

අවසානයි.



ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

වාර්ෂික කාර්යසාධන වාර්තාව **2021**

01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

- ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි ජාත්‍යන්තර සම්මුතිය බලාත්මක කිරීම පිණිසද, උත්තේජක ද්‍රව්‍ය මර්දන නියෝජ්‍යායතනයක් ශ්‍රී ලංකාව තුළ පිහිටුවීම මඟින් එකී සම්මුතිය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන සැලැස්වීම පිණිසද, ඉහත කී සම්මුති රාමුව තුළ ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහිවීම සඳහා අදාළ දේශීය නෛතික යාන්ත්‍රණයක් නිශ්චිතවම සඳහන් කිරීම සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිසද 2013 අංක 33 දරණ ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත 2013 සැප්තැම්බර් 09 වැනි දින කෙටුම්පත් කරන ලදි.
- 2013 අංක 33 දරණ ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ තුන්වැනි කොටස මඟින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය පිහිටුවීම පිළිබඳ විධිවිධාන සලස්වා ඇත.
- ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය, ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය හා කලාපීය තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සහයෝගීව කටයුතු කරනු ලබයි.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

“නිවැරදි හා සාධාරණ ජයග්‍රහණයක් උදෙසා තහනම් ද්‍රව්‍ය වලින් තොර ශ්‍රී ලාංකීය ක්‍රීඩා ජවයක්”

මෙහෙවර

“ලෝක මත්ද්‍රව්‍ය නිවාරණ පනත සහ එහි රෙගුලාසි වලට අනුකූල වන ආකාරයට 2013 අංක 33 දරණ ක්‍රීඩා වල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත ක්‍රියාත්මක කිරීම”

අරමුණු

2013 අංක 33 දරණ ක්‍රීඩා වල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 11 වැනි වගන්තිය ප්‍රකාරව:

නියෝජ්‍යායතනයේ පරමාර්ථ විය යුත්තේ:

(අ) ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීම පිටුදැකීම සඳහා අවශ්‍ය වන යම් පියවර ගැනීම.

(ආ) ක්‍රීඩාවලට සම්බන්ධ උත්තේජක ගැනීම පිළිබඳ ක්ෂේත්‍ර හා අදාළ පර්යේෂණ සහ නියෝජ්‍යායතනය හා සමාන කර්තව්‍යන් ඉටුකරනු ලබන වෙනත් අන්තර්ජාතික සංවිධාන අතර අන්‍යෝන්‍ය පරීක්ෂණ ප්‍රවර්ධනය කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ප්‍රධාන ශ්‍රීතික කාර්යයන් ලෙස,

1. තහනම් උත්තේජක පරීක්ෂණ සිදු කිරීම

   ක්‍රීඩාවේදී ක්‍රීඩකයන්ගේ මූත්‍රා හෝ රුධිර සාම්පල යොදා ගනිමින් තහනම් උත්තේජක පරීක්ෂණ සිදු කෙරේ. එය තරඟාවලිය තුළදී හා තරඟ වලින් පිටදී යන දෙයාකාරයෙන්ම සිදු කරනු ලබයි. මෙලෙස ලබාගන්නා සාම්පල ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය මඟින් නිර්දේශිත විදේශීය පර්යේෂණාගාරවලට යොමු කර ප්‍රතිඵල ලබා ගනී. මෙහිදී තහනම් උත්තේජක ගත් බව සනාථ වුවහොත් අදාළ නීතිමය පියවර ගෙන දඬුවම් ලබාදීම ට කටයුතු සිදු කිරීම.

2. දැනුවත් කිරීමේ වැඩසටහන් හා වැඩමුළු පැවැත්වීම

   ක්‍රීඩාවේදී මෙම තහනම් උත්තේජක පිටුදැකීම තවමත් ශ්‍රී ලංකාවට නව මාතෘකාවකි. එබැවින් ක්‍රීඩාව හා උනන්දුවක් දක්වන ක්‍රීඩක ක්‍රීඩිකාවන්, පුහුණුකරුවන්, පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දෙමව්පියන් ඇතුළු සියලුම පාර්ශවයන් හට දැනුවත් කිරීම් සිදු කිරීම.

3. තහනම් උත්තේජක පිළිබඳ පර්යේෂණ සිදු කිරීම

   ශ්‍රී ලංකාව වැනි පෙරදිග රටවල තවමත් දේශීය වෛද්‍ය ක්‍රමවේද, ආයුර්වේද වෛද්‍ය ක්‍රම, දේශීය ආහාරපාන භාවිතය දක්නට ලැබේ. මෙහිදී මෙම ඖෂධ හා ආහාරපාන වල එම සංඝටක අඩංගු ද කියා සොයා බලා ඒවාහි සත්‍යතාවය පරීක්ෂා කර පර්යේෂණ ලිපි සකස් කර ජාත්‍යන්තරය සමඟ එම දැනුම හුවමාරු කරගනිමින් කටයුතු සිදු කිරීම.

1.4 සංවිධාන සටහන


සභාපති
අධ්‍යක්ෂ මණ්ඩලය
අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ (අධ්‍යාපන හා පරීක්ෂණ)
අධ්‍යක්ෂ(ශ්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීම)
සහකාර අධ්‍යක්ෂ
නීති නිලධාරි/මාණ්ඩලික ලේකම්
පරිපාලන නිලධාරි
ගණකාධිකාරි
තොරතුරු තාක්ෂණ නිලධාරි
සංවර්ධන නිලධාරි
පර්යේෂණ නිලධාරි
සංවර්ධන නිලධාරි
කළමණාකරණ සහකාර
සහකාර අධ්‍යක්ෂ
කළමණාකරණ සහකාර
භාෂා පරිවර්තක
සංවර්ධන නිලධාරි (02)
තාක්ෂණ සහකාර (01)
කළමණාකරණ සහකාර (02)
රියදුරු (04)
කාර්යාල සහායක (03)
HM
MM 1.1
AR-1
JM
MA-4
MA-3
MA1-1
MA 2-1
PL-3
PL-1

1.5 කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල - නැත

1.6 අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/පළාත් සභාව යටතේ පවතින ආයතන - නැත

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්) - නැත

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ

පරීක්ෂණ අංශය

පිරිසිදු ක්‍රීඩාවක් බිහිකිරීමත්, පිරිසිදු ක්‍රීඩක ක්‍රීඩිකාවන් ආරක්ෂා කිරීමත් අරමුණු කරගනිමින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය මඟින් 2021 වසර තුළ සිදුකළ තහනම් උත්තේජක පරීක්ෂණ පිළිබඳ තොරතුරු පහත සඳහන් වේ .

ක්‍රීඩා අනුව තහනම් උත්තේජක පරීක්ෂණ පැවැත්වීම - 2021

<u>මානව තහනම් උත්තේජක පරීක්ෂණ මූත්‍රා</u>

අංකය	ක්‍රීඩාව	තහනම් උත්තේජක පරීක්ෂණ ගණන	තහනම් උත්තේජක ලබාගත් බවට සනාථ වූ අවස්ථා
01	රග්බි	04	-
02	මලල ක්‍රීඩා	73	01
03	පාපැදි	13	-
04	බර ඉසිලීම	39	-
05	ක්‍රිකට්	21	-
06	බැඩ්මින්ටන්	01	-
07	සවි එසවීම	13	-
08	ජූඩෝ	01	-
09	වෙඩි තැබීම	01	-
10	පැරා දුණු විදීම	01	-
11	පැරා ඔරු පැදීම	01	-
12	පැරා මලලක්‍රීඩා	08	-
13	පැරා ටෙනිස්	01	-
	එකතුව	**177**	**01**

සත්ත්ව තහනම් උත්තේජක පරීක්ෂණ

අංකය	**ක්‍රීඩාව**	**තහනම් උත්තේජක පරීක්ෂණ ගණන**	**තහනම් උත්තේජක ලබාගත් බවට සනාථ වූ අවස්ථා**
1	තුරඟ තරඟ	12	8



අධ්‍යාපන අංශය

දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම - 2021

අපගේ ජීවිතයට ක්‍රීඩාව මෙතරම් සමීප වන්නේ කායික මානසික නිරෝගීකම වඩා, ආධ්‍යාත්මික ශික්ෂණයෙන්ද, මනා පෞරුෂයෙන්ද හෙබි පරිපූර්ණ මිනිසකු බිහි කිරීමට එමගින් ලැබෙන මහඟු දායකත්වය නිසාය. ශතවර්ෂ 25 කටත් වඩා ඈතට දිවෙන අභිමානවත්, ප්‍රෞඪ ඉතිහාසයක් හිමි ජාත්‍යන්තර ක්‍රීඩාව වර්තමානය වන විට අතිශය දියුණු හා ඉතා සංකීර්ණ තත්ත්වයකට පත්ව තිබේ. එය කෙමෙන්, කෙමෙන් නවීකරණයටත් , වාණිජකරණයටත් ලක් වන විට එහි ප්‍රමුඛ තේමාවවක් ලෙස දිගු කාලීනව පැවති "ක්‍රීඩාශීලි සහභාගීත්වය" නැමැති සංකල්පයේ වැදගත්කමද ටිකෙන් ටික යටපත් වී, "හුදු ජයග්‍රහණයම" හඹා යෑමේ නියත ඉලක්කයක් හා ඒකායන අභිලාශයක් නූතන ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ දැකගත හැකිය. වර්තමාන ක්‍රීඩාව මෙතරම් සංවිධානාත්මක වී, දියුණු වී හා වර්ධනය වී ඇත්තේත්, ඊට ඉහළම තරඟකාරීත්වයක් ආරෝපණය වී ඇත්තේත් එම ක්ෂේත්‍රය තුළ දැන් පවතින මේ දැඩි ජයග්‍රහණ පිපාසය නිසාවෙනි.

ක්‍රීඩාව කෙමෙන් වැඩී, වර්ධනය වී, එහි තරඟකාරී බවද වැඩි වී අති නවීන හා දියුණු තාක්ෂණික උපක්‍රම හා මෙවලම් නූතනයේදී ඊට අනුබද්ධ වන විට, ඒවා ක්‍රමවත්ව මෙහෙයවීමේ, හැසිරවීමේ හා පාලනය කිරීමේ පොදු නීතිරීති පද්ධතියක අවශ්‍යතාව හා වැදගත්කම දැඩිව ඉස්මතු වෙයි. ක්‍රීඩාවේදී තහනම් ද්‍රව්‍ය හා තහනම් ක්‍රම භාවිතා කිරීම පාලනය කිරීමට අදාල නීතිරීති දෙස්-විදෙස් ක්‍රීඩා ක්ෂේත්‍රයන් තුළට ඇතුලත් වී ඇත්තේ මෙහි ප්‍රතිඵලයක් වශයෙනි.

තහනම් ද්‍රව්‍ය හා තහනම් ක්‍රම භාවිතයේ ඇති අතිශය භයානක ප්‍රතිඵල වනුයේ එමඟින් අනිදක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ මුලුමහත් ක්‍රීඩා දිවියම අකලට මිලින වී යෑමත්, ඒ තුළ ඔවුන්ගෙන් ලැබීමට තිබෙන ජාත්‍යන්තර මට්ටමේ වටිනා ක්‍රීඩා ජයග්‍රහණ නිරපරාදේ රටට අහිමි වීමත්, ජගත් කෙළිබිමේදී ප්‍රසිද්ධියට පත්වන මෙවැනි ආන්දෝලනාත්මක සිදුවීම් නිසා මුලුමහත් රටටත්, ජාතියටත් බලවත් අවමානයක් හා අපකීර්තියක් සිදුවීමත්ය. අනෙක් අතට, වත්මන් ක්‍රීඩාවෙහි නියැලෙන රටේ ජීවනාලිය බදු ජාතියේ මතු පරපුරෙහි ශාරීරික හා මානසික නිරෝගීතාවය හා යෝග්‍යතාවය පිරිහී ගොස් රෝගී සමාජයක් අනාගතයේදී බිහිවීමට ඇති ඉඩකඩ වැඩිවීම ද දිගුකාලීන වශයෙන් මෙහි පවත්නා තවත් ගැටලුවකි. එබැවින් තහනම් උත්තේජක භාවිතයෙන් වැළකී සිටීමේ වැදගත්කම අවධාරණය කරමින් මෙරට ක්‍රීඩක පරපුර සහ ඔවුන්ගේ සියලු අනුගාමික පිරිස් දැනුවත් කිරීම අධ්‍යාපන අංශයේ මූලික පරමාර්ථයයි.

ඒ අනුව, 2021 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා සිදුකළ තහනම් උත්තේජක පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු පිළිබඳව විස්තර පහත පරිදි වේ. ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහ ක්‍රීඩා ක්ෂේත්‍රෙය් නියැලෙන්නන් අරමුණු කරගෙන මෙම වැඩමුළු දීපව්‍යාප්තව ක්‍රියාත්මක කරන ලදී.

දිනය	ස්ථානය	කා සඳහාද	සහභාගීත්වය
2021-01-26	ක්‍රීඩා වෛද්‍ය ආයතනය- ටොරින්ටන්	කරාතේ ජාතික කණ්ඩායම සඳහා	10
2021-01-26	හැව්ලොක් ක්‍රීඩා පිටිය - ටොරින්ටන්	ජාතික නෙට්බෝල් කණ්ඩායම සඳහා	26
2021-01-27	හැව්ලොක් ක්‍රීඩා පිටිය - ටොරින්ටන්	ජාතික නෙට්බෝල් කණ්ඩායම සඳහා	26
2021-01-28	ජාතික ක්‍රීඩා සභා ශ්‍රවණාගාරය - ටොරින්ටන්	පැරා මලල ක්‍රීඩා කණ්ඩායම සඳහා	12
2021-01-29	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාව - SLADA ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය	පැසිපන්දු ජාතික කණ්ඩායම සඳහා	12
2021-02-11	ජාතික තරුණ සේවා සභාව - හෙයියන්තුඩුව	කබඩි ජාතික සංචිතය සඳහා	15
2021-02-24	ලංකා රග්බි සහ පාපන්දු සමාජය (CR & FC) - ටොරින්ටන්	රග්බි (පිරිමි) කණ්ඩායම සඳහා	33
2021-02-25	ප්‍රධාන ශ්‍රවණාගාරය ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය	බැට්මින්ටන් ජාතික සංචිතය සඳහා	22
2021-03-06	ප්‍රධාන ශ්‍රවණාගාරය මහවැලි ව්‍යාපෘති කාර්යාලය (මහඔය)	මහවැලි ක්‍රීඩා කලාපයේ සියලුම ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා	61
2021-03-07	ප්‍රධාන ශ්‍රවණාගාරය මහවැලි ව්‍යාපෘති කාර්යාලය (රිදීමාලියද්ද)	මහවැලි ක්‍රීඩා කලාපයේ සියලුම ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා	31
2021-03-12	ශ්‍රී ලංකා පදනම් ආයතනය - ටොරින්ටන්	යෝගාභ්‍යාස කථිකාචාර්යවරුන් සඳහා	57
2021-03-14	ජාතික ක්‍රීඩා විද්‍යායතනය - ටොරින්ටන්	බැට්මින්ටන් ජාතික සංචිතය සඳහා	48
2021-03-16	ලංකා රග්බි සහ පාපන්දු සමාජය (CR & FC) - ටොරින්ටන්	රග්බි (කාන්තා) කණ්ඩායම සඳහා	16
2021-06-14 2021-06-16 2021-06-21 2021-06-25	මාර්ගගත දේශණ	වයඹ විශ්වවිද්‍යාලයේ ආහාර හා පෝෂණවේදය පිළිබඳව පාඨමාලා හදාරන විශ්වවිද්‍යාල සිසුන් සඳහා	5
2021-07-29	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාව - ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය	තහනම් උත්තේජක පාලන නිලධාරී (DCO) වශයෙන් කටයුතු කරන වෛද්‍ය නිලධාරීන් සඳහා	8
2021-07-31	ප්‍රධාන ශ්‍රවණාගාරය ජාතික මලල ක්‍රීඩා සම්මේලනය - කොළඹ	අවුරුදු 20 න් පහල මලල ක්‍රීඩා ජාතික සංචිතය සඳහා	15
2021-08-13	ප්‍රධාන ශ්‍රවණාගාරය ඌව පළාත් ක්‍රීඩා ඇකඩමිය, මහවැලි ක්‍රීඩාංගණය, ගිරාඋරුකෝට්ටෙ	ශාරීරික පුහුණු උපදේශකවරුන් (ඌව පළාත් පාසල් ගුරුවරුන්)සඳහා	20
2021-09-10 2021-09-11	මාර්ගගත දේශණ	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා විද්‍යාව පිළිබඳව පාඨමාලා හදාරන විශ්වවිද්‍යාල සිසුන් සඳහා	371
2021-09-13	සිනමන් ලේක්සයිඩ් හෝටලය - කොළඹ	ශ්‍රී ලංකා ක්‍රිකට් ජාතික සංචිතය(පිරිමි) සඳහා	19
2021-09-18	මාර්ගගත දේශණ	ලයිසියම් ජාත්‍යන්තර පාසලේ දීප ව්‍යාප්ත ක්‍රීඩා පුහුණුකරුවන් සඳහා	120

2021-09-23	මාර්ගගත දේශණ	ශ්‍රී ලංකා ජිම්නාස්ටික් සංගමයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්, පුහුණුකරුවන් සහ අනෙකුත් නිලධාරීන් සඳහා	21
2021-09-28	සිනමන් ලේක්සයිඩ් හෝටලය - කොළඹ	19 න් පහල ශ්‍රී ලංකා ක්‍රිකට් ජාතික සංචිතය සඳහා	26
2021-10-26	මාර්ගගත දේශණ	ජාතික බීච් වොලිබෝල් කණ්ඩායම සඳහා	25
2021-10-29	ක්‍රීඩා හෝටලය - සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය	රග්බි (කාන්තා) ජාතික කණ්ඩායමසඳහා	28
2021-11-05	ක්‍රීඩා හෝටලය - සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය	රග්බි (පිරිමි) ජාතික කණ්ඩායම සඳහා	20
2021-11-13	සිනමන් ලේක්සයිඩ් හෝටලය - කොළඹ	ශ්‍රී ලංකා ක්‍රිකට් ජාතික සංචිතය(කාන්තා) සඳහා	25
2021.11.22 to 2021.11.26	සුගතදාස ජාතික ගෘහස්ත ක්‍රීඩාංගනය - සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය	57 වැනි වරටත් පැවැති ශ්‍රී ලංකා යුධ හමුදා අන්තර් රෙජිමේන්තු මලල ක්‍රීඩා ශූරතාවලියට සහභාගි වූ සියලුම ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා	400
2021-12-07	ප්‍රධාන ශ්‍රවණාගාරය - SLADA ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය	ශ්‍රී ලංකා මල්ලවපොර සම්මේලනයේ සියලුම ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා	83
2021-12-09	ප්‍රධාන ශ්‍රවණාගාරය - ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය	ශ්‍රී ලංකා සවි එසවීමේ සම්මේලනයේ සියලුම ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා	15
2021-12-09	මාර්ගගත දේශණ	දීප ව්‍යාප්ත කබඩි පුහුණුකරුවන් සඳහා	30

දැනුවත් කිරීමේ වැඩමුළු වල ඉලක්කයන් සහ ප්‍රගතිය - 2021

	ඉලක්කය		සත්‍ය අගය	
මාසය	වැඩමුළු ප්‍රමාණය	සහභාගීත්වය	වැඩමුළු ප්‍රමාණය	සහභාගීත්වය
ජනවාරි	2	96	5	86
පෙබරවාරි	4	150	3	70
මාර්තු	2	115	5	213
අප්‍රේල්	0	0	0	0
මැයි	3	40	0	0
ජූනි	2	120	1	5
ජූලි	3	26	2	23
අගෝස්තු	6	140	1	20
සැප්තැම්බර්	4	230	5	557
ඔක්තෝම්බර්	5	275	2	53
නොවැම්බර්	3	75	2	45
දෙසැම්බර්	2	97	3	128
එකතුව	**36**	**1364**	**29**	**1072**

බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම අංශය

පවත්වන ලද පුහුණු වැඩමුළු වල ප්‍රගතිය - 2021

පිරිසිදු ක්‍රීඩා පරිසරයක් ස්ථාපිත කරලීමට සඳහා තහනම් උත්තේජක ගෙන්වීම හා බෙදාහැරීම පාලනය කිරීම අත්‍යාවශ්‍ය වූවකි. ඒ සඳහා මූලිකව පොලිස් නිලධාරීන් ඖෂධවේදීන් ඖෂධශාලා හිමිකරුවන් දැනුවත් කරලීම ආරම්භ කරන ලදී.

පොලිස් නිලධාරීන් උදෙසා විධිමත් පරිදි අංක 33 දරණ ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත පිළිබඳ දැනුවත් කිරීම අත්‍යාවශ්‍ය වූවකි. කිසියම් පැමිණිල්ලක් ලද විට ඒ සඳහා විධිමත් විමර්ශණයක් සිදු කිරීමේදී පොලිස් සහය අත්‍යාවශ්‍ය වීම ඊට ප්‍රධානතම හේතුවයි. ක්‍රීඩකයාට අගතියක්, අපහසුතාවයක් ඇති නොවන පරිදි එකී කාර්යය ප්‍රමිතිගතව පැවැත්වීම හා. කෙසේ හෝ පොලිස් සහය තුළින් කාර්යක්ෂම විමර්ශණ ක්‍රියාවලියක් සහ බුද්ධි තොරතුරු ඒකකයක් ස්ථාපිත කර ගැනීම මෙහි තවත් අරමුණකි.

තහනම් උත්තේජක ක්‍රීඩකයන් වෙත ගලා යන ප්‍රධාන මාර්ගයක් ලෙස ඔසුසල් හඳුනාගත හැකිය එබැවින් ඔවුන්ට තහනම් උත්තේජක පිළිබඳ විධිමත් දැනුමක් ලබා දීම ද කාලීන අවශ්‍යතාවයකි. ඒ සඳහා ඖෂධවේදීන් සහ ඔසුසල් හිමියන් පුහුණු කිරීම සිදු කරනු ලබයි.

අනු අංකය	දිනය	වැඩමුළුව
01	2021.10.14	පොලිස් නිලධාරීන් සඳහා තහනම් උත්තේජක පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම පාදක කොටගෙන පොලිස් ක්ෂේත්‍ර බලකා මුලස්ථානයේ පොලිස් ක්‍රීඩා කොට්ඨාසය භාර අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී R.M.P.N. රත්නායක මහතා සමඟ සම්බන්ධව පොලිස් ක්‍රීඩා කොට්ඨාසය භාරයේ ඇති ක්‍රීඩා කණ්ඩායම් 30 සඳහා පුහුණු වැඩසටහන් (කණ්ඩායම් වශයෙන්) පැවැත්වීමට අවස්ථාව ලබා ගන්නා ලදී .
02	2021.11.03	ඖෂධවේදීන් හා ඔසුසල් හිමිකරුවන්ගේ සංගම් හා සම්බන්ධ වෙමින් සෞඛ්‍යමත් ප්‍රජාවක් තුළින් පිරිසිදු ක්‍රීඩාවක් ගොඩනැගීමේ අරමුණ උදෙසා, සියලු ලියාපදිංචි ඖෂධවේදීන් හා ඔසුසල් හිමිකරුවන් දැනුවත් කිරීමේ දීප ව්‍යාප්ත වැඩසටහනෙහි මූලික අදියරේ වැඩමුළුවක් 2021.11.03 වන දින ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේදී පැවැත්විණි. ඒ සඳහා සමස්ථ ලංකා ඖෂධ වෙළඳසැල් හිමියන්ගේ සංගමයේ සහ ලංකා ඖෂධ වෙළඳ සංගමයේ නියෝජිතයින් 06 දෙනෙකු සහභාගී විය.

03	2021.11.22 - 26.11.2021	2021-11-22 දින සිට 2021-11-26 දින දක්වා (පුරා දින 5 ක්) සුගතදාස ක්‍රීඩාංගනයේ පැවති 6 වන යුද්ධ හමුදා සහය දිවීමේ තරගාවලිය සහ 57 වන යුද්ධ හමුදා මලල ක්‍රීඩා තරඟාවලියට සමගාමීව බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම අංශය (E&I) හා අධ්‍යාපන හා පරීක්ෂණ අංශයේ (E&T) මූලිකත්වයෙන්, තහනම් උත්තේජක හා තහනම් ක්‍රම භාවිතයන් පිළිබඳ විශේෂ පැමිණිලි ලබාගැනීමේ සහ දැනුවත් කිරීමේ කුටියක් (Outreach Booth) ස්ථාපිත කරන ලදී. එහිදී ඒ සඳහා සහභාගී වූ ක්‍රීඩාවෙහි ඇල්මැති පාර්ශවයන් (ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඇතුළුව) විශාල ප්‍රමාණයක් දැනුවත් කිරීමට කටයුතු කරන ලදී.
04	2021.12.14	ක්‍රීඩකයින්ගේ තහනම් උත්තේජක පිළිබඳ විමර්ශණ හා පරීක්ෂණ සඳහා ශ්‍රී ලංකා පොලීසියේ සහයෝගය ලබා ගැනීම පිණිස සහ 2013 අංක 33 දරණ ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ගැනීමට එරෙහි සම්මුති පනත පිළිබඳව පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ අරමුණින් පොලිස් ක්‍රීඩා කොට්ඨාසයේ නිලධාරීන් හා ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් බම්බලපිටිය පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානයේදී දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත්විය.

2021.10.14 වන දින පැවති පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානයේ පොලිස් ක්‍රීඩා කොට්ඨාශය භාර අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ආර්.එම්.පී.එන්. රත්නායක මහතා සමඟ පැවති සාකච්ඡාව





2021.11.03 වන දින පැවති ලියාපදිංචි ඖෂධවේදීන් හා ඔසුසල් හිමිකරුවන් දැනුවත් කිරීමේ දීපව්‍යාප්ත වැඩසටහන





2021.12.14 වන දින පැවති පොලිස් ක්‍රීඩා කොට්ඨාශයේ නිලධාරීන් හා ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් බම්බලපිටිය පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානයේදී දැනුවත් කිරීමේ වැඩමුළුව





6 වන යුද්ධ හමුදා සහය දිවීමේ තරගාවලිය සහ 57 වන යුද්ධ හමුදා මළල ක්‍රීඩා තරඟාවලියට සමගාමීව තහනම් උත්තේජක හා තහනම් ක්‍රම භාවිතයන් පිළිබඳ විශේෂ පැමිණිලි ලබාගැනීමේ සහ දැනුවත් කිරීමේ අරමුණින් දැනුවත් කිරීමේ කුටියක් ස්ථාපිත කිරීම.





විශේෂ පැමිණිලි ඒකකයක් ස්ථාපිත කිරීම.

2013 අංක 33 දරණ ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම් අංශයේ විශේෂ පැමිණිලි ඒකකය 2021 ඔක්තොම්බර් මස දී ස්ථාපිත කරන ලදී.

ඒ අනුව පැමිණිලි භාරගැනීමේ ස්වරූපය පහත පරිදි වේ.

- මාර්ගගතව

  සෑම ක්‍රීඩා සමාජයක් සඳහාම වට්ස් ඇප් මගින් පැමිණිලි පත්‍රිකාව යොමු කෙරේ.

- භෞතිකව

  තරඟාවලිය අතරතුර පැමිණිලි පෙට්ටියක් භාවිතයෙන්.

- විශේෂ පැමිණිලි ඒකකයෙහි විමර්ශණ කටයුතු සිදු කිරීමේදී පිටතින් ලැබෙන ඇමතුම් වලට සම්බන්ධ වීම හා එම ඇමතුම් සඳහා ගුණාත්මක සේවාවක් ලබා දීම සඳහා එම කටයුත්ත සාර්ථකව සිදු කිරීම උදෙසා එම කාර්යය වෙනුවෙන්ම 070-4220422 යන දුරකථන අංකය අප අංශය වෙත ලබාගෙන ඇත.

විශේෂ විමර්ශණ ඒකකය සඳහා ලැබී ඇති පැමිණිළි පිළිබඳ විස්තර

අනු අංකය	දිනය	පැමිණිල්ල	දැනට ගෙන ඇති ක්‍රියාමාර්ගය
01	2021.12.11	ක්‍රීඩකයින් දෙදෙනෙකු 2021.12.11 වන දින තරඟාවලිය ආරම්භ වීමට පෙර තහනම් උත්තේජක යැයි සැක කල හැකි එන්නත් ශරීරගත කරගත් බව.	මෙම ක්‍රීඩකයින් Out Of Competition Testing සඳහා යොමු කරන ලදී.
02	2021.12.16	තහනම් උත්තේජක භාවිත කළ බවට චෝදනා ලැබ සිටින මලල ක්‍රීඩකයින් දෙදෙනෙකු රජයේ පාසලක පාසල් ක්‍රීඩා පුහුණුකරුවන් ලෙස කටයුතු කරන බව.	ඉදිරි විමර්ශණ සඳහා මෙම ක්‍රීඩකයින් දෙදෙනා හට 2022.01.05 වන දින පැමිණෙන ලෙස දන්වමින් ලිපි යොමු කර ඇත.



2021 ප්‍රගතිය

පර්යේෂණ අංශය

පර්යේෂණ ඒකකය මගින් සිදුකරන ලද පර්යේෂණයක සම්පූර්ණ පර්යේෂණ වාර්තාවක් අන්තර්ජාතික ජර්නලයක් වන "Journal of Exercise and Nutrition" යන සඟරාවේ ප්‍රකාශයට පත් කරන ලදී. එම වාර්තාව ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ගේ ආහාර අතිරේක භාවිතය, ඒවා පිළිබඳ දැනුම සහ ආහාර අතිරේක භාවිතයේ පුරුදු පිළිබඳ දත්ත ඇතුලත් වේ.

මෙම වසරේ ආරම්භ කරන ලද අධ්‍යයනය දෙකක් වන ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය මගින් සිදුකරනු ලබන ''තහනම් උත්තේජක පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන ඇගයීමට ලක් කිරීමේ අධ්‍යයනය'' සහ ''තහනම් උත්තේජක විරෝධී නීති උල්ලංඝනය කිරීම් පිළිබඳ අධ්‍යයනය'' යන අධ්‍යයන දෙකම අවසන් කරන ලදී.

තව ද පර්යේෂණ අංශය සිදු කල පර්යේෂණ සොයා ගැනීම් ක්‍රීඩා ප්‍රජාව අතර ක්‍රීඩාවට සම්බන්ධ විශ්ව විද්‍යාල ප්‍රජාව අතර ක්‍රීඩාව හා සම්බන්ධව කටයුතු කරන රාජ්‍ය ආයතන අතර බෙදා හැරීමට විවිධාකාර ලෙස කටයුතු කර ඇත.

ශ්‍රී ලංකා උත්තේජ මර්දන නියෝජ්‍යායතනයේ නව පර්යේෂණාගාරය 2021 හි අප්‍රෙල් මස 09 වන දින ගරු නාමල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කරන ලදී. මෙම පර්යේෂණාගාරය නවීන තාක්ෂණික උපකරණ වලින් සමන්විත වේ. විශේෂයෙන්ම මෙහි ඇති LC / MS / MS උපකරණය මගින් පර්යේෂණ දත්ත ඉතා නිවැරදිව ලබා ගත හැක.





පර්යේෂණාගාරය 2021 හි අප්‍රෙල් මස 09 වන දින තරුණ හා ක්‍රීඩා අමාත්‍ය ගරු නාමල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කිරීම.

තොරතුරු තාක්ෂණ අංශය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය නිරන්තරයෙන් ලෝක තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනය (WADA) හා ලෝකයේ අනෙකුත් රටවල් සමග තොරතුරු සන්නිවේදනය සිදු කරන ආයතනයකි . ඒ සඳහා අවශ්‍ය කාර්යයන් සිදුකිරීමට එම ආයතන තුළ පවතින තාක්ෂණයට අප ආයතනය සම්බන්ධ කිරීම තුළින් තහනම් උත්තේජක තොරතුරු සන්නිවේදනය කිරීම ,තොරතුරු තාක්ෂණ අංශයේ ප්‍රධාන අරමුණු අතරින් එකකි.

එහිදී Anti-Doping Administrative System (ADAMS) ලෙස හඳුන්වනු ලබන WADA හි තොරතුරු පද්ධතියට අප ආයතනයේ කාලීන තොරතුරු ලබාදීම, ක්‍රීඩකයින් ලියාපදිංචි කිරීම, ගිණුම් සෑදීම, whereabouts ගිණුම් සෑදීම සහ ඒ සම්බන්ධ කාර්යයන්, ක්‍රීඩකයින් පුහුණු කිරීම හා සහය ලබාදීම, Anti-Doping E-Learning (ADeL) පද්ධතිය ක්‍රීඩකයින්ට හඳුන්වාදීම, ක්‍රීඩකයින් ලියාපදිංචි කිරීම හා එහි ඇතුළත් පාඩම් මාලා අප ආයතනයේ අධ්‍යාපන අංශය සඳහා සකස් කර දීම මෙම අංශය මගින් සිදුවේ .

එමෙන්ම ආයතනය තුළ එදිනෙදා පවතින සේවාවන් අඛණ්ඩව සිදුකරගෙන යාම සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබාදීම ද ප්‍රධාන අරමුණක් වේ. අප ආයතනයේ තොරතුරු ,විශේෂ පුවත් මෙන්ම විෂය දැනුම Facebook, Twitter, You Tube යන සමාජ මාධ්‍ය ජාලා තුළින් ද ,අප අංශය විසින්ම නිර්මාණය කරනු ලැබූ වෙබ් අඩවිය තුළින් ද සමාජයට ලබාදීමට කටයුතු කරන ලදී. ආයතනික ප්‍රගතිය පිළිබඳ තොරතුරු කාලානුකූලව විවිධ අනුබද්ධ ආයතනවලට ඉදිරිපත් කිරීමේදී එම තොරතුරු ආයතනය තුළ සෑම අශංයකින්ම ලබාගෙන මාසික, කාර්තුමය හා වාර්ෂික වාර්තා ලෙස ඉදිරිපත් කිරීමද මෙම අංශය මගින් සිදුවේ.

සෑම වර්ෂයකදී ම නිකුත් වන නව තහනම් උත්තේජක ලැයිස්තුවට අනුකූලව අප ආයතනයේ තොරතුරු තාක්ෂණික අංශය විසින්ම Android ස්මාර්ට් දුරකථන සඳහා නිර්මාණය කරනු ලැබූ “Drug Reference App” හෙවත් “DRapp” හි ඖෂධ දත්ත පද්ධති (Database) යාවත්කාලීන කිරීමත්, ආයතනයෙහි විශේෂ අවස්ථාවලදී අවශ්‍ය ග්‍රැෆික් නිර්මාණ කටයුතු සිදුනිරීමත් මෙම අංශය විසින්ම සිදුකරනු ලබයි. මෙම වර්ෂයේදී සිදුකරන ලද

නිර්මාණවල එකතුවක් පහතින් දක්වා ඇත. පොත් සහ පොත් පිටකවර නිර්මාණ, සමාජමාධ්‍ය ජාලා පෝස්ට්, අත්පත්‍රිකා, පෝස්ටර්, බැනර්, වීඩියෝ වැනි නිර්මාණ එහි ඇතුළත් වේ.

ආයතනය මගින් නඩත්තු කරනු ලබන Web server ආරක්ෂාව, දත්ත පද්ධති කළමනාකරණය, මෘදුකාංග කළමනාකරණය ඇතුළු තාක්ෂණික සේවාවන් සැපයීම මෙන්ම නව මෘදුකාංග ස්ථාපනය කිරීම, මෘදුකාංග දෝෂ නිවැරදි කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම ද මෙම අංශයේ වගකීමකි.

මෙම වර්ෂය තුළදී නව වෙබ් ව්‍යාපෘති දෙකක් සිදු කරනු ලැබූ අතර එම තොරතුරු පහත පරිදි වේ.

1. ශ්‍රී ලංකාවේ සියලුම ක්‍රීඩා වෛද්‍ය අංශ, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සමඟ මාර්ගගතව සම්බන්ධ කරගැනීම සඳහා එම අංශවලට අනුයුක්ත ක්‍රීඩා වෛද්‍යවරුන්ගේ තොරතුරු පද්ධතියක් ඇතුළත් වෙබ් අඩවියක් නිර්මාණය කිරීම .
එය VCLC (Video Conferencing and Live Chat Awareness Programs and Professional Meetings on Anti-Doping) ලෙස හඳින්වේ ”https://slantidoping.org/joinus/” මඟින් එම වෙබ් අඩවිය වෙත පිවිසිය හැක.

2. තහනම් උත්තේජක භාවිතය පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා අප ආයතනය විසින් හඳුන්වාදුන් ක්‍රමවලින් එකක් වන මාර්ගගත ක්‍රමය සඳහා වෙබ් පෝරමය, දත්ත පද්ධතිය හා පැමිණිලි මෙහෙයවීමේ වෙබ් පද්ධතිය (Admin Dashboard) නිර්මාණය කරන ලදී. https://slantidoping.org/Complaint%20Management%20System/ මඟින් එම වෙබ් පද්ධතිය වෙත පිවිසිය හැක.
මෙම පද්ධතියට පිවිසිය හැක්කේ බලයලත් නිලධාරියෙකු හට පමණි. පැමිණෙන අලුත් පැමිණිලි පරීක්ෂා කිරීටත්, එම පැමිණිල්ල වෙනුවෙන් ආයතනය විසින් ගත් ක්‍රියා මාර්ගය සටහන් කර තැබීමටත් , අවශ්‍ය සෑම අවස්ථාවකදීම එම තොරතුරු පරීක්ෂා කිරීමටත්, පැමිණිලි එවූ පුද්ගලයින්ගේ තොරතුරු ලබා ගැනීමටත් “admin dashboard” වෙබ් පද්ධතිය හරහා පහසුකම් සපයා ඇත.

2.2 අභියෝග

- 2021 වර්ෂය පුරා පැවති කොවිඩ් - 19 වසංගත තත්වය හමුවේ ක්‍රීඩා තරඟ පැවැත්වීම අවම වීම නිසා අපේක්ෂා කල මට්ටමට පර්යේෂණ හා පරීක්ෂණ සිදු කළ නොහැකි වීම.
- කොවිඩ් - 19 වසංගත තත්වය යටතේ ආයතනය සතුව පවතින ආනයනය කරන ලද නවීන යන්ත්‍ර සූත්‍ර සඳහා zoom තාක්ෂණයෙන් සිදු කළ නොහැකි ප්‍රායෝගික පුහුණු වැඩසටහන් පැවැත්වීමට විදේශීය පුහුණුකරුවන්ගේ තාක්ෂණික සහය ලබා ගැනීම දිනෙන් දින ප්‍රමාද වීම.
- පවතින ජ්‍යෙෂ්ඨ, ද්විතීක හා ප්‍රාථමික සේවක හිඟය හේතුවෙන් රාජකාරි නිසි වෙලාවට ඉටු කිරීමේ අපහසුතා මතු වීම.

2.3 අනාගත අරමුණු

1. ජාත්‍යන්තර, ජාතික, සමාජ හා පාසල් මට්ටමින් තහනම් උත්තේජක පරීක්ෂණ සිදුකිරීම
2. ජාතික ක්‍රීඩා සභාව විසින් පවත්වාගෙන යනු ලබන ඉහළ කාර්යසාධන සංචිතයේ සාමාජිකයින් 60 දෙනා සඳහා තහනම් උත්තේජක පරීක්ෂණ සිදුකිරීම
3. සත්ත්ව තහනම් උත්තේජක පරීක්ෂණ සිදුකිරීම
4. රුධිර තහනම් උත්තේජක පරීක්ෂණ සිදුකිරීම
5. තහනම් උත්තේජක පරීක්ෂණ කටයුතු සඳහා මානව සම්පත පුහුණු කිරීම
6. 2022 වර්ෂයේදී පිරිසිදු ක්‍රීඩා පරිසරයක් ස්ථාපිත කරලීමේ අරමුණින් තහනම් උත්තේජක ගෙන්වීම හා බෙදාහැරීම පාලනය කිරීම පහත සඳහන් පරිදි පුහුණු වැඩමුළු 24 ක් පුද්ගලයින්1570 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පැවැත්වීමට බලාපොරොත්තු වේ.

අනු අංකය	ක්‍රියාකාරකම	භෞතික ප්‍රගතිය			
	පැවැත්වීමට නියමිත පුහුණු වැඩමුළු	පළමු කාර්තුව	දෙවන කාර්තුව	තෙවන කාර්තුව	සිව්වන කාර්තුව
	නියමිත පුහුණු වැඩමුළු	7	5	7	5
	සහභාගීත්වය	560	300	410	300
01	පොලිස් නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළු				
i	වැඩමුළු සංඛ්‍යාව	3	2	3	3
ii	සහභාගීත්වය	350	100	250	100
02	ඖෂධවේදීන් සඳහා පුහුණු වැඩමුළු				
i	වැඩමුළු සංඛ්‍යාව	3	2	3	2
ii	සහභාගීත්වය	200	200	200	200
03	ඖෂධ පරීක්ෂකවරුන් සඳහා පුහුණු වැඩමුළු				
i	වැඩමුළු සංඛ්‍යාව	1		1	
ii	සහභාගීත්වය	10		10	

7. ජාතික ක්‍රීඩා සභාවෙහි (NSC) උපදෙස් අනුව, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක "උසස් කාර්යසාධන වැඩසටහන" යටතේ ජාත්‍යන්තර තරඟ ජයග්‍රහණය කිරීමේ අපේක්ෂාව පෙරදැරිව මේ වනවිට හඳුනාගෙන ඇති ක්‍රීඩක ක්‍රීඩිකාවන් 60 ක් හා ඔවුන් හා සම්බන්ධ, පුහුණුකරුවන්, අභ්‍යාසකයින් හා දෙමාපියන් සඳහා තහනම් උත්තේජක හා මනෝ උපදේශන / අභිප්‍රේරණය වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. (යෝජිත වැඩසටහන් විස්තරය දැනටමත් ක්‍රීඩා සභාව වෙත යොමු කොට ඇත)

8. 2022 වර්ෂයේදී ක්‍රීඩා වෛද්‍ය ආයතනය මගින් තෝරාගන්නා දිස්ත්‍රික්ක 5ක් තුල තෝරාගත් ක්‍රීඩා පහක් සඳහා ඇති කරනු ලබන ක්‍රීඩා සංචිත සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් හා ඊට සමගාමීව ප්‍රදර්ශන කුටි (Outreach Programmes) මඟින් එම වැඩසටහන් පූර්ණ වශයෙන් ආවරණය කිරීමට අපේක්ෂිතය. (යෝජිත වැඩසටහන් විස්තරය දැනටමත් ක්‍රීඩා වෛද්‍ය ආයතනය වෙත යොමු කොට ඇත)

9. සිලෝන් බිස්කට් සමාගමේ (CBL) අනුග්‍රාහක දායකත්වය සැපයීමට, එම සමාගමෙහි වාර්ෂික ආයතනික සමාජ වගකීම (CSR) යන තේමාව පෙරටුකොට ගෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන් දැනුවත් කිරීමේ වැඩසටහන් හා සම්බන්ධ වීමට මෙන්ම “පිරිසිදු ක්‍රීඩාවක් ගොඩනැගීම සඳහා තහනම් උත්තේජක වලින් තොර වෙමු” යන පණිවිඩය සමාජ ගත කිරීම පිණිස, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය හා සිලෝන් බිස්කට් සමාගම අතර අවබෝධතා ගිවිසුමක් (MoU) 2022 වර්ෂයේ මුල් මාස කීහිපය ඇතුළත අත්සන් කිරීමට නියමිතය.

10. ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන පාසල් විෂය මාලාවට, තහනම් උත්තේජක පිළිබඳ විෂය කරුණු ඇතුළත් කරමින් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් තුළ ඒ පිළිබඳ දැනුවත්භාවයක් ඇති කිරීමට අවශ්‍ය මූලික අධ්‍යාපනයක් 2017 වර්ෂයේදී සිදු කෙරිණි. ඒ අනුව 2022 වර්ෂයේදී සිදු කිරීමට නියමිත පාසල් විෂයමාලා සංශෝධනයේදී මේ හා සම්බන්ධ කරුණු පාසල් පෙළපොත් වලට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම. මේ සඳහා ජාතික අධ්‍යාපන ආයතනය සමග එක්ව සිදු කිරීමට අපේක්ෂිතය.

11. ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මගින් යෝජිත “යොවුන් සුවය සඳහා ක්‍රීඩාව” දීපව්‍යාප්ත වැඩසටහන සඳහා පූර්ණ සහයෝගය ලබා දීම.

12. තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිත “යෞවනයේ බලාපොරොත්තුව” ජාතික තරුණ වැඩසටහන සඳහා පූර්ණ සහයෝගය ලබා දීම.

13. 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේදී ද ක්‍රීඩා සංගම්, ත්‍රිවිධ හමුදාව හා පොලිසිය, පාසල් හා විශ්වවිද්‍යාල ඉලක්ක කොට, තහනම් උත්තේජක පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු දිවයින පුරා වඩාත් තීව්‍ර ලෙස සිදු කිරීමට බලාපොරොත්තු වේ. ඒ තුළින් ශ්‍රී ලංකාව තුළ ක්‍රීඩාවේ තහනම් ද්‍රව්‍ය හා තහනම් ක්‍රම පිටුදැකීම පිළිබඳව දැනුවත්භාවයක් සියලුම පාර්ශවයන් වෙත ලබාදීමට අපේක්ෂා කරයි.

14. පහත සඳහන් පර්යේෂණ වල Abstract වාර්තාව අන්තර්ජාතික ක්‍රීඩා සමුළුවල ප්‍රකාශයට පත්කරවීම හා පූර්ණ පර්යේෂණ වාර්තා පිළියෙළ කර ප්‍රකාශනය සඳහා ජර්නල වෙත යොමු කිරීම.
    i. ශ්‍රී ලංකාව තුළ තහනම් උත්තේජක විරෝධී නීති උල්ලංඝනය කිරීම් පිළිබඳ අධ්‍යයනය
    ii. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය මගින් සිදුකරනු ලබන තහනම් උත්තේජක පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන ඇගයීමේ අධ්‍යයනය

15. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ක්‍රීඩික ක්‍රීඩිකාවන්ගේ ආහාර අතිරේක භාවිතය පිළිබඳ Abstract වාර්තාවක් අන්තර්ජාතික සැසියක ප්‍රකාශයට පත් කිරීම.

16. පහත සඳහන් පූර්ණ පර්යේෂණ වාර්තා ජර්නල වල ප්‍රකාශයට පත් කිරීම.
    i. ක්‍රීඩක ක්‍රීඩිකාවන් විසින් ප්‍රෝටීන, විටමින්, ඉලෙක්ට්‍රොලයිට යන ආහාර අතිරේක භාවිතයේ පසු කාලීන සෞඛ්‍යමය බලපෑම පිළිබඳ අධ්‍යයනයේ සම්පූර්ණ පර්යේෂණ වාර්තාව
    ii. තහනම් උත්තේජක පර්යේෂණ සඳහා යොදා ගත හැකි විවිධ ජෛව සාම්පල අධ්‍යයනයට අදාළ පර්යේෂණ වාර්තාව

17. තහනම් උත්තේජක ක්ෂේත්‍රයේ නව පර්යේෂණ 3 ක් නිමා කිරීම.

18. මෙම නව පර්යේෂණ සොයා ගැනීම් ශ්‍රී ලාංකික ක්‍රීඩා ප්‍රජාව හා ක්‍රීඩාවට සම්බන්ධ විශ්වවිද්‍යාල ප්‍රජාව අතර බෙදා හැරීමට කටයුතු කිරීම.

19. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ පර්යේෂණාගාරයට මිල දී ගත් LC – MS/MS යන අධි තාක්ෂණික උපකරණය ක්‍රියා කරවීමට කටයුතු කිරීම

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය (වර්තමාන වර්ෂය)		සටහන	තත්‍ය වර්තමාන වර්ෂය	ඉකුත් වර්ෂය	
	ආදායම්ලැබීම්				
	ආදායම් බදු	**1**	-	-	
	දේශීය භාණ්ඩ හා සේවා මත මතබදු	**2**	-	-	
	අන්තර් ජාතික වෙළඳාම මත බදු	**3**	-	-	
	බදු නොවන ආදායම්	**4**	1,781,520.00	2,738,253.71	ඒසීඒ -1
	මුළු ආදයම් ලැබීම් (අ)		1,781,520.00	2,738,253.71	
	ආදයම් නොවන ලැබීම්				
50,056,000.00	භාණ්ඩාගාර අක්මුදල්		50,056,000.00	71,711,000.00	ඒසීඒ -3
	වෙනත් ලැබීම්		67,500.00	189,142.20	
50,056,000.00	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**50,123,500.00**	**71,900,142.20**	
50,056,000.00	**මුළු ආදායම්ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**51,905,020.00**	**74,638,395.91**	
	අඩු කළා: වියදම්				
	පුනරාවර්තන වියදම්				
15,700,000.00	වේතන, වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	14,948,201.33	12,852,463.08	
24,100,000.00	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	21,961,544.10	15,724,468.90	ඒසීඒ - 2(II)
39,800,000.00	**මුළු පුනරාවර්තනවියදම් (ඈ)**		**36,909,745.43**	**28,576,931.98**	
	මූලධන වියදම්				
1,057,000.00	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	**10**	1,056,476.02	208,000.00	
2,102,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	**11**	2,101,803.19	17,137,000.00	ඒසීඒ - 2(II)
79,300.00	හැකියා වර්ධනය	**14**	79,240.00	91,350.00	
10,061,700.00	වෙනත් මූලධන වියදම්	**15**	10,061,630.57	10,510,000.00	
13,300,000.00	**මුළු මූලධන වියදම් (ඉ)**		**13,299,149.78**	**27,946,350.00**	
53,100,000.00	**මුළු වියදම් උ=(ඈ+ඉ+ඊ)**		**50,208,895.21**	**56,523,281.98**	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ -පී

2021දෙසැම්බර් **31** දිනට
මූල්‍ය තත්ත්වයපිළිබඳ ප්‍රකාශය

		තත්‍ය	
	සටහන	**වර්තමාන වර්ෂය**	**ඉකුත් වර්ෂය**
		රු.	**රු.**
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	**ඒසීඒ -6**	270,666,533.22	286,076,122.09
මූල්‍ය වත්කම්			
තොග		2,005,580.20	1,805,639.63
ලැබිය යුතු ආදායම්		1,296,100.00	691,040.00
කලින් ගෙවූ වියදම්		384,224.03	-
අත්තිකාරම් ගිණුම්	**ඒසීඒ -5/5(අ)**	-	-
මුදල් හා මුදල් සමාන දෑ	**ඒසීඒ -3**	3,750,780.96	2,166,789.93
මුළු වත්කම්		**278,103,218.41**	**290,739,591.65**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාර ප්‍රතිපාදන		251,832,810.40	266,229,421.89
වෙනත් ප්‍රතිපාදන		1,445,090.38	2,198,212.88
සමුචිත අරමුදල	**ඒසීඒ -5(ආ)**	6,314,053.91	4,465,033.91
ප්‍රත්‍යාගණන සංචිත		2,547,085.96	2,547,085.96
		262,139,040.65	**275,439,754.64**
ජංගම වගකීම්			
රඳවාගත් මුදල්		12,300,559.94	12,300,559.94
උපචිතවියදම්		1,206,260.32	1,194,630.66
ආපසු ගෙවිය යුතු තැම්පතු		40,000.00	85,000.00
පාරිතෝෂික වෙන්කිරීම්		2,417,357.50	1,719,646.41
		15,15,964,177.76	**15,299,837.01**
අග්‍රිම ශේෂය	**ඒසීඒ -3**	-	-
මුළු වගකීම්		**290,739,591.65**	**290,739,591.65**
2021දෙසැම්බර් **31** දිනට **අග්‍රිමශේෂය ඌ =(ඇ-ඈ)**		**1,696,124.80**	**18,115,113.73**

පිටු අංක 29 සිට 31දැක්වෙන ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 32 සිට 36 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර දමෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශනයන් හි සටහන් මගින් හෙළිදරවු කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධානඅගණන් දීමේ නිලධාරී	ගණන් දීමේ නිලධාරී	ප්‍රධන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
නම :	නම :	අධ්‍යක්ෂ (මූල්‍ය)/ කොමසාරිස් (මූල්‍ය)
තනතුර :	තනතුර :	තනතුර :
දිනය : 2022.02.25	දිනය : 2022.02.25	දිනය : 2022.02.25

වෛද්‍ය සිවලී ජයවික්‍රම
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතන
ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම්
ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

H. M. C. G. DAYARATHNE
Accountant
Sri Lanka Anti-Doping Agency
State Ministry of Rural and School
Sports Infrastructure Improvement

රවීන්ද්‍ර සමරවික්‍රම
ලේකම්
ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන
රාජ්‍ය අමාත්‍යාංශය
12 [illegible]

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන

මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

තත්‍ය

	වර්තමාන වර්ෂය	ඉකුත් වර්ෂය
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
ශුද්ධ ලාභය	1,849,020.00	2,927,395.91
ගැලපුම්		
ක්ෂය	17,511,392.06	17,022,491.22
භාණ්ඩාගාර ප්‍රතිපාදන සඳහා වෙන් කිරීම්	-64,452,611.49	-56,459,290.77
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්		
(වැඩිකිරීම්)/අඩුකිරීම් තොග	-199,940.57	212,949.37
(වැඩිකිරීම්)/අඩුකිරීම් පරීක්ෂණ වලින් ලැබීම්	-605,060.00	-691,040.00
(වැඩිකිරීම්)/අඩුකිරීම් කලින් ගෙවූ වියදම්	-384,224.03	-
වැඩිකිරීම් / (අඩුකිරීම්)යලි ගෙවන තැම්පතු	-45,000.00	50,000.00
වැඩිකිරීම් / (අඩුකිරීමපාරිතෝෂිත(වෙන් කිරීම්	697,711.09	-91,877.47
වැඩිකිරීම් /(අඩුකිරීම්)රැඳවුම් මුදල්	-	6,626,927.74
වැඩිකිරීම් /(අඩුකිරීම්)උපචිත වියදම්	11,629.66	429,702.49
	-524,883.85	**6,536,662.13**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**-45,617,083.28**	**-29,972,741.51**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේපල පිරියත උපකරණ මිලදී ගැනීම්	-2,101,803.19	-31,809,152.86
කාරක ප්‍රාග්ධන ප්‍රගතිය	-	5,057,391.03
භාණ්ඩාගාර ප්‍රතිපාදන පියවීම	-	-15,000,000.00
	-2,101,803.19	**-41,751,761.83**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ		
භාණ්ඩාගාර ප්‍රතිපාදන	50,056,000.00	71,711,000.00
ලේකම් - ක්‍රීඩාඅමාත්‍යාංශය	-753,122.50	-753,122.50
	49,302,877.50	**70,957,877.50**
වර්ෂය තුළදී මෙහෙයුම් තුළින් ජනිත වූ ශුද්ධ ලාභය (ප්‍රයෝජනයට ගන්නා ලද)	**1,583,991.03**	**-766,625.84**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**2,166,789.93**	**2,933,415.77**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**3,750,780.96**	**2,166,789.93**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

සටහන 4	2021	2020
වෙනත් ආදායම්		
තහනම් උත්තේජක පරීක්ෂණ ආදායම්	1,781,520.00	2,738,253.71
යලි නොගෙවන තැම්පතු	-	19,000.00
කුලී ආදායම්	67,500.00	67,500.00
වෙනත් ආදායම්	-	102,642.20
	1,849,020.00	**2,927,395.91**

භාණ්ඩාගාර අක්මුදල් (ප්‍රතිපාදන)	2021	2020
01.01.2021 දිනට ශේෂය	266,229,421.89	266,081,050.16
ගලා ඒම් -2021	50,056,000.00	71,711,000.00
2021 ක්‍රමක්ෂ ප්‍රතිපාදන	(64,448,211.49)	(56,562,628.27)
භාණ්ඩාගාර පියවීම්	-	(15,000,000.00)
31.12.2021 දිනට ශේෂය	**251,832,810.40**	**266,229,421.89**

සටහන -5

පරිපාලන වියදම්	2021	2020
වැටුප් හා වේතන	12,209,450.24	10,470,508.38
සභාපතිතුමගේ දීමනාව	450,000.00	409,913.79
අතිකාල දීමනා හා නිවාඩු දින ගෙවීම	546,318.66	442,697.25
සේ.අ.අ.	1,393,945.95	1,223,474.93
සේ.නි.භා.අ.	348,486.48	305,868.73
	14,948,201.33	**12,852,463.08**

සටහන -9

වෙනත් පුනරාවර්තන වියදම්	2021	2020
දේශීය ගමනාගමන සහ ඉන්ධන දීමනා	600,000.00	600,000.00
විදේශීය ගමනාගමන වියදම්	-	21,860.00
ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ	1,169828.02	(207,694.49)
ඉන්ධන	963,950.00	821,863.00
වාහන නඩත්තු වියදම්	105,550.69	195,112.21
ගොඩනැගිලි සහ සැලසුම් නඩත්තු වියදම්	770,948.36	357,918.00
යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම්	782,236.51	637,902.28

ප්‍රවාහන	1,066,840.00	1,115,445.00
මෙහෙයුම් කල්බදු සඳහා බදුවාරික ගෙවීම	2,592,000.00	2,592,000.00
තැපැල් හා සන්නිවේදන	360,047.55	907,068.69
විදුලිය හා ජලය	2,688,411.81	1,802,086.45
ප්‍රචාරණය හා ප්‍රවර්ධනය	1,785,768.40	982,448.00
පුහුණු හා රැස්වීම් වියදම්	996,275.14	679,034.00
අළුත් කිරීම වියදම්	2,869,043.03	304,688.80
විගණන වියදම්	-	512,880.00
විකුණුම් හා පර්යේෂණ වියදම්	110,000.00	464,780.92
දැනුවත් කිරීමේ වැඩමුළු	296,088.76	510,541.36
පාරිතෝෂික වෙන් කිරීම්	697,711.09	114,797.53
පවිත්‍රතා සහ සනීපාරක්ෂක ගාස්තු	1,537,598.76	1,334,770.65
ආරක්ෂක සේවා	2,247,913.00	2,080,304.00
නෛතික හා බලාත්මක කිරීමේ වියදම්	321,333.00	-
	21,961,544.10	**15,827,806.40**

සටහන -9.1

Anti-Doping වියදම්	**2021**	**2020**
වර්ෂයේ වියදම්	9,350,323.03	11,521,640.07
	9,350,323.03	**11,521,640.07**

සටහන -10

මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	**2021**	**2020**
ගොඩනැගිලි	263,304.00	138,000.00
පරිගණකහා උපකරණ	-	70,000.00
මෝටර්වාහන	793,172.02	-
	1,056,476.02	**208,000.00**

සටහන -11

මූලධන වත්කම්අත්පත් කර ගැනීම	**2021**	**2020**
ගොඩනැගිලි	307,215.09	3,737,000.00
ගොඩනැගිලි සහ සැලසුම්, ගෘහභාණ්ඩ හා වෙනත් උපකරණ	21,000.00	-
පරිගණකහා උපකරණ	1,483,930.00	255,000.00
පර්යේෂණ උපකරණ	289,658.10	8,749,000.00
රසායනාගාර ගෘහ භාණ්ඩ	-	4,397,000.00
	2,101,803.19	**17,138,000.00**

මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්- දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා

සටහන්- ඒසීඒ -6

දේපල පිරියත උපකරණ **(ශ්‍රී ලංකාරුපියල්)**

පිරිවැය	**01.01.2021** දිනට ශේෂය	වර්ෂයේ එකතු කිරීම්	ප්‍රත්‍යාගනන ගැලපුම්	**2021**දෙසැම්බර් **31** දිනට ශේෂය
ගොඩනැගිලි සහසැලසුම්	216,678,822.95	307,215.09	-	216,986,038.04
ගෘහභාණ්ඩ	873,436.35	-	-	873,436.35
පරිගණකහා උපකරණ	1,255,850.00	1,483,930.00	-	2,739,780.00
වෙනත්උපකරණ	2,329,650.00	21,000.00	-	2,350,650.00
මෝටර්වාහන-WPLW-0353	6,024,980.00	-	-	6,024,980.00
පර්යේෂණ උපකරණ	11,155,842.25	289,658.10	-	11,445,500.35
රසායනාගාර ගෘහ භාණ්ඩ	16,876,414.30	-	-	16,876,414.30
	255,194,995.85	**2,101,803.19**	**-**	**257,296,799.04**

සමුච්චිත ක්ෂය	**01.01.2021**දිනට ශේෂය	වර්ෂයේ එකතු කිරීම්	ප්‍රත්‍යාගනන ගැලපුම්	**2021**දෙසැම්බර් **31** දිනට ශේෂය
ගොඩනැගිලි සහ සැලසුම්	21,481,043.86	10,849,301.90	-	32,330,345.76
ගෘහභාණ්ඩ	518,729.28	87,343.64	-	606,072.92
පරිගණක හා උපකරණ	-	684,945.00	-	684,945.00
වෙනත් උපකරණ	-	587,662.50	-	587,662.50
මෝටර් වාහන-WPLW-0353	2,763,934.63	753,122.50	-	3,517,057.13
පර්යේෂණ උපකරණ	2,878,924.56	2,861,375.09	-	5,740,299.65
රසායනාගාර ගෘහභාණ්ඩ	1,687,641.43	1,687,641.43	-	3,375,282.86
	29,330,273.76	**17,511,392.06**	**-**	**46,841,665.82**

ලියාභල වටිනාකම 31/12/2021	**225,864,722.09**	**(15,409,588.87)**	**-**	**210,455,133.22**

ප්‍රාග්ධන ක්‍රියාකාරකම්හි ප්‍රගතිය	2021	2020
පර්යේෂණ උපකරණ	60,211,400.00	60,211,400.00
රසායනාගාර ගෘහ භාණ්ඩ	-	-
	60,211,400.00	**60,211,400.00**

අනෙකුත් සටහන්

තොග	2021	2020
අවසන් තොගය - මානව සාම්පල් කට්ටල	1,489,540.00	1,054,576.13
අවසන් තොගය - අශ්ව සාම්පල් කට්ටල	-	115,710.00
අවසන් තොගය -ලිපිද්‍රව්‍ය	236,220.00	
අවසන් තොගය -ටෝනර් සහ කාට්රිජ්	279,820.20	635,353.50
	2,005,580.20	**1,805,639.63**

අයවිය යුතු ආදායම්	2021	2020
පරීක්ෂණ ආදායම් -ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය	672,000.00	691,040.00
පරීක්ෂණ ආදායම්- රෝයල් ටර්ෆ් ක්ලබ්	624,100.00	-
	1,296,100.00	**691,040.00**

කලින් ගෙවූ වියදම්	2021	2020
ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේශන් පුද්. සමාගම	4,864.70	-
මෙට්‍රොපොලිටන් ඔෆිස් පුද්. සමාගම	2,880.00	
ඔෆිස්ට්‍රොනික්ස් පුද්. සමාගම	7,083.33	
හේලීස් ඇවෙන්චුරා පුද්. සමාගම	132,525.00	
ජෝර්ජ් ස්ටුවර්ට් සොලූෂන්ස් පුද්. සමාගම	140,481.00	
ඇමීගෝ ටෙක්නොලොජීස් පුද්. සමාගම	96,390.00	
	384,224.03	**-**

සටහන ඒසීඒ -3	2021	2020
මුදල් හා මුදල් හාසමාන දෑ		
ලංකා බැංකු ගිණුම්අංක 75463697	3,750,780.96	2,166,789.93
	3,750,780.96	**2,166,789.93**

වෙනත් ප්‍රතිපාදන	2021	2020
2021.01.01 දිනට ශේෂය	2,198,212.88	2,951,335.38
2021 අරමුදල්ක්‍රමක්ෂය	(753,122.50)	(753,122.50)
2021.12.31 දිනටශේෂය	**1,445,090.38**	**2,198,212.88**

සටහන ඒසීඒ -5 (ආ)

සමුච්චිත අරමුදල	2021	2020

ආරම්භක වර්ෂයේ ශේෂය	4,465,033.91	1,537,638.00
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා ලාභය මාරු කිරීම	1,849,020.00	2,927,395.91
වර්ෂ අවසානයේ ශේෂය	**6,314,053.91**	**4,465,033.91**

ප්‍රත්‍යාගනණ සංචිත

	2021	**2020**
ප්‍රත්‍යාගනණ සංචිත	2,547,085.96	2,547,085.96
වර්ෂ අවසානයේ ශේෂය	**2,547,085.96**	**2,547,085.96**

උපචිත වියදම්	**2021**	**2020**
තැපල් සහ සන්නිවේදන	11,163.85	83,003.78
විදුලිය සහ ජලවියදම්	225,776.06	170,091.90
මෙහෙයුම් කල්බදුසඳහා ගෙවීම්	216,000.00	216,000.00
වැටුප් හා වේතන	-	5,000.00
අතිකාල දීමනාවියදම්	63,561.33	74,798.55
ප්‍රවාහන වියදම්	88,000.00	151,220.00
විගණන ගාස්තු	-	117,600.00
තහනම් උත්තේජක පරීක්ෂණ වියදම්	69,458.48	162,954.70
ආරක්ෂක සේවා	192,014.00	190,814.00
පවිත්‍රතා සහ සනීපාරක්ෂක ගාස්තු	150,050.00	23,147.73
ගොඩනැගිලි සහ සැලසුම් නඩත්තු වියදම්	33,480.00	-
යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම්	156,756.60	-
	1,206,260.32	**1,194,630.66**

පාරිතෝෂික වෙන් කිරීම්	**2021**	**2020**
වර්ෂය ආරම්භයේ වෙන්කිරීම	1,719,646.41	1,708,186.38
වර්ෂයේ ගෙවීම්	-	(103,337.50)
වර්ෂයේ වෙන් කිරීම	697,711.09	114,797.53
වර්ෂ අවසානයේ වෙන්කිරීම	**2,417,357.50**	**1,719,646.41**

3.5 ආදායම් එකතුකිරීමේ කාර්ය සාධනය

රු.

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2002.01.01	රාජ්‍යනිවාස හා ගොඩනැගිලි කුලී	67,500.00	67,500.00	67,500.00	100%
2002.02.01	ණයපොළී	-	-	-	-
2003.02.99	විවිධ ආදායම්	1,781,520.00	1,781,520.00	485,420.00	27%
2004.01.00	මධ්‍යම රජය (වැන්දඹු හා අනත්දරු)	-	-	-	-

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධකය

රු.

ප්‍රතිපාදන වර්ගය	වෙන්කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	60,000,000.00	39,800,000.00	36,372,089.00	91%
ප්‍රාග්ධන	55,000,000.00	13,300,000.00	13,299,000.00	99%

3.7 විගණකාධිපතිවරයාගේ වාර්තාව

විගණය සිදු කරමින් පවතින අතර අවසාන විගණන වාර්ථාව ලැබී නොමැත.

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු.

වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2021** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2021** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	217,859,474.00	217,859,474.00	-	100%
9152	යන්ත්‍රෝපකරණ	39,437,325.00	39,437,325.00	-	100%
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	60,211,400.00	60,211,400.00	-	100%
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

04 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක්(%) ලෙස තත්‍ය නිමැවුම		
	100%-90%	75%-89%	50%-74%
වර්ෂයකදී කරනු ලබන තහනම් උත්තේජක පරීක්ෂණ ගණන			√
තහනම් උත්තේජක පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු සංඛ්‍යාව		√	
තහනම් උත්තේජක පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු සඳහා සහභාගී වූ සංඛ්‍යාව		√	
වර්ෂයකදී සිදු කරනු ලැබූ පර්යේෂණ සංඛ්‍යාව			√

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය/ අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
03.නීරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධන ප්‍රවර්ධනය කිරීම	තහනම් උත්තේජක පරීක්ෂණ තීව්‍ර කිරීම	පවත්වන ලද තහනම් උත්තේජක පරීක්ෂණ ගණන.		√	
	වැඩි ක්‍රීඩා ප්‍රමාණයක් ආවරණය වන ලෙස තහනම් උත්තෙජක පරීක්ෂණ සිදු කිරීම				
පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	තහනම් ද්‍රව්‍ය භාවිතයේ ඇති විපාක පිළිබඳ ක්‍රීඩා ප්‍රජාවේ දැනුවත් භාවය වැඩි කිරීම	පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් ගණන හා වැඩසටහන් සඳහා සහභාගිවූ ප්‍රමාණය.			√
	දේශීය සම්ප්‍රදායික ආහාර පාන, ඖෂධ හි තහනම් සංඝටක පිළිබඳ පර්යේෂණ කිරීම හා තොරතුරු යාවත්කාලීන කිරීම	වසර පුරා කරන ලද පර්යේෂණ වල ප්‍රගතිය		√	

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

ජීව ගුණයෙන් යුතු ක්‍රීඩා සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම හා අව්‍යාජ ක්‍රීඩකයා ආරක්ෂා කිරීම 2021 වසර පුරා කොවිඩ් වසංගතය මධ්‍යයේ සාර්ථකව නිම කිරීමට හැකිවූ අතර මුල්‍ය සම්පත් සම්පාදනය මත, එහි අඛණ්ඩ සාර්ථකත්වය රඳා පවති.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	10	07	03
තෘතීයික	03	03	-
ද්විතියික	09	08	01
ප්‍රාථමික	07	04	03

6.2 ** ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කේසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ප්‍රධාන ශ්‍රීතියික කාර්යයන් හා පැවති ඉලක්කයන් 2021 වසර තුළදී ආයතනයෙහි සිටි කාර්ය මණ්ඩලය මගින් ඉටු කිරීමට කටයුතු කරන ලදි. 2022 වසරෙහි පවතින සියලු කාර්යය මණ්ඩල පුරප්පාඩු බඳවා ගැනීමට නියමිතයි.

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තිරණ ක්‍රියාමර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධරීන්ගේ අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.6	වෙනත්			
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.1	බැරකම් ලේඛන යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය(GAN20) යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ,135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		

3.2	මුල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	භාවිතා නොවේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමෙන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තුමේන්තුවට (NBD)නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ 134(2) DMA/1-2019 අනුව,වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණක වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණක පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තුමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		

8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණනකාධිපති වෙත ඉදිරිපත් තිබීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අදාල නොවේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කලින කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය විම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව,බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අදාල නොවේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාල නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම	අදාල නොවේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අදාල නොවේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අදාල නොවේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කිරීම	අදාල නොවේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කලින කර පවත්වගෙන යාම	අදාල නොවේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තුමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අදාල නොවේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාල නොවේ		
15.2	රැස් කර තිබූ ආදයම්, තැම්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාල නොවේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ		

16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්යය මණ්ඩල සීමාව තුළ කාර්යය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්යය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09..2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යවත්කාලීනකර පවත්වගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2008(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ	මේ දක්වා සිදුකොට නොමැත.	2022 වසර තුල ක්‍රියාත්මක කිරීමට නියමිතයි
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇඟයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කර තිබීම	අනුකූල නොවේ	මේ දක්වා සිදුකොට නොමැත.	2022 වසර තුල ක්‍රියාත්මක කිරීමට නියමිතයි
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම් 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	මේ දක්වා සිදුකොට නොමැත.	2022 වසර තුල ක්‍රියාත්මක කිරීමට නියමිතයි
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්යමණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම අත්සන් කර තිබීම	අනුකූල වේ		

19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම,නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

අවසානයි.



සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

වාර්ෂික කාර්යසාධන වාර්තාව

2021

01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය භාරකාර අරමුදල 1995.02.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ක්‍රීඩා අමාත්‍යාංශයට පවරා ගනු ලැබූ අතර, 1999 අප්‍රේල් මස 20 වෙනි දින සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියක් බවට පත් කිරීමේ 1999 අංක 17 දරන පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. එකී පනතින් 1999.09.01 දින සිට බලාත්මක වන සේ සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ස්ථාපිත කරන ලදී. කාලීන අවශ්‍යතාවය මත කළමනාකාරීත්ව මණ්ඩල උපදෙස් හා අනුමැතියට අනුව ප්‍රධාන ප්‍රඥප්තියේ වගන්ති සංශෝධනය කර 2017 අගෝස්තු මස 28 දින 2017 අංක 14 දරණ (සංශෝධන) පනත පාර්ලිමේන්තුවේදී සභා සම්මත කරන ලදී.

මෙම අධිකාරියේ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම, කළමනාකාරීත්වයේ කටයුතු සඳහා එකොලොස් දෙනෙකුගෙන් (11) සමන්විත කළමනාකාරීත්ව මණ්ඩලයක් මඟින් සිදුකරන අතර, එම මණ්ඩලය පහත සඳහන් පරිදි වේ.

- ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් හෝ නියෝජිතයෙකු.
- ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 5 දරන ක්‍රීඩා පනත යටතේ පත් කරනු ලබන අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු.
- භාණ්ඩාගාරයේ නියෝජිතවරයෙකු
- ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සභාපති, ක්‍රියාකාරී අධ්‍යක්ෂ ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ 08 දෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් පත් කරනු ලැබේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

''ආසියාවේ පළමු පෙලේ ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා පහසුකම් සහිත ක්‍රීඩා සංකීර්ණයක් බවට සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පත් කිරීම සහ එය සතු අනෙකුත් ක්‍රීඩා සංකීර්ණ දියුණු කිරීම තුළින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සංවර්ධනයට පහසුකම් සහනදායීව ලබා දීම''

මෙහෙවර

"ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සැපයීම මඟින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ දියුණුවට දායකවීම සහ ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කුසලතා ඔප් නැංවීමට අවැසි පහසුකම් සහිත ප්‍රමුඛතම ජාත්‍යන්තර සංකීර්ණයක් බවට පත්වීම''

අරමුණු

- සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය කළමණාකරණය කිරීම, නඩත්තු කිරීම, සුරැකීම සහ සංවර්ධනය කිරීම.
- ක්‍රීඩා ආර්ථිකයේ සහ ක්‍රීඩා සංචාරක ව්‍යාපාරයේ අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය ක්‍රීඩා හා විනෝදාත්මක කටයුතු ඇතුළු අනෙකුත් පහසුකම් වැඩි දියුණු කිරීම.
- රටෙහි ක්‍රීඩා අභිවෘද්ධිය වෙනුවෙන් පහසුකම් සැපයීම.
- සමාජ ඒකාබද්ධතාවට හා ජාතිය ගොඩනැගීමට උපකාරී වන ක්‍රමවේද ලෙස ක්‍රීඩා හා විනෝදාත්මක කටයුතු යොදාගනු ලැබීම සහතික කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

- ජාතික ක්‍රීඩා සංගම්, පාසල් ක්‍රීඩා සංගම් හා රාජ්‍ය මෙන් ම පෞද්ගලික ආයතන සඳහා කළමනාකාරීත්ව මණ්ඩලය මගින් අනුමත කළ සහනදායී ගාස්තු යටතේ සේවා හා පහසුකම් සැපයීම.
- ජාතික හා ජාත්‍යන්තර ජවන හා පිටිය ක්‍රීඩා තරඟ සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.
- ජාත්‍යන්තර මට්ටමේ තරඟ දිවා කාලයේ දී මෙන් ම රාත්‍රී කාලයේ දී පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සැපයීම.
- අඩු පහසුකම් සහිත පාසල් හා ග්‍රාමීය මට්ටමේ දක්ෂතා සපිරි ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අවශ්‍ය යටිතල පහසුකම් සපයාදීම මඟින් ඔවුන්ගේ දක්ෂතා වැඩිදියුණු කරගෙන ඉදිරියට ඒමට අවශ්‍ය පහසුකම් සැපයීම.
- ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ පිහිනුම් තරඟ පැවැත්වීමට අවශ්‍ය පිහිනුම් හා කිමිදුම් තටාකාංගන පහසුකම් සැපයීම.
- විභාග, සම්මන්ත්‍රණ, සමුළු, උත්සව හා විනෝද කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.
- පුහුණු වැඩමුළු සංවිධානය කිරීම.

1.4 සංවිධාන සටහන



1.5 සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට අයත් ක්‍රීඩාංගන පරිශ්‍ර හා බාහිර ආයතන

i) සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනය
   - ගෘහස්ථ ක්‍රීඩාගාරය
   - උප ක්‍රීඩාගාරය
   - පිහිණුම් තටාක සංකීර්ණය
   - කායවර්ධන මධ්‍යස්ථානය
   - ක්‍රීඩා හෝටලය

ii) සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනය
iii) බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගනය
iv) බෙලිඅත්ත පිහිණුම් තටාකය
v) නුවර එළිය තුරඟ තරඟ පිටිය
vi) ආර්. ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය

ගෘහස්ථ ක්‍රීඩාගාරය

ගෘහස්ථ ක්‍රීඩාගාරය ආසන 5004කින් සැදුම්ලත් වායුසමීකරණය කළ ප්‍රේක්ෂකාගාරයකින් සමන්විත වන අතර, මෙහි ගෘහස්ථ ක්‍රීඩා පිටියෙහි පළල මීටර් 35ක් හා දිග මීටර් 40ක් වේ. මෙම ක්‍රීඩාගාරයේ ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ පැසිපන්දු, බැඩ්මින්ටන්, දැල්පන්දු, ජූඩෝ, ජිම්නාස්ටික්, වොලිබෝල්, මේස පන්දු, බොක්සිං, කරාතේ, මල්ලවපොර ආදී ගෘහස්ථ ක්‍රීඩා තරඟ පැවැත්වීමට පහසුකම් සැකසා ඇත. මීට අමතරව විවිධ උත්සව, සම්මේලන, සංගීත සංදර්ශන, රාජ්‍ය උත්සව හා වැඩමුළු පැවැත්වීම සඳහා ද පහසුකම් සපයනු ලැබේ.

උප ක්‍රීඩාගාරය

මෙම උප ක්‍රීඩාගාරය බැඩ්මින්ටන් ක්‍රීඩා පිටි දෙකකින් හා ස්කොෂ් ක්‍රීඩාගාර හතරකින් සමන්විත වන අතර, ක්‍රීඩා තරඟ හා පුහුණුවීම් කටයුතු සඳහා පහසුකම් ලබාදීමට හැකියාව ඇත.

පිහිණුම් තටාක සංකීර්ණය

ශ්‍රී ලංකාවේ පාසල් මට්ටමේ හා ක්‍රීඩා සංගම් මගින් සැලසුම් කරනු ලබන පිහිණුම් පුහුණුවීම් කටයුතු මෙන්ම තරඟාවලි පැවැත්වීමට පහසුකම් සපයනු ලබයි. ඊට අමතරව අධිකාරිය විසින් පාසල් ළමුන් වෙනුවෙන් සහනදායී මිලකට සාමාජිකත්වය ලබාදී පිහිණුම් පාසලක්ද පවත්වාගෙන යනු ලැබේ. මෙම පිහිණුම් සංකීර්ණය මඟින් පාසල් මට්ටමේ සිට ජාත්‍යන්තර මට්ටමේ පිහිණුම් තරඟ පැවැත්වීම දක්වා අවශ්‍ය පහසුකම් සපයනු ලබන අතර දිවා/රාත්‍රී තරඟ සඳහා අධිබලැති විදුලි ආලෝක කුළුණු සහිත පහසුකම් ඇති ශ්‍රී ලංකාවේ එකම පිහිණුම් තටාක සංකීර්ණය ලෙස හැඳින්විය හැක.

කායවර්ධන මධ්‍යස්ථානය

මෙම ක්‍රීඩා සංකීර්ණය ආරම්භ කරන ලද දිනයේ සිට ස්ථාපනය කර තිබූ මෙම කායවර්ධන මධ්‍යස්ථානය, 2013 වසරේදී නවීකරණය කොට ඒ සඳහා නවීන කායවර්ධන උපකරණද මිලදී ගෙන ඇත.

ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මෙන්ම සාමාජිකත්වය ලබා ගෙන ඇති සෙසු සේවා ලාභීන්ට ද මෙම මධ්‍යස්ථානයේ පුහුණුවීම් වල යෙදීමට පහසුකම් සලසා ඇත.

ක්‍රීඩා හෝටලය

මෙම අධිකාරියේ සේවා පහසුකම් ලබා ගැනීම සඳහා පැමිණෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙත නේවාසික පහසුකම් ලබාදීම සඳහා ස්ථාපනය කර ඇති නවීකරණය කරන ලද ක්‍රීඩා හෝටලයෙහි පරිපාලන කටයුතු සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය විසින් සිදු කරනු ලබන අතර, මෙහි නේවාසික පහසුකම් සඳහා කාමර 42කින් යුක්ත දෙමහල් ගොඩනැගිල්ලක් ලෙස ස්ථාපනය කර ඇත. මෙහි සාමාජික සාමාජිකාවන් 150කට අධික පිරිසකට එකවර නවාතැන් ගැනීමෙහි හැකියාව ඇත. මෙහි නවාතැන් පහසුකම් ලබා ගැනීමට අමතරව උත්සව, ප්‍රියසාද, රැස්වීම් හා වැඩමුළු පැවැත්වීම සඳහා ද පහසුකම් සලසා ඇත.

සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනය

ශ්‍රී ලාංකික පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් මලල ක්‍රීඩා තරඟ පැවැත්වීමට සඳහා ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් ඇති එකම ක්‍රීඩාංගනය වේ. දිවා සහ රාත්‍රී කාලවලදී ජවන හා පිටිය ක්‍රීඩා තරඟ, පාපන්දු/රග්බි පුහුණුවීම් හා තරඟ එකවර පැවැත්වීමට හැකි ආකාරයට මෙම ක්‍රීඩාංගනය සකසා ඇත. මෙම ක්‍රීඩාංගනයේ එකවර ප්‍රේක්ෂකයින් 20,000 කට පමණ තරඟ නැරඹීය හැකි ආකාරයට ක්‍රීඩාගාර පහසුකම් සකසා ඇත.

එළිමහන් ක්‍රීඩාංගනයේ මීටර් 400 හා මීටර් 200 වශයෙන් කෘත්‍රිම ධාවන පථ 02ක් ඇත. මෙම කෘතීම ධාවන පථ වල පස්වන වතාවට නවීකරණ කටයුතු මෙම වර්ෂයේදී අවසන් කරන ලදී. මීට අමතරව මහල් තුනකින් යුත් මාධ්‍ය කුටියක්, අධිබලැති විදුලි ආලෝක පද්ධතියක් මඟින් රාත්‍රී ක්‍රීඩා තරඟ පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සපයා ඇත. මෙම ක්‍රීඩා පිටියේ මළල ක්‍රීඩා, වොලිබෝල්, රගර්, පාපන්දු, පැසිපන්දු ක්‍රීඩා මෙන්ම විවිධ උත්සව සඳහා ද පහසුකම් ඇත.

බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගනය

මෙම ක්‍රීඩාංගනය මහනුවර නගර සභාව විසින් පාලනය කරන ලද අතර, 2001 වසරේ සිට මෙම අධිකාරිය වෙත භෞතික අයිතිය පැවරීමෙන් පසු පරිපාලන කටයුතු අධිකාරිය විසින් සිදු කරනු ලබයි. මේ සඳහා ක්‍රීඩාංගණ කළමනාකරු ඇතුළු කාර්ය මණ්ඩලය 70 කට අධික පිරිසක් සේවයේ යොදවා ඇත.

මෙම එළිමහන් ක්‍රීඩාංගනය තුළ එකවර ප්‍රේක්ෂකයින් 10,000කට පමණ තරඟ නැරඹීය හැකි වන පරිදි ක්‍රීඩාගාර පහසුකම් ඇත. මෙහි මළල ක්‍රීඩා, පාපන්දු, රගර්, වොලිබෝල්, දැල්පන්දු, පාසැල් ක්‍රීඩා උත්සව හා වෙනත් උත්සව සඳහා පහසුකම් ඇත.

මෙම ක්‍රීඩාංගනය සඳහා ඉදිකර ඇති කායවර්ධන මධ්‍යස්ථානයේ සාමාජික සාමාජිකාවන් 45 ක් පමණ මාසික හා වාර්ෂික සාමාජිකත්වය ලබා ඇත.

නුවර එළිය තුරඟ තරඟ පිටිය

2011.09.07 දින ක්‍රීඩා අමාත්‍යාංශය විසින් නුවර එළිය තුරඟ තරඟ පිටියේ කළමනාකාරීත්වය සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට පවරන ලදී. මෙහි භූමි ප්‍රමාණය හෙක්ටයාර 34,564ක් වන අතර අශ්ව ගාල්, බදුකුලී හා අශ්ව/පෝනි ඇවිදීම මඟින් ආදායම් ඉපයීම් සිදු කරනු ලබයි.

බෙලිඅත්ත පිහිණුම් තටාකය

මෙම පිහිණුම් තටාක පහත අංගවලින් සමන්විත වේ.

බෙලිඅත්ත

- මංතීරු 08ක් සහිත මීටර් 50ක් දිගැති පිහිණුම් තටාකය
- කිමිදුම් තටාකය

බෙලිඅත්ත කාර්මික විදුහලේ පිහිණුම් තටාකවල පරිපාලනය හා නඩත්තු කටයුතු පමණක් 2008.08.07 දින සිට සුගතදාස සංකීර්ණ අධිකාරිය විසින් සිදු කරනු ලැබුවත් මෙම පිහිණුම් තටාකවල අයිතිය අධිකාරිය සතු නොවේ. අවට ප්‍රදේශවල වැඩිහිටියන් හා ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට පිහිණුම් කටයුතු සඳහා පහසුකම් සැපයීම සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය විසින් සිදු කරනු ලබයි.

ආර්. ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය

මෙම ක්‍රිකට් ක්‍රීඩාංගනය ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රිකට් තරඟ පැවැත්වීමට අවැසි සියලු පහසුකම්වලින් සමන්විත ක්‍රීඩාංගනයකි. මෙම ක්‍රීඩාංගනය 2006.05.10 දින කැබිනට් මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයකට අනුව 2006.11.01 දින සිට වසර තිහක කාලයක් සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට මසකට රු. 250,000.00 ක මුදලකට බදු දී ඇත. ඒ අනුව 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මෙම ක්‍රීඩාංගනය මගින් රු. 3,000,000.00ක ආදායමක් උපදවා ඇත.

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ ප්‍රධානතම ආදායම් මාර්ගයක්ව පවතින මෙම ක්‍රීඩාංගනය මෙලෙස දීර්ඝ කාලීනව ස්ථාවර මාසික කුළියකට බදුදීම මෙම අධිකාරියේ ආදායම පහත වැටීමට බලපා ඇත.

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ

ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා පහසුකම් සලසාදීම සඳහා මෙම අධිකාරිය විසින් සැලසුම් කරන ලද විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් ඉදිරි පස් අවුරුදු (2021-2025) සැලැස්ම යටතේ නිම කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව මෙම සංවර්ධන ව්‍යාපෘතීන් හී මූලික අරමුණ වනුයේ සේවාලාභීන් වෙත ලබාදෙන දැනට පවත්නා ක්‍රීඩා පහසුකම් සඳහා ක්‍රීඩාංගන නවීකරණය කිරීම, අලුතින් සකස් කිරීම, නවීන තාක්ෂණික උපකරණ මිලදී ගැනීම, ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම හා ගොඩනැගිලි නඩත්තු කිරීම වේ. ඒ අනුව මෙම ව්‍යාපෘතීන් වල අවසන් අදියර නිමාවන 2025 වර්ෂයේදී වැඩිදියුණු කරන ලද සියලු පහසුකම් වලින් සමන්විත ක්‍රීඩාංගන/ක්‍රීඩාපිටි මහජනතාව සතු කිරීම අපේක්ෂාව වේ.

1. **ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම**
    - නව ක්‍රීඩා පහසුකම් උපකරණ මිලදී ගැනීම.
    - සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ ඇති විදුලි ආලෝක කුළුණු නවීකරණය කිරීම.
    - සුගතදාස පිහිණුම් තටාකාංගණයේ පොම්පාගාරය අළුත්වැඩියාව.
    - විද්‍යුත් කාලගණක පද්ධති මිලදී ගැනීම.
    - පිහිණුම් තටාංගණයේ ප්‍රේක්ෂක පුටු සවි කිරීම.
    - 2021 වර්ෂයේ ආරම්භ කරන ලද නවීකරණ ක්‍රියාකාරකම් අවසන් කිරීම.
    - ගෘහස්ථ ක්‍රීඩාංගනයේ ගිනි නිවීම් උපකරණ පද්ධතිය නවීකරණය හා හා 'ඩී' රථගාලෙහි නව ගිනි නිවීම් උපකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම.
    - ප්‍රධාන ප්‍රේකෂකාගාරය හා ක්‍රීඩාංගනය වටා ඇති ප්‍රේක්ෂකාගාර නවීකරණය (එළිමහන්).
    - භූමි අලංකරණය, මාර්ග පද්ධතිය නවීකරණය හා මාර්ග ආලෝකකරණය කිරීම (ගෘහස්ථ, එලිමහන්, බෝගම්බර).
    - සූර්ය බලශක්ති උත්පාදක පද්ධතියක් ස්ථාපනය (ගෘහස්ථ/ එළිමහන්/ බෝගම්බර).
    - බෝගම්බර ක්‍රීඩාංගනයේ ජල ටැංකිය ඉදිකිරීම.
    - බෝගම්බර ක්‍රීඩාංගනයේ ක්‍රීඩා භාණ්ඩ ගබඩාව ඉදිකිරීම.
    - ස්කොෂ් ක්‍රීඩාගාර සංවර්ධනය කිරීම.
    - ධාරිත්‍රක බැංකුව ඉදිකිරීම. (ගෘහස්ථ)
    - ගෘහස්ථ ක්‍රීඩාංගනය සඳහා පහසුකම් ගොඩනැගිල්ලක් ස්ථාපනය කිරීම.
    - ගෘහස්ථ ක්‍රීඩාංගනයේ නව ශබ්ද හා විදුලි ආලෝක පද්ධතීන් ස්ථාපිත කිරීම.
    - බෝගම්බර ක්‍රීඩාංගනයේ ප්‍රධාන ප්‍රේකෂකාගාරය නිවැරදිව දිශාගත කිරීම.
    - එලිමහන් හා ගෘහස්ථ ක්‍රීඩාංගන වල විදුලි බල පද්ධතිය (Electrical power system) වැඩිදියුණු කිරීම.
    - බෝගම්බර ක්‍රීඩාංගනය සඳහා කෘතිම ධාවන පථයක් ස්ථාපිත කිරීම.
    - ගෘහස්ථ ක්‍රීඩාංගනයේ MVAC පද්ධතිය යාවත්කාලීන කිරීම.
    - කුඩා ගෘහස්ථ ක්‍රීඩාගාරයක් (Mini Indoor) ඉදිකිරීම.

2. **මානව ප්‍රාග්ධන සංවර්ධනය**
    මානව සංවර්ධන වැඩසටහන් තුලින් පුහුණු පාඨමාලා, කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණ, කාර්යසාධන ඇගයීම්, සේවක අභිප්‍රේරණය, කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම හා ආකල්පමය වෙනස්කම් සහිතව තෘප්තිමත්ව සේවයේ යෙදීම.

3. **ක්‍රීඩා අධ්‍යාපනය හා මහජන සෞඛ්‍ය ප්‍රවර්ධනය**
    පාසල් දරුවන්ට ක්‍රීඩා පුහුණු වැඩසටහන්, ක්‍රීඩා පහසුකම් පිළිබඳ දැනුවත් කිරීම් හා එළිමහන් ව්‍යායාම වැඩසටහන් පැවැත්වීම සඳහා පහසුකම් සැලසීමෙන් සෞඛ්‍ය සම්පන්න නිරෝගීමත් පරපුරක් බිහිකිරීම.

<u>ප්‍රගතිය -2021</u>

2021 වර්ෂය තුළ පහත සඳහන් ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතීන් සිදු කරන ලද අතර, ඊට අදාළ භෞතික ප්‍රගතිය පහත පරිදි වේ.

	වැඩසටහන/ ව්‍යාපෘතිය	**භෞතික ප්‍රගතිය**
01	එළිමහන් ක්‍රීඩාංගනයේ වානේ මායිම් වැට ඉදිකිරීම.	98%
02	එළිමහන් ක්‍රීඩාංගනයේ වානේ වැට, ප්‍රධාන පිවිසුම සහ අවට ඉදිකිරීම.	70%
03	එළිමහන් ක්‍රීඩාංගනයේ මායිම් වැට ඉදිකිරීම	55%
04	බෝගම්බර ක්‍රීඩාංගනයේ ප්‍රධාන පිවිසුම් දොරටුව ඉදිකිරීම - අදියර 2.	100%
05	ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම.	20%
06	එළිමහන් ක්‍රීඩාංගනයේ ප්‍රතිසංස්කරණ කටයුතු (භෝජනාගාර ගොඩනැගිල්ල හා මාධ්‍ය ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය)	20%

2.2 අභියෝග

- 2021 අප්‍රේල් මස සිට කොවිඩ් - 19 තුන්වන රැල්ල වසංගතයක් ලෙස දිවයින පුරා පැතිරයාමත් සමඟ ක්‍රීඩා කටයුතු සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සෞඛ්‍ය මාර්ගෝපදේශ නිකුත් කිරීම නිසා ක්‍රීඩා කටයුතු නතර කිරීමට සිදුවීම.

- එමෙන්ම 2021 වර්ෂයේ සේවා මුර ක්‍රමයට කාර්ය මණ්ඩලය කැඳවා කාර්යාල කටයුතු අවමය සතියකට දින 03 ක් පමණ අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. සෙසු පිරිසගෙන් නිවසේ සිට රාජකාරි කටයුතු ඉටුකරවා ගැනීමට සිදුවීම.

- මාණ්ඩලික සේවයේ පුරප්පාඩු පැවතීම නිසා තීරණ ගැනීම හා ඒවා ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමාද සිදුවීම.

- රජය විසින් මහජනතාවට ලබාදීම සඳහා සැලසුම්කරන ලද එන්නත්කරණ වැඩසටහන කොළඹ නගරසභා සීමාව තුල පිහිටි රජයේ ආයතනයක් වශයෙන් මෙම අධිකාරිය (ගෘහස්ථ හා එළිමහන් ක්‍රීඩාංගණ) තෝරාගෙන තිබූ අතර, එන්නත්කරණ වැඩසටහන ජූනි මස සිට සැප්තැම්බර් මාසය දක්වා මේ සඳහා විශාල දායකත්වයක් ලබාදීමට සිදුවිම.

2.3 අනාගත අරමුණු

- රජයට බරක් නොවන ආයතනයක් ලෙස ව්‍යාපාරික සැලැස්මක් ඔස්සේ ආදායම් උත්පාදනය කිරීමේ මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මක් සකස්කර, ක්‍රීඩා පහසුකම් හා අධිකාරියේ පවත්නා සියලුම ආදායම් ප්‍රභවයන් සඳහා තරහකාරී මිලකරණ උපායමාර්ග සකසා එමගින් ආදායම ඉහළ නංවා ගැනීම හා ස්වයං යැපුම් ආයතනයක් බවට පත්වීම.

- නවීන තාක්ෂණය සමඟ අනුගත වීම මඟින් කාර්යක්ෂම හා ගුණාත්මක ප්‍රමිතියෙන් යුත් සේවාවක් සැපයීම (උදා: - විද්‍යුත් කාලසණක උපකරණ මිලදී ගැනීම).

.....

ජී.කේ.එස්.එල්.රාජදාස

සභාපති

2022.02.....

ජී.කේ.එස්.එල්. රාජදාස
සභාපති
සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය
තැ.පෙ. 2211 ආතර් ද සිල්වා මාවත,
කොළඹ - 13.

03. වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

3.1 ආදායම් වියදම් ප්‍රකාශය (2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා)

අයවැය (වර්තමාන වර්ෂය)		2021.12.31	2020.12.31
59,129,300.00	මෙහෙයුම් අදායම	52,688,269	49,973,357
	මෙහෙයුම්නොවන අදායම	1,241,474	892,396
59,129,300.00		**53,929,742**	**50,865,753**
319,000,000.00	රජයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන	**264,647,000**	**257,820,000**
378,129,300.00	**මුළු ආදායම**	**318,576,742**	**308,685,753**
	වියදම්		
	මෙහෙයුම් වියදම්		
181,711,000.00	සේවක චේතන වියදම්	183,453,841	186,553,786
-	කළමනාකාරීත්ව මණ්ඩලයේ දීමනා හා වියදම්	363,000	247,500
3,000,000.00	පාරිතෝෂික වෙන්කිරීම්	7,209,380	3,464,795
-	ක්ෂයවීම්	118,449,630	117,974,703
123,481,000.00	අනෙකුත් වියදම්	89,430,944	81,222,295
308,192,000.00		**398,906,794**	**389,463,078**
69,937,300.00	**මෙහෙයුම් අතිරික්තය (හිඟය)**	**(80,330,052)**	**(80,777,325)**
(830,000.00)	මූල්‍ය වියදම්	(124,250)	(90,225)
69,107,300.00	**බදු පෙර අතිරික්තය (හිඟය)**	**(80,454,302)**	**(80,867,550)**
	එකතුකළා (මෙහෙයුම් නොවන ආදායම්		
-	ස්ථාවර තැන්පතු පොලී ආදායම	2,879,591	4,233,581
-	**පෙර බදු ශුද්ධ අතිරික්තය (හිඟය)**	**(77,574,711)**	**(76,633,968)**
-	**ආදායම් බදු**	-	(330,219)

වර්ෂයේ අතිරික්තය (හිඟය)	**(77,574,711)**	**(76,964,187)**

3.3 ශේෂ පත්‍රය (2021.12.31 දිනට)

ජංගම වත්කම්	2021.12.31 (රුපියල්)	2020.12.31 (රුපියල්)
මුදල් සහ බැංකු ශේෂය	91,655,712	99,890,505
ණය ගැතියෝ	31,019,029	25,222,264
තොගය	8,616,717	10,578,505
කාර්ය මණ්ඩලයේ දස මාසික ණය ලබාදීම්	25,265,055	27,477,246
අනෙකුත් ලැබිය යුතු ශේෂ	36,504,731	32,994,623
පාරිතෝෂික අරමුදල	5,484,698	5,322,801
ස්ථාවර තැන්පතු	49,507,628	45,718,331
	248,053,570	**247,204,276**
ජංගම නොවන වත්කම්		
ඉඩම්	2,856,612,140	2,856,612,140
ගොඩනැගිලි	2,168,601,724	2,141,979,790
ආලෝක කුළුණු		
විදුලි බල්බ	29,223.82	112457.16
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	41,230,169	52,311,425
පරිගණක	1,372,117	739,775
මෝටර් රථ	4,909,305	5,584,203
ක්‍රීඩා උපකරණ	44,970,896	52,886,409
ලී බඩු සහ උපකරණ	46,679,831	52,579,222
කාර්යාලී සහ අනෙකුත් උපකරණ	6,883,215	8,018,621
තිර රෙදි	174,674	-
සිදු කෙරෙමින් පවතින වැඩ	210,365,597	302,140,214

	5,381,828,891	**5,472,964,256**
මුළු වත්කම්	**5,629,882,461**	**5,720,168,533**
ප්‍රාග්ධන ස්කන්ධය සහ වගකීම්		
ජංගම වගකීම්		
වෙළඳ ණය හිමියෝ	2,378,287	2,445,002
ආරක්ෂිත තැන්පතු	3,100,810	16,675,900
කලින් ලද ආදායම	250,000	250,000
බදු වෙන්කිරීම	1,563,189	2,240,407
උපචිත වියදම් සහ අනෙකුත් ගෙවිය යුතු වියදම්	12,542,532	18,014,528
අනෙකුත් ගෙවිය යුතු දෑ	135,224,036	160,333,807
	155,058,854	**199,959,645**
ජංගම නොවන වගකීම්		
පාරිතෝෂික දීමනා	87,881,335	82,147,340
	87,881,335	**82,147,340**
මුළු වගකීම්	**242,940,189**	**282,106,986**
ශුද්ධ වත්කම්	**5,386,942,272**	**5,438,061,547**
ශුද්ධ වත්කම් / කොටස්		
රජයේ ප්‍රදාන	7,361,762,609	7,346,762,609
සමුච්චිත අරමුදල	(1,906,580,277)	(1,841,071,525)
ප්‍රත්‍යගණන අතිරික්තය	9,334,652	9,334,652
වර්ෂයේ අතිරික්තය/ (හිඟය).	(77,574,711)	(76,964,188)
මුළු ප්‍රාග්ධන ස්කන්ධය සහ වගකීම්	**5,386,942,272**	**5,438,061,547**

3.4 අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය (2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා)

	2021.12.31 (රුපියල්)	2020.12.31 (රුපියල්)
මෙහෙයුම් වලින් ලද මුදල් ප්‍රවාහය		
වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය)	**(77,574,711)**	**(76,964,187)**
මුදල් නොවන ගැලපීම්		
ක්ෂය ගැලපීම	118,449,630	117,974,703
පාරිතෝෂික වෙන්කිරීම	7,209,380	3,464,795
අඩුවීම්/(වැඩිවීම්) තොගය	1,961,789	2,547,124
අඩුවීම්/(වැඩිවීම්) ලැබිය යුතු ශේෂ	(7,256,578)	70,320,391
අඩුවීම්/(වැඩිවීම්) ගෙවිය යුතු ශේෂ	(44,900,790)	(56,893,632)
අඩුවීම්/(වැඩිවීම්) පාරිතෝෂිත දීමනා	1,122,855	-
පාරිතෝෂිත දීමනා ගෙවීම	(2,598,240)	(3,464,795)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ශේෂය	**(3,586,666)**	**56,984,397**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
දේපල,පිරියත සහ යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම	(27,314,265)	(211,873,754)
ස්ථාවර තැන්පතු වල ආයෝජනය	(3,789,297)	(4,400,975)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ශේෂය	**(31,103,562)**	**(216,274,729)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
පෙර වර්ෂයේ ගැලපීම්	11,455,436	-
රජයේ ප්‍රාග්ධන ප්‍රදාන	15,000,000	242,300,000
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ශේෂය	**26,455,436**	**242,300,000**
මුදල් හා මුදල් සමාන දෑ වලින් ශුද්ධ වැඩිවීම	**(8,234,792)**	**83,009,668**

වර්ෂ ආරම්භයේ මුදල් හා බැංකු සමාන දෑ	**99,890,506**	**16,880,838**
වර්ෂ අවසානයේ මුදල් සහ බැංකු සමාන දෑ	**91,655,712**	**99,890,506**

පිටු අංක සිට දක්වා දැක්වෙන ඉහත ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක සිට දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තරද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ.මෙම මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාල ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීමකර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

.....

රවීන්ද්‍ර සමරවික්‍රම

ලේකම්

ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල

පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය

අමාත්‍යාංශය

2022.02.24.

රවීන්ද්‍ර සමරවික්‍රම

ලේකම්

ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන

රාජ්‍ය අමාත්‍යාංශය

12 වන මහල, බටහිර කුලුන,

ලෝක වෙළඳ

.....

ජී.කේ.එස්.එල්.රාජදාස

සභාපති

2022.02.....

ජී.කේ.එස්.එල්. රාජදාස

සභාපති

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

තැ.පෙ. 2211 ආතර් ද සිල්වා මාවත,

කොළඹ - 13.

.....

ඩබ්.එම්.පී.එස්.බණ්ඩාර පියදාස

සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය)

2022.02.....

W.M.P.S.BANDARA PIYADASA

Assistant Director Finance

(B.Sc (B.Ad) FPFA,CBA)

Sugathadasa National Sports Complex Authority

(State Ministry of Rural and School Sports Infrastructure Improvement)

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.6 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2002.01.01	රාජ්‍ය නිවාස හා ගොඩනැගිලි කුලී	19,553,000	19,553,000	17,726,654	90.66
2002.02.01	ණය පොලී	-	-	975,238	-
2003.02.99	විවිධ ආදායම්	5,432,300	5,432,300	1,281,202	23.58
2004.01.00	මධ්‍යම රජය (වැන්දඹු හා අනත්දරු)				
	ක්‍රීඩාංගණ ගාස්තු	21,780,000	21,780,000	25,056,380	115.04
	සේවා ගාස්තු	492,000	492,000	364,560	74.10
	රථ ගාල සඳහා ගාස්තු	11,872,000	11,872,000	9,124,125	76.85

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන්කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරගනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
ප්‍රනරාවර්තන	440	309	264.65	85.65
ප්‍රාග්ධන	889	466	55.59	11.93

3.8 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට /පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරගනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		
-	-	-	-	-	-	-

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	**2021.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**2021.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	2,109,936,272	2,109,936,272	-	100%
9152	යන්ත්‍රෝපකරණ	52,311,425	52,311,425	-	100%
9153	ඉඩම්	2,856,612,140	2,856,612,140	-	100%
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	100%
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	100%
9160	කෙරීගෙන යන වැඩ	302,140,214	302,140,214	-	100%
9180	බදු දෙන ලද වත්කම්	32,043,518	32,043,518	-	100%
	පරිගණක	739,775	739,775	-	100%
	මෝටර් වාහන	5,584,203	5,584,203	-	100%
	ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	52,579,222	52,579,222	-	100%
	උපකරණ	61,017,487	61,017,487	-	100%

04. කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් ලෙස තත්‍ය නිමවුම		
	100%-90%	**75%-89%**	**50%-74%**
01. සුගතදාස අධිකාරියෙහි සේවා සපයන මධ්‍යස්ථානයන්හි භාවිතාවේ ප්‍රතිශතමය අගය **(Occupancy Rate)**			√
02. පාරිභෝගික තෘප්තිය			√
03. ලාභ ප්‍රතිශතය			√

** සටහන - නැවත 2021 වර්ෂයේ මාර්තු මාසයේ සිට ආරම්භ වූ ගෝලීය වසංගතයක් වන කොවිඩ් - 19 හේතුවෙන් දීර්ඝ කාලයක් පළාත් අතර හා දිස්ත්‍රික්ක අතර සංචරණ සීමා පැනවීමත්, ක්‍රීඩා කටයුතු සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පනවන ලද සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද අඛණ්ඩ ව ක්‍රියාත්මක වීමෙත් ක්‍රීඩාංගන පහසුකම් ලබාගැනීම අවම මට්ටමක පැවතුණි. ආරම්භයේ පැවතියේ එළිමහන් ක්‍රීඩා කටයුතු පමණක් වීමෙන් විශාල වශයෙන් අධිකාරියේ ආදායම පහත වැටීමට හේතු විය. එබැවින් අධිකාරියේ විශේෂිත කාර්යසාධන දර්ශක වල අපේක්ෂිත නිමවුම් ප්‍රතිශතයක් ලෙස තත්‍ය නිමැවුම අවම අගයක පැවතිණි.

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
සෞඛ්‍ය සම්පන්න පරපුරක් බිහිකිරීම සහ සෑම වයස් කාණ්ඩයකටම යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම.	පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම	පාරිභෝගික තෘප්තිය		√	
	සුගතදාස සංකීර්ණ අධිකාරියේ සියලුම පහසුකම් වල ප්‍රමිතිය ඉහළ නැංවීම.	සේවාවන් සපයන මධ්‍යස්ථානයන්හි භාවිතාවේ ප්‍රතිශතමය අගය		√	
	සමස්ත ආදායම නැංවීම හා පිරිවැය අවම කිරීම	ලාභ ප්‍රතිශතය		√	

ආයතනය සඳහා වන තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ඇත. ඒ සඳහා ආයතනයේ කාර්යයන්ගෙන් සිදුවනුයේ වක්‍ර බලපෑමකි. එබැවින් ආයතනය ඉටු කරනු ලබන කාර්යයන් අනුව ඉලක්ක, දර්ශක හා ජයග්‍රහණ දක්වා ඇත.

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	10	05	05
තෘතියික	13	07	06
ද්විතියික	77	58	19
ප්‍රාථමික	279	229	50

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට කරනු ලබන බලපෑම

ඉහත සේවක සංඛ්‍යා කළමනාකරණය කිරීමේ දී මානව සම්පත් හිඟය වෙනුවෙන් 2019 වර්ෂයේ සිට පැවති පුරප්පාඩු සඳහා බඳවාගැනීම් ආරම්භ කළද එම වර්ෂයේ ජනාධිපතිවරණය පැවැත්වීමත්, 2020 වර්ෂය ආරම්භයේදී නැවත මහමැතිවරණය පැවැත්වීමත් සමඟ මුදල් අමාත්‍යාංශය විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත සියලු බඳවා ගැනීම් අත්හිටුවා නිකුත් කරන ලද චක්‍රලේඛනයට අනුව බඳවාගැනීම් සිදුකිරීමට නොහැකි විය.

නමුත් 2020 වර්ෂය අවසාන වන විට බඳවාගැනීමට අනුමැතිය ලබාදී චක්‍රලේඛන නිකුත් කළ ද කොවිඩ් 19 වසංගතය හේතුවෙන් කාර්යාල කටයුතු සාමාන්‍ය පරිදි පවත්වා ගෙන යාමට අපහසු වීමෙන් පුරප්පාඩු සඳහා බඳවාගැනීමේ ක්‍රියාවලිය ද ප්‍රමාද විය. අභ්‍යන්තර විගණක තනතුර සඳහා බඳවාගැනීම් කටයුතු සිදු කරන ලදි. එමෙන්ම 2021 වර්ෂයේ ජූලි මස සිට ප්‍රාථමික ශ්‍රේණියේ පැවති පුරප්පාඩු සඳහා බහුකාර්ය සංවර්ධන බලකාය විසින් පුහුණු සේවකයින් 14 දෙනෙකු අනුයුක්ත කරන ලදී. මේ වන විටත් බඳවා ගැනීම් අත්හිටුවා ඇති බැවින් සෙසු තනතුරු සඳහා බඳවාගැනීමේ කටයුතු සිදුකිරීමට නොහැකි වී ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	කාලසීමාව	සමස්ත ආයෝජනය (රු. '000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
Certificate Course in Conveyancing	01	2021.01.08 සිට දින 10ක්	13,500.00	-	දේශීය	
හානි, පාඩු හා මු.රෙ. 104 යටතේ වූ පරීක්ෂණය	02	2021.11.02	10,000.00	-	දේශීය	
කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි	02	2021.11.11 සහ 12	20,000.00	-	දේශීය	
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය	02	2021.11.12, 19 සහ 26	30,000.00	-	දේශීය	

රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම	02	2021.11.29	10,000.00	-	දේශීය	
National Labour Law Symposium	01	2021.12.14	9,250.00	-	දේශීය	
කාර්යක්ෂමතා කඩඉම් විභාගය	17	2021.03.22 සහ 2021.07.28	69,550.75	-	දේශීය	

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අ.අ	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල නොවේ	අර්ධ රාජ්‍ය ආයතනයකි	
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	අර්ධ රාජ්‍ය ආයතනයකි	
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල නොවේ	වෙනත් මෘදුකාංග පද්ධතියක් භාවිතා කිරීම	
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූලය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කිරීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වඩා වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මාදුකාංග පැකේජය භාවිත කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂිකව සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		

6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්පොට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්පට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම.	අනුකූල වේ		

9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය ගිණුම් නිරවුල් කර තිබීම	අදාළ නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොයික්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			

12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල නොවේ	අර්ධ රාජ්‍ය ආයතනයකි	
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල නොවේ	අර්ධ රාජ්‍ය ආයතනයකි	
12.3	වර්ෂයයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අදාළ නොවේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අදාළ නොවේ	අර්ධ රාජ්‍ය ආයතනයකි	
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අදාළ නොවේ	අර්ධ රාජ්‍ය ආයතනයකි	
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂයෙ, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල නොවේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		

16.3	20.09.2017 දිනැති චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ		ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		

19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		මාණ්ඩලික නිලධාරීන් සඳහා 2022 වසරේ කාර්යසාධන ගිවිසුම් අත්සන් කරන ලදී.
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

අවසානයි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } SYA/A/SMRSSII/02/21/12 මගේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2022 මැයි 11 දින

ලේකම්
තරුණ හා ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යාංශය

ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

විගණිත මූල්‍ය ප්‍රකාශනයේ පිටපතක් හා උක්ත වාර්තාව මේ සමඟ එවමි.

එච්.එම්. රණසිංහ බණ්ඩා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත - 1. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව. (විගණිත මූල්‍ය ප්‍රකාශනවල මුල් පිටපත හා සම්පිණ්ඩන වාර්තාව මේ සමඟ එවමි).

2. ලේකම්, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය - කාරු. අවශ්‍ය කටයුතු සඳහා

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මගේ අංකය / எனது இல. / My No. SYA/A/SMRSSII/02/21/12 මගේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022 මැයි 13 | දින

ලේකම්
තරුණ හා ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යාංශය

ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදය දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථානෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි,

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල නොවීම

මාර්ගෝපදේශ 7.2 ඡේදයෙහි වාර්තාකරණ ආයතනය විසින් වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් එකතු කරනු ලබන ආදායම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුලත් නොකල යුතු අතර, එම ආදායම අග්‍රිම සැසඳුම් ප්‍රකාශය තුල ගැලපීම් කල යුතු බවත් ඉකුත් වර්ෂ සංසන්දනාත්මක සංඛ්‍යාද ඒ අනුව දැක්විය යුතු බවත් සඳහන් වේ. නමුත් ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් එකතු කරන ලද ආදායම් ලෙස රු.21,159,297 ක් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණද ඉකුත් වර්ෂ සංසන්දනාත්මක සංඛ්‍යා තොරතුරු දක්වා නොතිබුණි.

1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(I) **තැන්පතු ලැබීම්**

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ හා මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයේ තැන්පතු ලැබීම් ලෙස රු. 1,831,408 ක් වූ නමුත් මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව තැන්පත් ලැබීමෙහි එකතුව රු. 1,633,680 ක් විය. ඒ අනුව තැන්පතු ලැබීම් හි රු. 197,728 ක වෙනසක් පවතින බව නිරීක්ෂණය වූ අතර මෙම වෙනස තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයෙන් කරන ලද වැරදි ගණුදෙනුවක් සටහන් වීම ලෙස වාර්තා වී ඇති අතර 2021 නොවැම්බර් මස අදාල නිවැරදි කිරීම් සිදු කිරීමට අවශ්‍ය පියවර ගත්තද භාණ්ඩාගාර වාර්තා SA-30 (වාර්ෂික තැන්පතු ගිණුම් සාරාංශ වාර්තාව) අනුව මෙම සටහන් නිවැරදි වී නොතිබුණි.

(II) **අත්තිකාරම් ලැබීම්**

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ හා මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයේ අත්තිකාරම් අය කර ගැනීම් ලෙස රු. 6,918,493 ක් දක්වා ඇති අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව රු. 6,284,936 ක් ලෙස දක්වා තිබුණි . මේ අනුව අත්තිකාරම් අයකර ගැනීම් වල එකතුව රු. 633,557 ක වෙනසක් පැවතුණි.

1.6.3 තැන්පතු ගෙවීම්

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය අනුව තැන්පතු ගෙවීම රු .11,783,274 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂය තුළ තැන්පතු ගෙවීම් එකතුව රු. 11,473,437 ක් විය. ඒ අනුව රු 309,837 ක වෙනසක් පවතින බව නිරීක්ෂණය විය. මෙම වෙනස තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයෙන් කරන ලද වැරදි ගණුදෙනුවක් සටහන් වීම ලෙස වාර්තා වී ඇති අතර 2021 නොවැම්බර් මස අදාල නිවැරදි කිරීම් සිදු කිරීමට අවශ්‍ය පියවර ගත්තද භාණ්ඩාගාර වාර්තා SA-30 (වාර්ෂික තැන්පතු ගිණුම් සාරාංශ වාර්තාව) අනුව මෙම සටහන් නිවැරදි වී නොතිබුණි.

1.6.4 අත්තිකාරම් ගෙවීම්

අත්තිකාරම් ගෙවීම් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හා මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය දක්වා ඇති අගය රු. 6,431,231 ක් විය. මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව එය රු. 6,852,198 වූ අතර ඒ අනුව අත්තිකාරම් ගෙවීම් වල රු. 420,967 ක වෙනසක් පැවතුණි. මෙම වෙනස අධ්‍යාපන අමාත්‍යාංශයට මාරුවී ගිය නිලධාරියෙකුගේ ශේෂයක් **cigas** පද්ධතිය හරහා ගිණුම්ගත කිරීමේදී සිදුවූ දෝෂයක් හේතුවෙන් ඇති වී තිබුණි.

1.6.5 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.5.1 මූල්‍ය නොවන වත්කම්

(අ) මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය හා ඉකුත් වර්ෂයේ අවසාන ශේෂය අතර රු.362,908,984 ක් වූ මූල්‍ය නොවන වත්කම් හා රු.231,690,858 ක් වූ නොනිමි වැඩ යන අයිතමයන්හි වෙනස්කම් නිරීක්ෂණය වූ අතර මෙම වෙනසට හේතු වී ඇත්තේ ආරම්භක ශේෂයට කරන ලද ගැලපුම් වන නමුත්, මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහනක් මගින් හෝ හෙළිදරව් කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

වියදම් ප්‍රකාශය ACA-2(ii) ආකෘතියේ මුදල් පොත අනුව වියදම සහ මු. රෙ 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශය/දෙපාර්තමේන්තු විසින් වැයකළ වියදම් (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව) වෙන වෙනම දක්වා මුළු වියදම ඉදිරිපත් කළයුතු වුවද, වැය විෂයන් 21 කට අදාලව රු. 574,295,695 ක් වූ භාණ්ඩාගාර වාර්තා අනුව වියදම, මුදල් පොත අනුව රු.125,911,575 ක් වන වියදමට එකතුකර මුළු වියදම රු. 700,209,243 ක් ලෙස දක්වා තිබූ අතර මු.රෙ 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් වැයකළ වියදම් (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව) නොමැති ලෙස මූල්‍ය ප්‍රකාශණයේ දක්වා තිබුණි

2.2 බැරකම් හා බැදීම් වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් වක්‍රලේඛ අංක 255/2017 හි ඡේද අංක 5 අනුව බැරකම් යනු විධිමත් පරිදි ලබා ගන්නා ලද භාණ්ඩ හා සේවා සහ සම්පූර්ණ කර ඇති බවට සහතික කර ඇති කොන්ත්‍රාත් සඳහා තව දුරටත් ගෙවිය යුතු වටිනාකම් වේ.නමුත් රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර ලද මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති බැරකම් එම අමාත්‍යාංශයට අදාල නොවන බැරකම් බව නිරීක්ෂණය විය. සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් ඇස්තමේන්තු මුලු මුදලම අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හෝ අදාල රාජ්‍ය ආයතනය වෙත එකවර ප්‍රතිපාදන නිදහස් කිරීමක් ලෙස ලබා දී ඇති විටෙක සමාලෝචිත වර්ෂය තුළ ඉටු කළ නොහැකි වූ කාර්යයන් වෙනුවෙන් ගෙවිය යුතු මුදල අදාල ආයතනය විසින් නියමිත ඉකාන්ත්‍රාත් ආයතනයට ගෙවීම් සිදු කළ යුතු බැවින් රාජ්‍ය අමාත්‍යාංශය විසින් එසේ ගෙවිය යුතු මුදල බැරකමක් ලෙස නොදැක්විය යුතු වුවත් එක් එක් ව්‍යාපෘතින් භාර දෙන ලද ඉදිකිරීම් ආයතන පිළිබඳ කේවල දත්ත රාජ්‍ය අමාත්‍යාංශය සතුව නොමැති බැවින් දක්වා ඇති බැරකම් වල නිර්වද්‍ය තාවය පරීක්ෂා කිරීම සිදු කළ නොහැකි විය.

(ආ) 2021 වර්ෂයේ වාර්තා නොකරන ලද කිසිදු බැරකමක් 2022 වර්ෂයේ නිරවුල් නොකළ යුතු වුවද 2021 වර්ෂයේ භාණ්ඩ හා සේවා ලැබීමට අදාලව ගෙවීමට නොහැකි වූ රු.2,517,356 ක් බැරකම් 2022 වර්ෂයේ ගෙවා තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල බැරකම් ලෙස ඇතුලත් කර නොතිබුණි.

2.3 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම

මුදල් රෙගුලාසි 377 හා 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කාර්යය නිමවූ වහාම ලබාගත් අත්තිකාරම් පියවිය යුතු වූවත් ,නිළධාරීන් 18 කට ලබාදුන් රු.868,060 ක් වූ අත්තිකාරම් පියවීමට දින 7 සිට මාස 4 ක් දක්වා කාලයක් ගෙන තිබුණි.

2.4 රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුම

අත්තිකාරම් 'බී' පාලන ගිණුම අනුව සේවය අතහැරගිය නිලධාරියකුගෙන් අයවිය යුතු රු.100,000 ක් වූ ණය ශේෂයක් අයකර ගත යුතුව පැවතුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යය සාධනය

(අ) ක්‍රීඩා පාසල් සංවර්ධන කිරීමේ වැඩසටහන යටතේ ජාත්‍යන්තර ජයග්‍රහන ලබා ගැනීමට අදාළ ක්‍රීඩකයෙක් බිහි කිරීම සඳහා ළමා වියේ සිටම දක්ෂතා සහිත දරුවන් හඳුනාගෙන ඔවුන්ට නිසි පෝෂණය හා පුහුණුව සහිතව රැක බලා ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සමග ස්ථාපිත ක්‍රීඩා පාසල් 30 කින් සංවර්ධනය කළ යුතු පාසල් 16 ක් ප්‍රමුඛතා පදනම මත අධ්‍යාපන අමාත්‍යාංශයේ ද සහයෝගය මත තෝරාගෙන 2021 වර්ෂයේදී රු මිලියන 210.87 ක ප්‍රතිපාදන සලසා දී තිබුණි. මින් 2021 වර්ෂයේ ව්‍යාපෘති ආරම්භ කරන ලද පාසල් සංඛ්‍යාව 11 ක් වේ.(2020 දී 5 කි) 2021 දෙසැම්බර් 31 දින වන විට රු මිලියන 158.72 ක් වියදම් සිදුකර තිබූ අතර පාසල් 03 ක පමණක් වැඩ අවසන් කර තිබුණි.

(ආ) පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ දිවයිනේ සෑම අධ්‍යාපන කලාපයකටම එක් පාසල් ක්‍රීඩාංගනයක් බැගින් සංවර්ධනය කිරීමේ අරමුණින් සමාලෝචිත වර්ෂය තුල පලාත් පාසල් 79 ක් සඳහා රු මිලියන 252.8 ක්ද ජාතික පාසල් 15 ක් සඳහා රු මිලියන 48.69 ක්ද වශයෙන් රු මිලියන 301.49 ක්ද ප්‍රතිපාදන සලසා දී තිබුණි. මෙම මුළු පාසල් 94 න් 2021 වර්ෂය අවසාන වන විට වැඩ අවසන් කර තිබුනේ පාසල් 63 ක පමණක් වන අතර සියයට 50 ක අඩු ප්‍රගතියක් පවතින පාසල් සංඛ්‍යාව 15 ක් විය.

(ඇ) මහජන ක්‍රීඩාපිටි ප්‍රමිතිගතව සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ක්‍රීඩාව සඳහා මහජනතාවට පහසු ප්‍රවේශයක් ඇතිකරලීමේ අරමුණින් මහජන ක්‍රීඩාපිටි ප්‍රමිතිගතව සංවර්ධනය කිරීමේ වැඩසටහන ආරම්භ කර තිබූ අතර මේ යටතේ පළාත් සභා ප්‍රධාන ලේකම් වරුන් හා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත රු මි.762.3 ක ප්‍රතිපාදන නිදහස් කර තිබුණි.2021 දෙසැම්බර් 31 වන දිනට රු මි.343.82 ක් වියදම් සිදුකර පළාත් ප්‍රධාන ලේකම් යටතේ මහජන ක්‍රීඩාපිටි 146 ක් ද දිස්ත්‍රික් ලේකම් යටතේ මහජන ක්‍රීඩා පිටි 09 ක් ද වශයෙන් ක්‍රීඩා පිටි 155 ක් සංවර්ධනය කිරීමට අපේක්ෂා කර තිබුණද 2021 දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් කර තිබුනේ ක්‍රීඩා පිටි 52 ක පමණක් වන අතර ඇස්තමේන්තු නොකළ ව්‍යාපෘති 03 ක් ද ඇස්තමේන්තු කළ මට්ටමේ පවතින ව්‍යාපෘති 17 ක් ද ගිවිසුම් අත්සන් කළ මට්ටමේ පවතින ව්‍යාපෘති 04 ක් ද ප්‍රගතිය සියයට 50 අඩු ව්‍යාපෘති 41 ක් ද ප්‍රගතිය සියයට 50 - 75 අතර මට්ටමේ ව්‍යාපෘති 38 ක් ද විය.

(ඈ) ගම සමඟ පිළිසඳරක් වැඩසටහන යටතේ ආර්ථික හා සමාජීය වශයෙන් දැඩි දුෂ්කරතා පවතින ප්‍රදේශ වල ජනතාවගෙන් ඉදිරිපත් වන ඉල්ලීම් සලකා බලා ක්‍රීඩා යටිතල පහසුකම් ආශ්‍රිත යෝජනා ක්‍රියාත්මක කිරීම මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂා කර තිබුණි.මේ යටතේ දිස්ත්‍රික් 13 ක ක්‍රීඩාංගන 42 ක් ඉදි කිරීම සඳහා රු මි. 86.57 ක ප්‍රතිපාදන නිදහස් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු මි.69 ක් වියදම් සිදුකළ ව්‍යාපෘති 36 පමණක් වැඩ අවසන් කර තිබුණි.

(ඉ) අතිදුෂ්කර ප්‍රදේශවල ක්‍රීඩා පිටි සංවර්ධන වැඩසටහන යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 09 ක ක්‍රීඩා පිටි 43 ක් සංවර්ධනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ අමාත්‍යාංශය රු. මි.60.825 ක් වූ ප්‍රතිපාදන නිදහස් කර තිබුණු අතර රු. මි 14.254 ක් වැය කර තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට ක්‍රීඩා පිටි 38 ක වැඩ අවසන් කර තිබුණද, ගිවිසුම් අත්සන් කළ එහෙත් ඉදිකිරීම් කටයුතු ආරම්භ නොකළ ව්‍යාපෘති 02 ක් හා වැඩ නිම නොකළ ව්‍යාපෘති 03 ක් පැවතුණි.

(ඊ) විශේෂ අවශ්‍යතා මත හදුනාගන්නා ලද ක්‍රීඩා පිටි සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රීඩා පිටි 04 ක් සංවර්ධනය කිරීම සඳහා රු. මි. 18.876 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දිනට රු. මි.10.476 ක වියදම් කර තිබුණි. එයින් එක් ව්‍යාපෘතියක පමණක් වැඩ අවසන් කර තිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

(අ) 2021 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය අමාත්‍යාංශයේ අනුමත කාර්යය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 03 ක්, තෘතීක මට්ටමේ පුරප්පාඩු 03 ක්, ද්විතීය මට්ටමේ පුරප්පාඩු 34 ක් සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 01 ක් පැවතුණි. පවතින මානව සම්පත් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සැලසුම් කරන ලද විවිධ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය.

(ආ) 2021 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 02 ක් ද තෘතීක මට්ටමේ තනතුරු 02 ද ද්විතීක මට්ටමේ තනතුරු 07 ක් ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 02 ක පුරප්පාඩු වී පැවතුණි.

(ඇ) 2021 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 06 ක් ද තෘතීක මට්ටමේ තනතුරු 07 ක් ද ද්විතීක මට්ටමේ තනතුරු 06 ක් ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 05 ක් ද පුරප්පාඩු ව පැවතුනි. මේ අනුව විද්‍යායතනයේ පවතින කාර්යය මණ්ඩල ඌණතාවය හේතුවෙන් ආයතනය මගින් පවත්වන පාඨමාලා හා පුහුණු වැඩසටහන් සඳහා වැඩි වශයෙන් බාහිර දේශකයන්ගේ සහය ලබාගෙන තිබුණි.

එච්.එම්.රණසිංහ බණ්ඩා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට